WSSV is a highly contagious viral disease, causing massive shrimp death worldwide. Think of WSSV as a dangerous invisible enemy attacking shrimp farms. It spreads fast and kills shrimp quickly, causing huge losses to farmers and their families.

In Sri Lanka, it severely impacts shrimp farmers, risking their livelihoods and the local economy.

Why should we care?

Shrimp farming supports many people's livelihoods here. When WSSV strikes, families lose income, jobs, and food on their tables. The virus also hurts local markets and prices, making life tough for whole communities.

The hope in a common plant: *Boerhavia diffusa*

Imagine using a naturally growing plant, already known for healing properties, to fight this virus. *Boerhavia diffusa* could be nature's own medicine chest, helping shrimp fight off infections safely and cheaply.



Figure 01: *Boerhavia diffusa*

Method of unlocking the power of the plant

Instead of testing every compound in a lab (which costs time and money), this research used computers to predict which plant chemicals fit like keys into the viral lock, stopping it from working.

Discoveries

Strong Lock and Key Fit

Imagine the virus has a tiny lock (called ICP11 protein) that helps it survive and infect shrimp. Some compounds from *Boerhavia diffusa* act like keys that perfectly fit into this lock, preventing it from working.

Stable and reliable

Using computer simulations, these compounds were observed to hold tight to the viral lock, like a strong handshake that won't let go. This means the virus can't easily escape or continue its harmful process.




Figure 02: Computationally prepared drug complex

Why is this a great news?

With these findings, the development of a natural, eco-friendly treatment for shrimp farmers becomes more feasible one which reduces the need for toxic chemicals and protects shrimp, farmers' livelihoods, and the local economy.

Final verdict

With an eco-friendly antiviral made from a local plant, shrimp farmers can protect their ponds without harmful chemicals, helping families earn steady incomes and keeping our food sources healthy.

These findings are promising but need lab and real-farm testing. With farmer cooperation, we hope to develop safe, effective treatments that are easy to use and affordable.



This is a non-technical summary of the project report titled "*In silico* screening of *Boerhavia diffusa* compounds as ICP11 protein inhibitors to disrupt white spot syndrome virus assembly in shrimp" supervised by Dr. L.N. Ranathunga*, Department of Animal Science, Faculty of Agriculture, University of Peradeniya *lakmalr@agri.pdn.ac.lk .

BLENDING TRADITION AND SCIENCE: CRAFTING THE PERFECT CUP OF TEA



R.M.I.V. Rajapaksha

Ceylon black tea, manufactured from *Camellia sinensis* L., is popular worldwide for its unique taste, aroma and rich tradition. But every region in Sri Lanka produces tea leaves with distinct characteristics influenced by climate and elevation. High grown tea from cool mountain slopes are known for their light flavor and floral aroma. Tea from mid region offers a balanced profile while low grown tea bring strength and vibrant colour to the tea brew. Each region showcases various levels of bioactive compounds contributing to the specific health benefits you get from the tea brew.




Why Tea is blended?

Tea blending is important to maintain the uniformity of quality of tea which enhances the sensory attributes and the level of bioactive compounds. Traditionally tea blending in Sri Lanka has been guided by expert tea tasters. This research focused on developing a scientific tea blending ratio to approach a perfect cup of tea with enhanced health benefits and chemical profile without solely depend on sensory evaluations.

Method

Several tea blend ratios were developed based on biochemical profiles of the selected tea and the contribution of those to the sensory attributes such as color, taste and aroma. In this study five tea blends were developed by combining BOPF, FGS 1, Dust 1 and PD tea grades from eleven tea estates representing three major elevations (high, mid and low) in Sri Lanka.

Instead of relying only on traditional tea tasting, key biochemical compounds such as phenolic compounds, antioxidant activity and caffeine which are believed to improve health and wellness were evaluated through chemical analysis. Further, moisture content, total ash, crude fiber, crude fat and minerals were evaluated. Finally, the sensory qualities such as taste, aroma, colour and overall acceptability were evaluated through both a consumer panel and a tea expert.



Results

The tea blends with higher percentage of high grown tea was preferred more in terms of aroma and colour while the tea blend with second highest percentage of low and mid grown tea was preferred more in terms of taste.

The findings confirmed that elevation-based scientific blending can optimize health-related and consumer-driven characteristics in Sri Lankan black teas.

This is a non-technical summary of the project report titled "Development of an optimized Sri Lankan black tea blend from low, mid and high grown tea for enhanced bioactive compound retention" supervised by Dr. D.M.S.S. Daundasekara*, Department of Food Science & Technology, Faculty of Agriculture, University of Peradeniya. *saumalid@agri.pdn.ac.lk.

VACCINATED BUT INFECTED: THE UNTOLD ROLE OF *Candida* IN BOVINE UDDER INFECTIONS



M.P.D.S. Vishmi Pabasara

More than 135 microorganisms can cause udder infections in bovine animals. Global investigations to check the association of fungal pathogens to bovine udder infections have conducted and those studies reveal *Candida* species as the most common microorganism that can be detected in bovine mycotic udder infections.

Unfortunately, Sri Lanka doesn't have any published research papers conducted to identify and characterize *Candida* species associated with bovine udder infections. As the very first reported evidence in Sri Lanka, we were able to identify, characterize and check the antifungal resistance patterns of *Candida* isolated from bovine milk samples.
Candida is a pathogen awaiting to infect the udder which is living in the normal flora of cattle. The genus contains variety of species such as *C. albicans, C. krusei, C. glabrata, C. parapsilosis* and *C. tropicalis*.




Figure 1: Microscopic view of a Candida sp. at 100X magnificatio

In the study, bovine milk samples with high number of milk gland cells were collected from farms around Kandy and Matale districts.

Samples were cultured and enriched using Sabouraud Dextrose Agar (SDA) and then further specific isolation was performed on Chromogenic agar.

Molecular identification was conducted by incorporating ABC genotyping technique for *C. albicans* and non-albicans species employing the restriction digestion of amplified fragments of ITS region of the isolates (PCR-RFLP). Fifteen Candida isolates were obtained from 36 milk samples classifying 09 isolates as *C. albicans* (60%) and 06 isolates (40%) as non-albicans species. Furthermore, ABC Genotyping revealed that pathogenic *C. albicans* genotype A was the only genotype appeared in *C. albicans* isolates. Tests conducted to check the antifungal susceptibility with Nystatin resulted 07 nystatin sensitive isolates & 08 resistance isolates. The presence of *Candida* species in subclinical cases highlights the potential role of *Candida* sp. in the early stages of udder infection.




Figure 2: Species specific colony colors of Candida sp. on chromogenic agar

Figure 3: Antifungal sensitivity of Candida sp.

In already published many research papers, *C. albicans* genotype A has identified as the most virulent genotype. Most interesting fact in the study is that all *C. albicans* isolated from bovine milk samples belonged to the genotype A and it hints us a developing risk of udder invasion by these *Candida* sp. in near future. Although most commercially available treatments for udder infections are designed primarily against bacterial pathogens, the findings emphasize the necessity of developing combined treatment formulations that incorporate antifungal components to prevent invasions from these virulent *Candida* species in the future.

This is a non-technical summary of the project report titled "Phenotypic and molecular characterization of bovine udder infections-associated *Candida* species and their antifungal resistance" supervised by Prof. S.P. Kodithuwakku*, Department of Animal Science, Faculty of Agriculture, University of Peradeniya. * surangap@agri.pdn.ac.lk

Smart Seeds with Built-In Immunity




W.A.P. Wikarshani

Soil is home to many tiny organisms, some helpful, others harmful. Among them are soil-borne fungi. The hidden enemies that silently attack and destroy vegetable seedlings even before they get a chance to grow. Farmers often rely on chemical pesticides to fight these invisible enemies, yet these chemicals can harm the environment, beneficial organisms, and even human health.

This study looked for a smarter and greener seed protection method using biotic elicitors, which are natural molecules like alarm signals that help plants switch on their own defense systems. To make them more effective, these elicitors were combined with nano-scale materials.

How was study conducted?

The key ingredient came from the fungus itself. Tiny, seed-like structures called sclerotia, which look just like mustard seeds, but are actually the fungus's survival structures. From these sclerotia, I extracted the genetic material (fungal DNA), broke it into small pieces, and mixed it with naturally occurring clay minerals at the nano scale (montmorillonite and hydrotalcite) to form a fine powder ready for seed application.



Seeds of three common Sri Lankan popular crops tomato, brinjal, and chilli were treated in two easy ways, soaking the seeds for a short time and covering them with a thin protective layer of the product suspension.

These treated seeds were grown in natural soil already infected by disease-causing organisms. Their performance was compared with untreated seeds and other controls.

What did the study find?

Seeds treated with the special nano-formulation grew better and stayed healthier. They showed:

✓ Fewer disease incidence

✓ Higher germination – more strong and healthy seedlings came out

✓ Faster early growth and greater seedling vigor

Among the crops tested, tomato showed the best response, followed by brinjal and then chilli.

These findings show that nature can help protect plants in a safe way. The nano-based method gives farmers an eco-friendly tool to grow healthier crops with less use of chemicals.

Why It Matters to the Public?

Sri Lankans love tomato curry, brinjal moju, and spicy chillies in every meal. Plant diseases reduce harvests, raise market prices, and burden farmers. A simple improvement at the seed stage could protect crops, reduce pesticide use, and ultimately make healthy vegetables more affordable for all.

Key Take-Home Message



A tiny boost at the very beginning can help plants survive, thrive, and feed our nation with less reliance on harmful chemicals.

This is a non-technical summary of the project report titled "Evaluating the efficacy of formulated nano-enabled biotic elicitors as a seed treatment in controlling soil borne diseases of selected solanaceous vegetable crops" supervised by Prof. D.M.De. Costa.* Department of Agricultural Biology, Faculty of Agriculture, University of Peradeniya. *dmdcosta@agri.pdn.ac.lk.

Digital Care Meets Tradition: "Ever Well 60⁺" The Future of Senior Self-Care



R.L. Ranathunga

Imagine your parents using a smartphone not just for calls or photos but as a daily partner that reminds them to eat well, stay hydrated, take their medication on time, and even keep their minds active. That vision is now becoming a reality in Sri Lanka, where innovation meets compassion through **"Ever Well 6o⁺"**, a new digital tool designed to promote healthy aging.

The world is witnessing a rapid rise in its elderly population, bringing new challenges to healthcare systems, families, and communities. In Sri Lanka, one of the fastest-aging nations in South Asia, the proportion of people over 6o is steadily increasing, and this shift calls for creative solutions to support independent, fulfilling lives among older adults.

In response, the **first of its kind innovation in Sri Lanka, "Ever Well 6o⁺"**, was developed a smartphone-based health and nutrition self-management application designed to empower senior citizens to take control of their well-being.

As the elderly population expands, issues such as malnutrition, dementia, and limited health awareness have become serious public-health concerns. Many older adults rely on others for daily nutrition and healthcare decisions, often leading to poor dietary balance and loss of independence. "Ever Well 6o+" bridges that gap by combining technology, culture, and empathy into one accessible platform.


The app offers personalized nutrition education, hydration reminders, medication tracking, and lifestyle guidance through a clear, colorful, and easy-to-navigate interface. What makes it truly distinctive is its **cultural relevance** incorporating local Sri Lankan recipes, diet plans based on national food habits, and simple home-based exercises familiar to elders. It helps users make healthier choices without separating them from their traditional lifestyles.

From the earliest stages, elders themselves played a key role in shaping "Ever Well 6o⁺." Their feedback guided every detail from font readability to the inclusion of caregiver-linked features that allow family members to monitor progress and offer support. When the first group of elders tested the app, their feedback was deeply encouraging. Many expressed appreciations for a tool that genuinely understood their daily realities and empowered them to manage their health with confidence.

Evaluation results revealed significant improvements in users' nutrition awareness, hydration practices, and self-management confidence. Elders reported feeling more active, informed, and motivated proof that well-designed digital tools can truly enhance independent and healthy aging.

Looking ahead, I hope to enrich **"Ever Well 6o⁺"** with **multi-language functionality** and **AI-driven personalization**, enabling the app to adapt dietary plans, reminders, and health guidance to each individual's needs. These advancements would make the platform even more inclusive and intelligent, expanding its reach and long-term impact.

This research demonstrates that when science, empathy, and culture unite, technology becomes trans-formative. By empowering Sri Lankan elders to take charge of their own health, **"Ever Well 6o⁺"** strengthens not only individual well-being but also the bonds within families and communities paving the way toward a more caring, connected, and healthy aging society.



රස, ගුණ, සුවඳ රැකදෙන - බ්ලීච් නොකළ සුදු පොල්තෙල්



ඩබ්ලිව්. එච්. ආර්. සෝමරත්න

ලාංකිකයන් ලෙස ගත්කල පොල්තෙල් යනු පොදුවේ අප සෑම දෙනාගේම දෛනික ආහාර වේලට එකතු වෙන ප්‍රධාන අංගයකි. වර්තමාන වෙලඳපොලේ ඇති පොල්තෙල් වර්ග ලෙස පොල්කුරුවිටෙන් නිශ්පාදනය කරනු ලබන පොල්තෙල් (Unrefined Coconut Oil), පොල් මදය අඹරා සිදිනු ලබන පොල්තෙල් (Virgin Coconut Oil), එන්සයිම ඇසුරින් නිපදවන පොල්තෙල් (Coconut Oil Extracted Using Enzymes), බ්ලීච් කල සුදු පොල්තෙල් (Refined, Bleached & Deodorized Coconut Oil [RBD Oil]) ආදිය ප්‍රධාන තැනක් ගනී.

පොල්තෙල් වල ඇති කහ පැහැයට හේතුව පොල්තෙල් නිස්සාරණය කිරීමේදී 80°C ට පමණ රත් කිරීම නිසා පොල්තෙල් වල ඇති කාබෝහයිඩ්‍රේට ප්‍රෝටීන, මයිලාර්ඩ් ප්‍රතික්‍රියාවට (Mailard browning) ලක්වී සාදන සංයෝගයන්ය. ඇතැම් පොල් ප්‍රභේද වල ස්වභාවිකවම අඩංගු වන ද්‍රව්‍යද මේ කහ පැහැයට හේතුවේ.

කෙසේ වුවද බ්ලීච් කරන ලද සුදු පොල්තෙල් වලින් ස්වභාවික පොල්තෙල් වල රසය, හා සුවඳ ඉවත්වීමත්, එයට කෘත්‍රිම රසයක් එක්වීමත්, විවිධ වූ රසායනික ද්‍රව්‍ය එක් කිරීමත් නිසා බ්ලීච් කල පොල්තෙල් වලටද මෑතකාලීනව වෙලඳපොළ ඉල්ලුම අඩුවීමක් දක්නට ලැබේ.පොල් මදය ඇසුරින් නිපදවන පොල්තෙල් වල ඇති තෙල් කැටිගැසීම නිසා එයටද පාරිභෝගික විශ්වාසය අඩුව යමින් පවතී.

කහ පැහැය පොල්තෙල් වලින් ඉවත් කිරීමට, ලාබදායී මෙන්ම පහසුවෙන් ලබාගත හැකි අමුද්‍රව්‍යමගින්, පරිසර හිතකාමී විසඳුමක් සෙවීම අරමුණු කරගත් පර්යේෂණයක ප්‍රතිපලය ලෙස සක්‍රිය කාබන්/ අඟුරු (Activated Carbon/ Activated Charcoal) මගින් පොල්තෙල් බ්ලීච් කිරීමකින් තොරව සුදු කිරීම හඳුන්වා දිය හැක. මෙහිදී ප්‍රධාන අඟුරු ප්‍රභවයන් ලෙස පොල් කටු හා දහයියා යොදා ගත් අතර කාබන් සක්‍රිය කිරීමට විනාකිරි (Acetic Acid) යොදා ගන්නා ලදී.




පර්යේෂණයට යොදාගත් සක්‍රිය කාබන් ස්වරූප



නිපදවූ සුදු පැහැති පොල්තෙල්

හොඳින් සෝදා වියලාගත් පොල් කටු හා දහයියා 100g බැගින් රැගෙන ඒවා 400-500°C උෂ්ණත්වයකට පුලුස්සා ගත් වහාම විනාකිරි දමා නිවෙන්නට හැර පැය 24ක කාලයක් විනාකිරි හොඳින් උරාගන්නා තුරු තබා හොඳින් ජලයෙන් සෝදා හැර (10-12 වතාවක්) පැය 24ක කාලයක් වේලාගනී. පසුව අවශ්‍ය ප්‍රමාණයන්ට කුඩු කර (106 micrometer සහ 250 Micrometer) පොල්තෙල් සමග මිශ්‍ර කර 80°C ට පමණ රත්කරමින් විනාඩි 20-40ත් අතර කාලයක් හොඳින් මිශ්‍ර කරගෙන මිශ්‍රණය නිවෙන්නට හැර සිලිකා/ සියුම් වැලි ලේයරයකින් (10cm උස) පහත පරිදි යවාගත් පසු සුදු පැහැති පොල්තෙල් ලබාගත හැක.මෙලෙස පොල්තෙල් සුදු කිරීමේ ක්‍රියාවලියට පොල්තෙල් ඒකකයකට(1L) වැයවන්නේ රුපියල් 20-25/=ක පිරිවැයක් පමණි.



සුදු පොල්තෙල් නිපදවීමේ සැලසුම් නිර්මාණය

මෙසේ ලබාගත් පොල්තෙල් වල වර්ණය පරීක්ෂා කළවිටදී අඩු කහ වර්ණයක් ලබාදුන්නේ පොල්කටු අඟුරු (106 micrometer) කුඩු ලෙස යෙදූ පොල්තෙල් සාම්පලයයි.තවද පෙනුම,ගන්ධය, රසය පරීක්ෂා කරන ඉන්ද්‍රිය සංවේදක ඇගයීම් පරීක්ෂණයක් මගින් (Sensory Evaluation) පොල්තෙල් වල පැහැය, සුවඳ හා පොල්තෙල් වලින් බදින ලද පපඩම් අනුසාරයෙන් රසය පරීක්ෂා කළ අතර පොල්කටු අඟුරු කුඩු (106 micrometer) ලෙස සකසා පොල්තෙල් සමග මිශ්‍ර කොට සෑදූ අවර්ණ පොල්තෙල් වලට බොහෝ දෙනාගේ කැමැත්ත ඇති බව තහවුරු විය.

මේ ආකාරයට ලබාගත් සුදු පොල්තෙල් වල ඇති ගුණයන් රාශියකි. සක්‍රිය කාබන් වල ඇති අවශෝෂක ගුණය මගින් පොල්තෙල් වල ඇති අහිතකර නිදහස් මේද අම්ල (Free Fatty Acids) හොඳින් අවශෝෂණය කරගනු ලබයි.තවද ඇසිඩ් අගය (Acid Value) කැපී පෙනෙන ලෙස අඩු නිසා එය පොල්තෙල් වල ඇති නිදහස් මේද අම්ල ප්‍රමාණය අඩු කර කොලෙස්ටරෝල් ඇති වීම පාලනයට උපකාරී වේ. මෙම සක්‍රිය කාබන් වල හා සිලිකා වල ඇති ජල අවශෝෂක හැකියාව නිසා පොල්තෙල් වල ඇති ජල ප්‍රතිශතයේ පැහැදිලි අඩුවීමක් නිරීක්ෂණය කළ හැකිවිය. එනිසා එම පොල්තෙල් මුඩුවීමට ඇති හැකියාව ද අවමය.

තවද මෙම පොල්තෙල් වල පෙරොක්සයිඩ් අගය (peroxide value) සැලකිය යුතු ලෙස පහළ අගයක් ගැනීමෙන් පෙන්නුම් කරන්නේ මෙම සක්‍රිය කාබන් අංශු මගින් පොල්තෙල් වල නිපදවෙන පෙරොක්සයිඩ අවශෝෂණය කරගනු ලබන බවය.එමනිසා මෙම පොල්තෙල් වල ආයු කාලය සාමාන්‍ය පොල්තෙල් වලට වඩා ඉහළ අගයක් ගනී. මෙම සක්‍රිය අඟුරු/කාබන් යෙදූ පොල්තෙල් හා සාමාන්‍ය පොල්තෙල් අතර pH අගය ආදියෙහි පැහැදිලි වෙනස්කමක් දක්නට නොමැත. ඒ අනුව මෙම කාබන් වලින් පොල්තෙල් වල ස්වභාවික ලක්ෂණ වෙනස් වීමටද හැකියාව අවමය.

මේ අනුව සක්‍රීය කාබන් ප්‍රභවයන් ඉවතලන පොල්කටු හා දහයියා වැනි කෘෂි ද්‍රව්‍ය උපයෝගී කොටගෙන ලාභදායීව නිපදවිය හැකි බවත්, කාබන් සක්‍රිය කිරීමට විනාකිරි වැනි දුබල අම්ලයන් ටද හැකි බවත්, පොල්තෙල් පරිසර හිතකාමීව හා රසායනික ද්‍රව්‍ය නොයොදා අවර්ණ කල හැකි බවත් මෙම පර්යේෂණය තුලින් තහවුරු කළ හැකි විය.රසත්, ගුණත්, සුවඳත් නොවෙනස්ව රැකදෙන සක්‍රිය කාබන් මගින් අවර්ණ කරන ලද හා බ්ලීච් නොකළ සුදු පොල්තෙල් විශ්වාසයකින් යුතුව වෙළඳපොළෙන් මිලදී ගැනීමට පාරිභෝගික ජනතාවට ඉඩ සැලසීමට පුළුවන.

බීජ තේ වලිනුත් රිකිලි තේ වලිනුත් ඔබේ තේ කෝප්පයට එක් කරන්නෙ එකම රසයක්ද?



නිළිණි ප්‍රසාදිකා

අතීතයේ පටන් ලෝකය පුරා ශ්‍රී ලාංකීය කළු තේ සඳහා ඇත්තේ විශාල ඉල්ලුමක් වන අතර ශ්‍රී ලංකාව හොඳම කළු තේ සම්භවයක් ඇති රටක් වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ එහි අද්විතීය භූගෝලීය පිහිටීම සහ දේශගුණික ලක්ෂණයි. ලොව පුරා වටිනාකමින් අනූන තේ කෝප්පයක් පාරිභෝගිකයන් වෙනුවෙන් ලබාදීමට සිදු කරන ලබන විද්‍යාත්මක පර්යේෂණ වලින් අනාවරණය වී ඇත්තේ තේ ශාකය වැවෙන ආකාරය මත එනම් බීජ වලින් ද හෝ රිකිලි වලින්ද මත එයින් ලබා ගන්නා තේ වල පැහැය හා රසය වෙනස් වන බවයි. එහෙත් තේ වල මූලික සුවඳ, රසය හා සෞඛ්‍ය සම්පන්න ගුණාංග වෙනස් නොවේ.


ශ්‍රී ලංකාවේ බගවන්තලාව ප්‍රදේශයේ ශාන්ත විග්ෙන්ස් තේ වත්තේ සිදු කරන ලද මෙම පර්යේෂණය, බීජ වලින් වවන ලද තේ ශාක (බීජ ශාක) සහ අතු කැබැලි මගින් වවන ලද (VP) තේ ශාක වලින් ලබා ගන්නා කළු තේ දෙවර්ගය සංසන්දනය කිරීම අරමුණු කරගෙන සිදු කරන ලදි.මෙම පර්යේෂණයේ අරමුණ වූයේ මෙම මූලික වෙනස ඔබේ තේ කෝප්පයට බලපාන්නේ කෙසේද යන්න තහවුරු කිරීමයි.

බීජ තේ සහ රිකිලි තේ සඳහා හැඳින්වීම

තේ (*Camellia sinensis*) බෝවීම සිදු කල හැක්කේ බීජ හෝ අතු කැබැලි මගින් වේ. බීජ මගින් බෝවන තේ "බීජ තේ (Seedling tea - ST)" ලෙසද, අතු කැබැලි මගින් බෝවන තේ "රිකිලි තේ (Vegetatively Propagated tea - VP tea)"ලෙසද හැඳින්වේ.බීජ තේවලින් ලැබෙන වගාවක් බහු විවිධත්වයකින් යුක්ත වේ. ඒවායේ තේ පැළයෙන් පැළයට වෙනස් වන බැවින් වගා ක්ෂේත්‍රයේ ඉහළ මට්ටම (plucking table) සහ කළමනාකරණ ක්‍රියාවලි එකසමාන නොවේ. එහෙත්, මෙම විවිධත්වය නිසා බීජ තේ වගා වියළි කාලවලද, රෝග හා පළිබෝධවලටද ඉතා හොඳ හෝ මධ්‍යස්ථ ඔරොත්තු දීම් පෙන්වයි.නමුත් VP tea යනු එකම මවු පැළයකින් ජනිතව එකසේ පවතින පැළවලින් සමන්විත වගාවක් වේ. මෙමගින් එකසමාන වර්ධනයක් සහිත ඉහළ ගුණාත්මකභාවය ලබා දෙන වගාවක් ලබාදේ. සමහර රිකිලි, බීජ තේවලට වඩා වැඩි අස්වැන්නක් ලබා දිය හැක. එහෙත්, සියලු පැළ එකම ජනිත ලක්ෂණ වලින් යුක්ත බැවින්, රෝග හෝ පළිබෝධයක් ඇති වූ විට විශාල හානි සිදුවිය හැක.

ශ්‍රී ලංකාවේ තේ පරම්පරාව (germplasm) පිළිබඳ අධ්‍යයන අනුව, බීජ තේ වල පවතින පැනිරී යන ගැඹුරට විහිදුණු මූල පද්ධතිය සහ මවු ශාක වල පවතින විවිධත්වය හේතුවෙන් රිකිලි තේ වලට සාපේක්ෂව රසායනික සංයුතිය සුළු වශයෙන් වෙනස් වීමට ඉඩ කඩක් පවතින බව විශ්වාස කෙරේ.බීජ හා අතු කැබැලි මගින් බෝවීමෙන් බෝවන තේවල මෙම ජෛව හා රසායනික වෙනස්කම් අවබෝධ කරගැනීම තේ වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට වැදගත් වේ.

මෙම පර්යේෂණයේදී අපගේ වැදගත්ම සොයාගැනීම වූයේ තේවල පැහැය සහ තේ වල ජල ද්‍රාවණ හැකියාව ගැනයි. VP තේ ශාක වලින් ලබා ගන්නා තේ වැඩි පැහැයක් සහ ජල ද්‍රාවණයක් (%) පෙන්වූවේය. ජල ද්‍රාවණය යනු තේ කොළ වලින් නටන ජලයට ලබා ගත හැකි ද්‍රව්‍ය ප්‍රමාණයයි.එනම් තේ වල ශක්තිය සහ ගුණාත්මකබව මැනිය හැකි දර්ශකයකි. සරලව කිවහොත්, VP තේ ශාක වලින් ලබා ගන්නා තේ වලින් වැඩි ශක්තියක් තේ කෝප්පය ට ලබා ගත හැක.ඒත්, පුහුණු රස විචාරකයන්ට අනුව බීජ ශාක සහ VP ශාක වලින් ලබා ගන්නා තේ වල රසයේ හෝ සුවඳේ සැලකිය යුතු වෙනසක් නොමැති බව පෙනී ගියේය. මෙම කලාපයේ තේ වලට ආවේනික වූ මිහිරි රසය ස්ථාවරව පැවතුනි.මේ අනුව ප්‍රජනන ක්‍රමය තේවල "ශක්තිය" නියම කළ ද පස, දේශගුණික තත්ත්වය සහ උන්නතාංශය යන සාධකද රසය සහ සුවඳ සඳහා ප්‍රධාන හේතු කාරකයන් විය හැකි බවය.




රූපය 1: විශ්ලේෂණයේදී වෙනසක් දැක්වූ පරාමිතීන්

සුවඳ හා රසයෙන් ඔබ්බට: තේ කොළ දෙවර්ගයේ රසායනික සංයුතිය විශ්ලේෂණය කිරීමේදී, වෙනස්කම් වලට වඩා වැඩි ගණනක් සමානකම් හඳුනා ගැනුනි.

*** සමාන බලපෑම් සහ ප්‍රති-ඔක්සිකරණ ගුණ:** තේවල ප්‍රධාන උත්තේජකයක් වන කැෆේන් ප්‍රතිශතය දෙපක්ෂයේම තේ වල බොහෝ දුරට සමාන විය. එලෙසම, තේවල සෞඛ්‍ය සම්පන්න ගුණාංග පිළිබඳ ප්‍රධාන දර්ශකයක් වන ප්‍රති-ඔක්සිකරණ ක්‍රියාකාරිත්වය (%) ද සැලකිය යුතු වෙනසක් නොපෙන්වුවේය.

*** සමාන රසායනික සංයුතිය සහ පෝෂණ ගුණාංග:** තේ වල සීනි ප්‍රමාණය, ජල ප්‍රතිශතය, ප්‍රෝටීන, ලිපිඩ තන්තු ප්‍රතිශතය, ඛනිජ විශ්ලේෂණය කිරීමේදී තේ දෙවර්ගය අතර වෙනසක් නොපෙන්වුයේය.

*** ස්ථාවර ඛනිජ ප්‍රමාණය:** යකඩ (Fe), මැග්නීසියම් (Mg) සෝඩියම් (Na) පොටෑසියම් (K) වැනි මහා මූලද්‍රව්‍ය හා සින්ක් (Zn) සහ මැන්ගනිස් (Mn) වැනි ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය වල ඛනිජ විශ්ලේෂණය කිරීමේදී දැකගත හැකි වෙනස්කම් දක්නට නොලැබුණේය.



රූපය 2: විශ්ලේෂණයේදී වෙනසක් නොදැක්වූ පරාමිතීන්

අනාගතයේ දී ගුණාත්මක තේ කෝප්පයක් සඳහා:
අපගේ සොයාගැනීම් පෙන්වා දෙන්නේ VP ශාක වලින් ලබා ගන්නා තේ වඩාත් ඒකාකාරී හොඳ පාටකින් යුක්ත තේ නිෂ්පාදනය කරන බවය. මෙය තේ මිශ්‍ර කිරීම් සඳහා ඉතා වටිනා ගුණාංගයකි.කෙසේවුවද, බීජ ශාක වලින් ලබා ගන්නා තේ වල මූලික රසය හා සෞඛ්‍ය සම්පන්න ගුණාංග නොවෙනස්ව පවතින බව ඉස්මතු කරයි. එමෙන්ම තේ යනු පාරිසරය සමඟ අන්තර්ක්‍රියා දක්වන ඍතු ආශ්‍රිත වගාවකි.මෙම වසරේ ඔක්තෝබර් මාසයට වඩා පර්යේෂණය සිදු කළ සැප්තැම්බර් මාසය පුරා පැවතුණු බගවන්තලාවේ සිසිල් සුලං තත්ත්වය තේ ශාකවල රසායනික සංයුතිය හා ගුණාත්මක භේදයන් ස්ථායිව පවතින්නට හේතු විය.ඒ සමගම, සැප්තැම්බර් මාසයේ ඉහළ ආර්ද්‍රතාවය හා වැසි ප්‍රමාණය තේ වල තෙතමන තත්ත්වයට සහ පසෙහි පෝෂක අවශෝෂණයට බලපාමින් ජල සාරය හා තේ වල වර්ණයට දැක්වුණු වෙනස්කම් ඇති කිරීමට දායක විය. පර්යේෂණ නිගමනයක් ලෙස කිව හොත්,තේ බීජ විසින් වවන ලද ශාක සහ රිකිලි ක්‍රමයෙන් වවන ලද ශාක අතර තිබෙන ප්‍රශ්නය "කුමන ක්‍රමය හොඳද" යන්න නොවේ., මූලිකව ඔබ ප්‍රිය කරන රසය හා සෞඛ්‍ය සම්පන්න ගුණාංග එය වර්ධනය වන්නේ කුමන ක්‍රමයකින් වුවද, නොපෙරළී පවතින බවට ඔබට විශ්වාසයක් ඇති කළ හැකි බව මෙම පර්යේෂණයෙන් වැඩි දුරටත් පෙන්වාදෙයි.



ශාන්ත විග්ෙන්ස් තේ වත්ත, බගවන්තලාව ප්‍රදේශය

This is a non-technical summary of the project report titled "Comparative assessment of physicochemical and sensory characteristics in black tea derived from vegetative and seedling cultivars in St.Vigeans Estate in Bogawanthalawa" supervised by Mr. N.Y. Jayanath*, Department of Food Science and Technology, Faculty of Agriculture, University of Peradeniya.
*jayanathny@agri.pdn.ac.lk

ඇඹුල් කෙසෙල් -

අස්වනු නෙලීමට සුදුසුම කාලය ගැන ඔබ දැනුවත්ද??



W.P.T.M.දිසානායක

අස්වනු නෙලීමේ අවස්ථාව තීරණය අභියෝගයක්ද?

කෙසෙල් යනු ශ්‍රී ලාංකික ගොවීන් අතර ජනප්‍රියතම වගා බෝගයකි. මෙරට විවිධ කෙසෙල් වර්ග වගා කරන අතර ඒ අතරින් ඇඹුල් කෙසෙල් එහි රසය සහ වගා කිරීමේ පහසුව නිසා විශේෂ ජනප්‍රියතාවයක් හිමි කරගෙන ඇත. බොහෝ දේශීය ගොවීන් කෙසෙල් කැන් කැපීම සුදුසු අවස්ථාවේ නොව වෙළඳපොළ ඉල්ලුම මත පමණක් පදනම්ව තීරණය කිරීම හේතුවෙන් පසු අස්වනු හානිය අද වන විට ඉහළ ගොස් ඇත. අස්වැන්න නෙලා ගැනීමට සුදුසු අවස්ථාවට පෙර කෙසෙල් අස්වැන්න නෙලා ගත් විට කෙසෙල් ගෙඩි වල අපේක්ෂිත රසය වර්ධනය නොවන අතර, නියමිත කාලයට පසුව අස්වැන්න නෙලා ගත් විට කෙසෙල් ගෙඩි ඉක්මනින් ඉදෙන අතර ඉතා කෙටි ආයු කාලයක් නිරීක්ෂණය වේ.





මෙම කැන් ඇවරි වෙන් කර පිරිසිදු කිරීමෙන් පසු, සාමාන්‍ය උෂ්ණත්වය (27-30 Centigrade) යටතේ ගබඩා කරන ලද අතර, ගබඩා කරන ලද කාලය තුළ පොත්තේ පැහැය, ගෙඩිවල මෘදු බව, බර, සහ රසයෙහි වෙනස්වීම කාලයත් සමග පරීක්ෂා කරන ලදී.

ගවේෂණ ක්‍රමය

මෙම අධ්‍යනය ගල්කිරියාගම, දඹුල්ල පිහිටි එල්ලාවල හෝටිකල්ච(ර්) පෞද්ගලික ආයතනයේදී සිදු කරන ලද්දේ ඇඹුල් කෙසෙල්වල අස්වනු නෙලීමට වඩාත් සුදුසු කාලය නිර්ණය කිරීම සඳහාය. මෙයට කෙසෙල් අස්වනු ලබාගන්නා ලද්දේ රාජාංගනය ප්‍රදේශයේ පිහිටි එම ආයතනය සතු ගොවිපළකිනි. මෙහිදී ගස පීදීමෙන් පසු සති 9 සිට 13 දක්වා කාලවලදී අස්වනු නෙලීම සිදු කරන ලදී.




- **සති 9 | සති 10 | සති 11 | සති 12 | සති 13**
- **සති 9 සිට 13 දක්වා ගෙඩිවල හැඩය වෙනස්වීම**
- **ගබඩා කාලය අනුව කෙසෙල් ගෙඩිවල පැහැය හා මෘදු බව වෙනස්වීම මත ආයු කාලය**

ප්‍රධාන ප්‍රතිඵල

ප්‍රතිඵල අනුව නියමිත කාලයට පෙර (සති 9-10) අස්වැන්න නෙලූ කෙසෙල් ගෙඩි මෘදු වීමට දිගු කාලයක් වැය කල ද ඒවායේ රසෙහි අඩුවක් හා පැහැයෙහි වෙනසක් පැවතිණි. අස්වනු නෙලිය යුතු කාලය පසු වී (සති 13) අස්වනු නෙලූ කෙසෙල් ගෙඩි ඉතා ඉක්මණින් කහ පැහැ වී, මෘදු වී කෑමට සුදුසු අවස්ථාවට පත් විය.

සති 11 සිට 12 දක්වා කාලය තුළ අස්වනු ගත් කෙසෙල් වල පැහැය, රසය සහ කල් පවත්නා කාලය අතර හොඳම සම්බන්ධතාවය දක්නට ලැබුණි.



හොඳම අස්වනු අවස්ථාවෙන් ගොවීන්ට වැඩි ආදායමක්

එම දත්ත අනුව දේශීය වෙළඳපොළ සඳහා සති 12-13 අතර අස්වනු නෙලා ගැනීමත්, අපනයනය සඳහා සති 11-12 අතර අස්වනු නෙලා ගැනීමත් සුදුසු බව මෙම අධ්‍යනය මගින් තහවුරු විය. මෙම කාලය තුළ අස්වනු නෙලා ගැනීමෙන් වඩාත් ලාභදායී සහ උසස් තත්ත්වයේ කෙසෙල් වෙළඳ පොළ වෙත ලබා දීමටත්, පසු අස්වනු හානිය අවම කර ගැනීම මගින් ආදායම වැඩි කර ගැනීමටත් හැකියාව ලැබේ.

රසය සහ ගුණය රැකගනිමින් මෘදු වියළි අඹ කැබලි සෑදීමට මඟක්!



සඳුනි නිපුනිකා

අඹ, පලතුරු ලෝකයේ රජු මෙන්ම නිවර්තන කලාපයේ ඇපල් ලෙසද හඳුන්වනු ලබයි. *Mangifera indica* L. උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන අඹ අයත් වන්නේ Anacardiaceae යන කුලයටයි. අඹ යනු ගතට මෙන්ම සිතටද පහසුව දනවන පලතුරකි. රසය පමණක් නොව අඹ වල ඉතා ඉහළ පෝෂණ ගුණයක්ද ඇත. එය විටමින්, ඛනිජ ලවණ මෙන්ම ප්‍රතිඔක්සිකාරක වලින්ද පෝෂිතය. මේ දක්වා සිදුකර ඇති පර්යේෂණ මගින් අඹ වල ඇති පෝෂණීය සංඝටක මගින් ප්‍රතිශක්තීකරණය, පෙනීම, ආහාර ජීරණය පහසු කිරීම සහ විවිධ පිළිකා තත්ත්ව වලින් වැළකීම වැනි සෞඛ්‍ය ප්‍රතිලාභ රැසක් ඇති බව සොයාගෙන ඇත.



නමුත් අඹ අස්වනු කාලය කෙටි නිසා බොහෝ විට පසු අස්වනු හානිය ඉහළය. අස්වනු නෙළීමෙන් පසු අඹ ඉතා වේගයෙන් ඉදී කුණු වී යයි. එම නිසා නියමිත පාලනයක් නොමැති විට අඹ පරිභෝජනයට පෙර විශාල ලෙස නාස්ති වී යයි. ශ්‍රී ලංකාව තුළද පලතුරු හා එළවළු පසු අස්වනු හානිය සාමාන්‍යයෙන් 30-40% පමණ වේ.

අඹ වියළීම මගින් වියළි අඹ කැබලි සාදා, කල්තබා ගැනීම වැඩි කරගත හැක. වියළීම මගින් අඹ කැබලි වල ජලය ඉවත් කර ක්ෂුද්‍රජීවී වර්ධනය නැවැත්විය හැකි නමුත් ඉහළ උෂ්ණත්ව භාවිතයෙන් වියළීමේදී එහි අඩංගු විටමින් C, කැරොටිනොයිඩ සහ ෆීනොල් වැනි උෂ්ණත්වයට සංවේදී පෝෂක හානි වේ. ඒ සමගම අඹ කැබලි වල පැහැය, මෘදු වයනය සහ රසයද අඩු විය හැක. එම නිසා මෙම ලිපිය මගින් පූර්ව ප්‍රතිකාර භාවිතය හා උෂ්ණත්ව පාලනය මගින් වියළි අඹ කැබලි වල සිදුවන මෙම පැහැය, මෘදුභව, රසය සහ පෝෂණ හානිය අවම කිරීමට සුදුසු ක්‍රමයක් යෝජනා කිරීමට බලාපොරොත්තු වේ.

මෙම පරීක්ෂණයේදී, අඹ කැබලි 85 °C ඉහළ උෂ්ණත්වයකින් වියළීම ආරම්භ කර පසුව උෂ්ණත්වය ක්‍රමයෙන් අඩු කිරීම, 50 °C වැනි පහළ උෂ්ණත්වයකින් ආරම්භ කර පසුව උෂ්ණත්වය ක්‍රමයෙන් වැඩි කිරීම සහ 50% සාන්ද්‍ර සීනි සිරප් ද්‍රාවණයක පැය 6ක කාලයක් ගිල්වා තබා පසුව 60 °C උෂ්ණත්වයේ විජලනය කිරීම යන ක්‍රම අත්හදා බැලීය. විජලනයෙන් පසු එක් එක් ක්‍රමයෙන් ලැබුණු අඹ කැබලි වල විටමින් C, කැරොටිනොයිඩ සහ ෆීනොල් යන පෝෂණ සංඝටකයන් මෙන්ම පැහැය, මෘදු වයනය, රසය වැනි සංවේදක ගුණද පිරික්සනු ලැබීය. එහිදී ඉහළ පෝෂණ සංඝටකයන් මෙන්ම ඉහළ සංවේදක ගුණ ලබාගත හැක්කේ 50% සාන්ද්‍ර සීනි සිරප් ද්‍රාවණයක පැය 6ක කාලයක් ගිල්වා තබා පසුව 60 °C උෂ්ණත්වයේ විජලනය කිරීම යන ක්‍රමයෙන් බව සනාථ විය.

මෙහිදී, ඉදුණු නැවුම් අඹ තෝරා, හොඳින් සෝදා, පසුව අඹ පොත්ත ඉවත් කර, ඒකාකාර කැබලි වලට කපා ගත යුතුයි. සජීවී වර්ණය, රසය, පෝෂණ ගුණය හා කල්තබා ගැනීමේ කාලය වැඩිදියුණු කිරීම සඳහා පූර්ව ප්‍රතිකාර කරනු ලබයි. පූර්ව ප්‍රතිකාර ලෙස 50% සාන්ද්‍ර සීනි සිරප් සමග 0.05% සිට්‍රික් අම්ලය සහ 0.1% සෝඩියම් මෙටාබයිසල්ෆයිට් (SMS) අඩංගු ද්‍රාවණයක පැය 6ක කාලයක් ගිල්වා තබයි. පසුව අඹ කැබලි ද්‍රාවණයෙන් ඉවතට ගෙන තනි තට්ටුවක් ලෙස වියළන තැටි මත අතුරනු ලබයි. පසුව එය පැය 8-9 ත් අතර කාලයක් 60 °C අඩු උෂ්ණත්වයක ආහාර විජලනයට භාවිත කරන උදුනක උණුසුම් වායු භාවිතයෙන් වියළා ගනී. වියළාගත් අඹ කැබලි සිසිල්, වියළි ස්ථානයක වාතය රහිත බහාලුම්වල ගබඩා කළ යුතුයි.

උණුසුම් වායු යටතේ ඉහළ උෂ්ණත්වයකදී වියළා ගන්නා අඹ කැබලි වලට සාපේක්ෂව මෙම ක්‍රමයෙන් ලබා ගන්නා අඹ කැබලි වල විටමින් C 143.90 ± 0.01 mg/100g, කැරොටිනොයිඩ 5.04 ± 0.05 mg/100g, සහ ෆීනොල් 945.00 ±7.71 mg/100g ප්‍රමාණයක් අන්තර්ගත විය.

සාන්ද්‍ර සීනි ද්‍රාවණයක බහා තැබීමේදී අඹ කැබලි වල ඇති ජලය ආස්‍රැතිය (Osmosis) මගින් ඉවත් වේ. එම නිසා මෙම ක්‍රමය මගින් සාමාන්‍යයෙන් 60 °C උෂ්ණත්වයකදී වියළීමට යන කාලයට වඩා අඩු කාලයකදී වියළා ගත හැක. මෙමගින් අඹ කැබලි වැඩි උෂ්ණත්වයකදී දීර්ඝ කාලයකට නිරාවරණය වීමේදී වන පෝෂණ හානිය අවම කරගත හැක.

මෙම ක්‍රමය මගින් රසවත්, මෘදු, පෝෂණයෙන් පිරි අඹ කැබලි සාදා ගත හැකි අතර එය ඉතා රසවත් අතුරුපසක් ලෙස භාවිත කළ හැක. එමෙන්ම අඹ පසු අස්වනු හානිය ද අවම කරගත හැක.



This is a non-technical summary of the project report titled "Optimization of processing conditions for dried mango strips with enhanced organoleptic and nutritional quality" supervised by Dr. D.M.S.S. Daundasekara , Department of Food Science and Technology, Faculty of Agriculture, University of Peradeniya. *saumalid@agri.pdn.ac.lk

දහයියා පෛව අඟුරු වලින් සරු වී අස්වැන්නක් ලබා ගමු




කේ. සෂිණි සත්රිකා

ඉවත ලන වී බොල් භාවිත කර නැවත වැඩි වී අස්වැන්නක් ලබා ගත හැකි බව ඔබ දැන සිටියාද?

වී නොහොත් සහල් යනු ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරයයි. එමඟින් ශරීරයේ පැවැත්මට අවශ්‍ය වන කාබෝහයිඩ්‍රේට්, තන්තු සහ විවිධ විටමින් හා ඛනිජ ලවණ සපයනු ලබයි. මිනිස් ශරීරයේ වර්ධනයට හා පැවැත්මට මෙවැනි පෝෂක අවශ්‍ය වන්නා සේම වී ශාකයේ වර්ධනයට හා අස්වැන්නටද අවශ්‍ය වන පෝෂක නැතුවාම නොවේ.

නයිට්‍රජන්, වී ශාකයේ වර්ධනයට හා ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට සෘජුවම උපකාරී වන මූලද්‍රව්‍යයකි. එය ශාකයට අවශ්‍ය වන මහා පෝෂකයක් ලෙස හඳුනා ගෙන ඇත. ගොවීන් මෙම නයිට්‍රජන් අවශ්‍යතාව සැපයීම සඳහා යූරියා පොහොර බහුලව භාවිත කරනු ලබයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුව සාමාන්‍යයෙන් එක වගා කන්නයක් සඳහා යූරියා කිලෝග්‍රෑම් 140 ක් පමණ යොදනු ලබයි. නමුත් අවාසනාවකට මෙන් මෙම යොදන නයිට්‍රජන් පොහොර සියල්ලම ශාකයට උරා ගැනීමට පෙර විවිධ ක්‍රම මඟින් පසෙන් ඉවත් වී යාම සිදු වේ. ඇමෝනියා වාෂ්පීකරණය, නයිට්‍රීකරණය, ජලයේ දිය වී යාම හෝ මූල මණ්ඩල කලාපයෙන් බැහැරට සේදී යාම යොදන ලද නයිට්‍රජන් පොහොර ඉවත් වන ක්‍රම කිහිපයකි.



දහයියා යනු වී නිෂ්පාදනයේ අතුරු ඵලයකි. සාමාන්‍යයෙන් අක්කර එකක වී වගාවකින් වී ටොන් පහක් අස්වැන්න ලෙස ලැබෙද්දී එයින් ටොන් එකක ප්‍රමාණයක් වී බොල් නැත්නම් දහයියා ලෙස ඉවත් වේ. මෙම දහයියා අපතේ නොයවා එය අධික උෂ්ණත්වය යටතේ වියෝජනය කර (එනම් පුළුස්සා) සාදා ගන්නා දහයියා පෛව අඟුරු යෙදීම මඟින් වී අස්වැන්නේ සැලකිය යුතු ප්‍රමාණයක් වැඩි කර ගැනීමට හැකි වේ.


නමුත් මෙම පෛව අඟුරු පිළිබඳව ගොවීන් අතර යම් යම් සැකයන් හා වැරදි මත පවතී. ඔවුන් විශ්වාස කරන්නේ පෛව අඟුරු හොඳ නමුත් එයින් ප්‍රතිඵලයක් ලබා ගැනීමට බොහෝ කාලයක් ගත වන බවයි. නමුත් දහයියා පෛව අඟුරු සක්‍රීය කර පසට යෙදුවහොත් ප්‍රතිඵල ලබා ගැනීමට ප්‍රමාද නොවේ. සක්‍රීය කිරීමේ ක්‍රම ලෙස අලුත සාදා ගත් පෛව අඟුරු නිවීම සඳහා ගොම දියර භාවිත කිරීම, පෛව අඟුරු කොම්පෝස්ට් වැනි කාබනික පොහොරක් සමඟ මිශ්‍ර කිරීම වැනි ක්‍රම භාවිත වේ.

මෙහි විද්‍යාත්මක පැතිකඩ වන්නේ පෛව අඟුරු යෙදීමත් සමඟ පසෙහි ඇති පෝෂක, පස තුළ සිටින ක්ෂුද්‍රජීවීන් ඔවුන්ගේ ගුණනය නැත්නම් ඔවුන්ගේ ප්‍රජනනය සඳහා භාවිත කිරීමයි. මන්ද අලුත යෙදූ පෛව අඟුරු බිඳ දැමීම සඳහා වැඩි ගහනයක් අවශ්‍ය වන බැවිනි. මේ අවස්ථාවේදී ශාකයේ වර්ධනය අඩාල වන බව දැකිය හැක. ගොවීන් විසින් මෙය පෛව අඟුරු යෙදීම නිසා ශාකයේ වර්ධනය අඩාල වන බවට වැරදි ලෙස අර්ථකථනය කරනු ලබයි. එය වළක්වා ගැනීමට හා ඉක්මන් ප්‍රතිඵල ලබා ගැනීමට සක්‍රීය කරන ලද පෛව අඟුරු යෙදීම උචිත වේ.

වී වගාවේදී තවත් අත්‍යවශ්‍ය කරුණක් වන්නේ ජල කළමනාකරණයයි. මෝසම් වර්ෂා නිසා ශ්‍රී ලාංකික ගොවියන්ට ජල නිහයකින් තොරව වගා කන්නය පුරා ජලයෙන් යට වූ වගාවක් කළ හැක. නමුත් කාලගුණික විපර්යාස නිසා නුදුරු අනාගතයේදී ජල නිහතාවයකට මුහුණ දීමට සිදු වේ. ඒ සඳහා ගොවීන් කඩින් කඩ ජල සම්පාදනය වී වගාව සඳහා භාවිත කරනු ලබයි.

කඩින් කඩ ජල සම්පාදනය යනු බෝග වර්ධක අවධිය හා අස්වනු හටගන්නා අවධි හැර අනික් වගා කාලයේදී ජල සම්පාදනය නොකර සිටීමයි. මෙයින් වී අස්වැන්න අඩුවකින් තොරව අවම ජල භාවිතයකින් ලබා ගත හැකි වී ඇත.

මාගේ සොයා ගැනීම පදනම් වූයේ කුමන දහයියා පෛව අඟුරු ප්‍රමාණයක්, කුමන ජල කළමනාකරණ ක්‍රමවේදයේදී වඩාත් ධනාත්මකව වැඩි වී අස්වැන්නක් ලබා දීමට ක්‍රියා කරයිද යන්නයි. මෙහිදී වගා කන්න හතරකින් එකතු වන දහයියා ප්‍රමාණය කඩින් කඩ ජල සම්පාදන ක්‍රමය යටතේ එම කුඹුරටම යෙදීම මඟින් වී ශාකයේ වර්ධනය හා වැඩි අස්වැන්නක් ලබා ගත හැකි බව අනාවරණය කර ගන්නා ලදී.



ජීව පටල ජෛව පොහොර: ආරක්ෂිත බෝග වගාවේ අනාගත පෙරළිය



විනුරි අබේගුණවර්ධන

දේශගුණික වෙනස්වීම්, කෘමි පලිබෝධ සහ ලෙඩ රෝග පැතිරීම නිසා දිනෙන් දින තජර්නයට ලක්වන විවෘත බෝග වගාවෙන් හෙම්බත්ව සිටින ගොවි ජනතාවට අස්වැසිල්ලක් වනු වස් ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව යනු ගෝලීය කෘෂිකාමර්ික ක්ෂේත්‍රය තුළ ඉහළම තාක්ෂණයකින් සහ ඵලදායීතාවයකින් යුතුව එළවළු සහ මල් නිෂ්පාදනය කරන ප්‍රධානතම ක්‍රමවේදයකි. මෙම ආරක්ෂිත බෝග වගාවේදී වගා මාධ්‍ය ලෙස මූලිකව යොදාගන්නේ පස් රහිත වගා මාධ්‍යයන් වීම විශේෂත්වයකි. මෙහිදී ශාක වලට අවශ්‍ය පෝෂක ඇල්බට් ද්‍රාවණය වැනි පූර්ණ ජල ද්‍රාව්‍ය රසායනික පොහොර මිශ්‍රණ ඔස්සේ සපයනු ලැබේ. කෙසේ වෙතත් දිගින් දිගටම රසායනික පොහොර මත යැපීම අනාගත පරිසර දූෂණයකට මංපෙත් විවර කිරීමක් නොවේද?





මෙම ගෝලීය අබර්‍ුදයට විසඳුමක් ලෙස සහ දිනෙන් දින ඉහළ යන කාබනික ආහාර වලට ඇති ඉල්ලුම පාදක කර ගනිමින් බොහොමයක් වගාකරුවන් මේ වන විට කාබනික පොහොර භාවිතයට නැඹුරු වී තිබීම සතුටට කරුණකි. සාම්ප්‍රදායික කාබනික පොහොර වලින් ඔබ්බට යමින් ක්ෂුද්‍ර ජීවී ආනුකූලනය කරන ලද ජෛව පොහොර නිෂ්පාදන (Biofertilizer) වතර්මානයේ කෘෂිකාමර්ික ක්ෂේත්‍රය තුළ වඩාත් ප්‍රචලිතව ඇත. ජෛව පොහොර වල වැඩි දියුණු කළ ප්‍රභේදයක් ලෙස ජීව පටල ජෛව පොහොර (Biofilm biofertilizer) හැඳින්විය හැක. ක්ෂුද්‍රජීවී සමූහයක් ආරක්ෂිත ජීව පටල තුළ ආවරණය කර නිපදවන ලද මෙම ජෛව පොහොර වල ක්ෂුද්‍රජීවී ආයු කාලය සහ කායර්ක්ෂමතාව ඉතා ඉහළයි. ඒ අනුව, ආරක්ෂිත ගෘහ තුළ වගා කරන ලද සලාද පිපිඤ්ඤා වල බෝග වධර්නය සහ අස්වැන්නේ ගුණාත්මක භාවය කෙරෙහි ජීව පටල ජෛව පොහොර වල බලපෑම අධ්‍යයනය කිරීම සඳහා කරන ලද පයෙර්ෂණයක් මෙලෙස සංක්ෂිප්ත කර ඇත.

ජීව පටල ජෛව පොහොර වලට කිසිම විටක තනිව ක්‍රියා කළ නොහැකි අතර ක්ෂුද්‍රජීවීන්ගේ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය පෝෂක සහ තෙතමනය වගා මාධ්‍යය තුළ නොඅඩුව තිබීම අත්‍යවශ්‍ය වේ. එබැවින් මෙහිදී බලාපොරොත්තු වන්නේ රසායනික පොහොර භාවිතය අවම කරමින් නිෂ්පාදනය ඉහළ නැංවීමයි. මෙම පයෙර්ෂණයේදී පස් රහිත (කොහුබත්) වගා මාධ්‍යයක් තුළ රසායනික පොහොර (ඇල්බට් ද්‍රාවණය) 75% සමග විවිධ ජෛව පොහොර සංකලනයන් කිහිපයක් (මාළු දියර පොහොර, ජීව පටල ජෛව පොහොර සහ නවීකරණය කරන ලද බහුකාර්ය ජීව පටල ජෛව පොහොර) පරීක්ෂාවට ලක් කරන ලදී. මෙහිදී සලකා බලන ලද සියලුම පරාමිතීන් 100% ක් සහ 75% ලෙස රසායනික පොහොර යෙදූ පාලක දෙකක් සමග සංසන්දනය කිරීමෙන් නිගමන වලට එළඹිණි.

එහිදී ලද ප්‍රතිඵල වලට අනුව, 25% කින් රසායනික පොහොර ප්‍රමාණය පහත හෙළීම බෝගයේ වධර්නය සහ අස්වැන්න කෙරෙහි සැලකිය යුතු ඍණාත්මක බලපෑමක් සිදු කළ අතර ජෛව පොහොර භාවිතයෙන් එම ඌනතාවය සාර්ථකව ප්‍රතිපූරණය කළ හැකි බව සනාථ විය. තවද, බෝගයේ වධර්නය, හරිතප්‍රද සංයුතිය, අස්වැන්න සහ එහි ගුණාත්මක භාවය කෙරෙහි අනෙකුත් ජෛව පොහොර වලට වඩා බහුකාර්ය ජීව පටල ජෛව පොහොර (Multifunctional bio-fertilizer) සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට සමත් වීම කැපී පෙනෙන විශේෂත්වයකි. එය 100% රසායනික පොහොර භාවිතයේදී ලද ප්‍රතිඵල වලට බෙහෙවින් සමාන හෝ ඊටත් ඉහළ පරාසයක් දක්වා දෝලනය වන බව දත්ත විශ්ලේෂණ වාතර්ා තවදුරටත් සාක්ෂි දරයි. කෙසේ වෙතත්, රසායනික පොහොර වලට වඩා ජීව පටල ජෛව පොහොර වල අන්තගර්ත ඇසට නොපෙනෙන ක්ෂුද්‍රජීවීන් කෙතරම් බලවත්ද යන වග මෙයින් මනාව තහවුරු වේ.

ඒ අනුව, තිරසාර කෘෂිකමර්ාන්තයක් තුළින් ගෝලීය වෙළෙඳපොළ අතික්‍රමණය කිරීමට දේශීය ගොවි ජනතාව දුටු සුබ සිහින යථාර්ථයක් කරමින් ආරක්ෂිත බෝග වගාවේ නව පරිච්ඡේදයක් සනිටුහන් කළ ජීව පටල ජෛව පොහොර පරිසර හිතකාමී කෘෂිකමර්ාන්තයක් ගොඩනැංවීමට උර දෙන ප්‍රබල අවියක් වනු නොඅනුමානය.

අධික මද්‍යසාර සහිත පාන වෙනුවට රසවත් සහ සෞඛ්‍යයට හිතකර විකල්පයක්



සිතුමිණි උත්පලා පෙරේරා


වර්තමානයේ මද්‍යසාර පානයන් බොහෝ උත්සව, සාද මෙන්ම විනෝදාස්වාදමය අවස්ථාවල අනිවාර්ය අංගයක් බවට පත් වී ඇත. සතුට හා විනෝදය ඇති කිරීමට සහ සමාජ සම්බන්ධතා ගොඩනැගීමට මද්‍යසාර පානයන් මූලික මාර්ගයක් බවට පත්වීම මෙයට ප්‍රධානතම හේතුවයි. එහෙත් අධික මද්‍යසාර භාවිතය බෝ නොවන රෝග රැසකට මග පාදන අතරම මාරාන්තික රිය අනතුරු බොහෝමයකට ද හේතුවක් බවට පත් වී ඇත. එම නිසා මද්‍යසාර භාවිතා කිරීමේදී සෞඛ්‍යය ගැන මෙන්ම ආරක්ෂාව ගැනද සැලකිලිමත් විය යුතු වේ.

නමුත් මද්‍යසාර පානයන්හි තිබෙන රසය, සුවඳ සහ ගුණාත්මක භාවය එලෙසම තිබියදී, සෞඛ්‍යමය ප්‍රතිලාභ ද තිබෙන පානයක් විකල්ප ලෙස භාවිත කළ හැකි නම් අවාසිදායක තත්ත්ව රැසක් මගහරවා ගත හැකි වනු ඇත. මෙම පර්යේෂණය මගින් නිෂ්පාදිත අඩු මද්‍යසාර සාන්ද්‍රණයක් (0.5% - 1.2%) සහිත පලතුරු පානයේ ප්‍රධාන අරමුණ වන්නේ ද එයයි.



බනිජ ලවණ, ප්‍රතිඔක්සිකාරක සහ විටමින් වැනි පෝෂ්‍ය පදාර්ථ වලින් අනූන නිවර්තන කලාපීයව වර්ධනය වන අන්නාසි සහ කාමරංකා යන පලතුරු මෙහි මූලික අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නා ලදී. මෙහිදී පාලිත තත්ත්වයන් යටතේ යීස්ට් (Saccharomyces cerevisiae) මගින් පැසීමට ලක් කර අඩු මද්‍යසාර සාන්ද්‍රණයක් පවත්වාගත යුතු අතර, ඒ සඳහා සුදුසුම පාලිත තත්ත්වයන් නිර්ණය කිරීම පර්යේෂණ හරහා ප්‍රථමයෙන්ම සිදු කරන ලදී. ඒ අනුව ප්‍රශස්ත ද්‍රාව්‍ය ඝන ද්‍රව්‍ය 14 ◦Brix ද, pH අගය 3.8 ක්ද, යීස්ට් සාන්ද්‍රණය 0.75 g/L ක් ලෙසද පරීක්ෂණ මගින් තහවුරු වූ අතර මෙම තත්ත්ව යටතේ කාමර උෂ්ණත්වයේ පැය 24 ක් පැසීමට ලක් කිරීමෙන් මද්‍යසාර 1.1% ක් සහිත පානයක් නිපදවිය හැකි විය.

මීට අමතරව සිදු කරන ලද ක්ෂුද්‍ර ජීවී පර්යේෂණ, රසායනික පර්යේෂණ සහ සංවේදිතා පර්යේෂණ මගින් මෙම පානය නිර්මාණයට අදාළ ඉහත සඳහන් නිෂ්පාදන ක්‍රියාවලිය නිර්ණය කරන ලදී.



කාමරංකා වල ඇති ඔක්සලික් අම්ලය, කැරම්බොක්සින් වැනි ප්‍රතිපෝෂක ද්‍රව්‍ය වල බලපෑම පැසීම හරහා අවම වන අතර පැස්වරීකරණය නිසා ක්ෂුද්‍ර ජීවීන් විනාශ වීම මෙන්ම මෙතනෝල් වැනි අහිතකර රසායනික ද්‍රව්‍ය නිපදවීම ද අවම වේ. එමගින් මෙම නිෂ්පාදනයේ සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කරයි.

මෙම ක්‍රියාවලිය අවසානයේ නිෂ්පාදිත අඩු මද්‍යසාර සාන්ද්‍රණයක් සහිත පානය 10.35% ක සීනි ප්‍රමාණයකින්ද, 0.465% ක අම්ල ප්‍රමාණයකින්ද, 3.78 ක pH අගයකින්ද, 12.06 ◦Brix අගයකින්ද සමන්විත වේ. ප්‍රණීත පලතුරු සහ මද්‍යසාර මිශ්‍ර රසයකින්, සිත් ඇදගන්නා සුළු වර්ණයකින් සහ ප්‍රසන්න සුවඳකින් යුත් මෙම පානයේ විටමින් C, ප්‍රතිඔක්සිකාරක වැනි පෝෂ්‍ය පදාර්ථ ද අඩංගු වේ. එමෙන්ම මෙය ආහාර කර්මාන්තයට නව මානයක් එක් කළ හැකි නිෂ්පාදනයක් වන අතර, මද්‍යසාර රසයට ප්‍රිය නමුත් සෞඛ්‍යය පිළිබඳ සැලකිලිමත් වන පාරිභෝගිකයන්ට හොඳ විකල්පයක් ලෙසද හඳුන්වා දිය හැක.

This is a non-technical *summary of the project report titled* "Formulation & characterization of a low-alcoholic beverage using fermented star fruit (*Averrhoa carambola*) & pineapple (*Ananas Comosus*) Juice" supervised by Dr. D.M.S.S. Daundasekara, Department of Food Science and Technology, Faculty of Agriculture, University of Peradeniya. *saumalid@agri.pdn.ac.lk

නීරෝගී දිවියකට පෝෂණ ගුණයෙන් අනූන මයික්‍රොග්‍රීන්ස්



සදාරා ජයසිංහ

ශ්‍රී ලාංකිකයින් අතර තවමත් එතරම් ජනප්‍රිය ආහාරයක් නොවුණත්, මයික්‍රොග්‍රීන්ස් යනු බොහෝ රටවල ආහාරවල රසය, පෙනුම, පැහැය වැඩිදියුණු කිරීමට යොදාගන්නා පෝෂණ ගුණයෙන් පොහොසත්, ආහාරයට ගතහැකි එළවළු සහ පැළෑටිවල බීජ පැළයි. මෙම මයික්‍රොග්‍රීන්ස්වල පෝෂණ ගුණය ඒවායේ මේරූ ශාක කොටස්වලට වඩා ඉතාමත් ඉහළ අගයකින් යුක්තයි. එම නිසාම පෝෂණ ගැටලුවලින් බහුල ශ්‍රී ලාංකිකයින්ට මයික්‍රොග්‍රීන්ස් යනු අගනා විසඳුමකි. ඉතාමත් අඩු ඉඩකඩක සීමිත සම්පත් උපයෝගී කරගනිමින් කෙටි කාලයක් තුළ ගෘහාශ්‍රිතවම වගා කළ හැකි බැවින් කාර්යබහුල නාගරික ජනතාවටත් මෙය ප්‍රායෝගිකවම ක්‍රියාවට නැංවිය හැකියි.



රාබු, ගෝවා, නිවිති, තම්පලා, කැරට්, අතුගෝවා, අබ, බීට්, මුං, කවුපි, කඩල වැනි විවිධ ශාක විශේෂවලට අයත් ධාන්‍ය, එළවළු මෙන්ම ඖෂධ පැළෑටි ගණනාවක්ම මේ සඳහා යොදාගත හැකියි. මෙම බීජ වගා මාධ්‍යයක සිටුවා ලැබෙන නොමේරූ අංකුර, බීජ සිටුවා දින 7–21 අතර පමණ කාලයකදී, එනම් පළමු සත්‍ය පත්‍ර යුගළය (True leaf stage) දැකගත හැකි අවස්ථාවේදී අස්වනු නෙළාගැනීම සිදු කරයි. පිසීමකින් තොරව පරිභෝජනය කිරීම ඉතා සුදුසු වන අතර එළවළු සලාද, සුප්, සැන්ඩ්විච් වැනි ආහාරවල සැරසිලි ලෙස යොදාගැනීම අද වන විට ප්‍රචලිත වෙමින් පවතී. මයික්‍රොග්‍රීන්ස්වල අන්තර්ගත පෝෂක සංඝටක අතර විටමින් (C, E, K), ඛනිජ ලවණ (Ca, Fe), ප්‍රතිඔක්සිකාරක, පොටෑසියම්, තන්තු, කැරොටිනොයිඩ්, ෆීනෝලික් සංයෝග විශේෂ ස්ථානයක් හිමිකර ගනී. නිවිති මයික්‍රොග්‍රීන්ස්වල ඇති සුවිශේෂීතාවය වන්නේ ඒවායේ ඇති යකඩ, ෆෝලේට්, විටමින් C සහ අනෙකුත් හිතකර සංයෝගවලින් බහුල වීමයි.

ප්‍රතිශක්තීකරණ පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වයට, පරිවෘත්තීය සහ පෝෂණ අවශෝෂණය වැඩි කිරීමට, හෘද රෝග වැළැක්වීමට, නිදන්ගත රෝග වන දියවැඩියාව, පිළිකා තත්ත්ව වළක්වා ගැනීමට මයික්‍රොග්‍රීන්ස් පරිභෝජනය අතිශය උපකාරී වේ. මෙලෙස වටිනා ඖෂධීය ආහාරයක් වන මයික්‍රොග්‍රීන්ස්වල පෝෂක ගුණාංග තවදුරටත් වැඩිදියුණු කළ හැකිදැයි අධ්‍යයනය කිරීම මාගේ පර්යේෂණයේ මූලික අරමුණයි. ඒ අනුව මෙම අධ්‍යයනයේදී නිවිති මයික්‍රොග්‍රීන්ස්වල පෝෂණ ගුණාංග වැඩිදියුණු කිරීම සඳහා "Foliar application" ලෙස හැඳින්වෙන පත්‍ර මතට සෘජුව පෝෂක ද්‍රාවණ ලබාදීමේ ක්‍රමය ක්‍රියාවට නංවන ලදී. මෙහිදී "Albert's solution" ලෙස හඳුන්වන ඛනිජ පෝෂකවලින් සමන්විත දියර පොහොරක් සහ Ascorbic acid (විටමින් C) දියර ලෙස වෙන වෙනම සහ ද්‍රාවණ දෙක එකට (ද්‍රාවණ දෙක මාරුවෙන් මාරුවට) යොදන ලදී. මෙහිදී Albert's solution මිලිග්‍රෑම් 100 ක් ජලය ලීටර 1 කද, Ascorbic acid මිලිග්‍රෑම් 200 ක් ජලය ලීටර 1 කද දියකර සාදාගත් ද්‍රාවණ භාවිත කරන ලදී.



අධ්‍යයනය අවසානයේදී පෙනීගිය වැදගත් කරුණ වූයේ Albert's solution සහ Ascorbic acid එක්ව යෙදූ විට මයික්‍රොග්‍රීන්ස්වල වැදගත් පෝෂක සංඝටක කිහිපයක් සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවී ඇති බවයි. ඒ අනුව කිසිදු බාහිර පෝෂක ද්‍රාවණයක් නොයෙදූ මයික්‍රොග්‍රීන්ස්වලට සාපේක්ෂව පොස්පරස් 61% කින්ද, ප්‍රතිඔක්සිකාරක 78% කින් සහ විටමින් C 115% කින්ද වැඩි විය. මීට අමතරව කැරොටිනොයිඩ් ප්‍රමාණයේද විශාල වර්ධනයක් පෙන්නුම් කරන ලදී. කෙසේවෙතත් අස්වනු වල වියළි බරෙහි සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබුණි.

අවසාන වශයෙන් මෙම අධ්‍යයනයෙන් පෙන්වා දෙන්නේ ගෘහාශ්‍රිතව වුවද පහසුවෙන් සාදාගත හැකි මෙවැනි පෝෂක මිශ්‍රණ භාවිතය තුළින් මයික්‍රොග්‍රීන්ස්වල ඇතැම් පෝෂක ගුණාංග තවදුරටත් වැඩිදියුණු කරගැනීමේ හැකියාව පවතින බවයි. අස්වනු නෙළීමට අවම වශයෙන් දින හතරකට පමණ පෙර පෝෂක ද්‍රාවණ යෙදීම නතර කළ යුතුයි. එමගින් පෝෂක ද්‍රාවණවල අතිරික්ත මයික්‍රොග්‍රීන්ස්වල නොරැඳී ඒවායේ සෞඛ්‍යාරක්ෂිත බව වඩාත් තහවුරු කරයි. මෙවැනි ඉහළ පෝෂණ වටිනාකමකින් යුතු මයික්‍රොග්‍රීන්ස් එදිනෙදා ආහාර වේලට එකතු කරගැනීම තුළින් නීරෝගිමත් සුවදායී දිවිපෙවෙතකට ඔබටත් උරුමකම් කිව හැකියි.

This is a non-technical summary of the project report titled “Exploring the potential of nutritional quality enhancement in spinach microgreens through foliar application of Albert’s solution and ascorbic acid”. Supervised by Dr. D. M. S.B. Dissanayaka*, Department of Crop Science, Faculty of Agriculture, University of Peradeniya. *samanthad@agri.pdn.ac,lk

අක්මාව රකින රසවත් විසඳුම: LivosBEE ඖෂධීය ටොෆිය ඔබේ සෞඛ්‍යයට කොතරම් ඵලදායීද?



G.J. ජයවර්ධන

අක්මාව - ඔබේ ශරීරයේ නිහඬ වීරයා අනතුරේ!

ඔබගේ ශරීරයේ පවතින වැදගත්ම අවයව මොනවාදැයි කවුරුන් හෝ ඔබගෙන් ඇසුවොත් ඔබගේ මතකයට පළමුවෙන්ම පැමිණෙන්නේ කුමක්ද? ඒ මොළය නැතිනම් හදවතයි. නමුත් ඔබ දන්නවාද අපට තවමත් මතකයට නොනැගෙන නිහඬ වීරයෙක් මේ මොහොතේදී පවා අපගේ ශරීරයේ පැවැත්ම උදෙසා තනිවම තම සටන ගෙන යන බව? ඒ අක්මාවයි.

නමුත් අපගේ වැරදි ආහාර සහ ජීවන රටා, තරබාරු බව වැනි හේතු නිසාවෙන් අපි විසින්ම ඒ නිහඬ වීරයාව අනතුරට පත් කර තිබෙන බව ඔබ මොහොතකටවත් සිතුවාද? මෙය තවත් එක් ප්‍රබල සෞඛ්‍ය ගැටලුවක් වන්නේ බටහිර වෛද්‍ය විද්‍යාව තුළ අක්මා රෝග සඳහා දැනට කිසිදු ඖෂධයක් සොයාගෙන නොමැති වීමයි. මෙවැනි තත්ත්වයක් පවතින විටකදී ස්වාභාවික ඖෂධීය අමුද්‍රව්‍ය වලින් සකසන ලද ඖෂධීය ටොෆියක් අපගේ මෙම ගැටලුවට පිළිතුරු ලබා දෙනවා නම් කොතරම් අගනේද?

නවීන විද්‍යාව කැටි කොට ගත් පාරම්පරික විසඳුම...

සියවස් ගණනාවක් පුරාවට අපගේ මුතුන්මිත්තන් විවිධ දේශීය ඖෂධ ඔවුන්ගේ අක්මාව රැක ගැනීම උදෙසා භාවිත කරන ලදී. මේ වන විට මෙම පාරම්පරික වෛද්‍ය විද්‍යාව කැටි කොට නවීන තාක්ෂණය ඔස්සේ නිපදවූ ඖෂධීය, රසවත් අක්මා ආරක්ෂක ටොෆියක් "LivosBEE" කරලියට පැමිණ ඇත. ස්වාභාවික අමුද්‍රව්‍ය 6ක සංයෝජනයක් වන මෙම ඖෂධීය ටොෆිය, හීන් බෝවිටියා (37%), සියඹලා (16%), ගම්මිරිස් (1%), තිප්පිලි (0.5%), කුරුඳු (0.5%) සහ මී පැණි (45%) වල ප්‍රතිඔක්සිකාරක, ප්‍රතිබැක්ටීරියා සහ ප්‍රති-ප්‍රදාහක ගුණවලින් අනූනව, රසවත් සහ සෞඛ්‍යසම්පන්න ටොෆියක් ලෙස නිර්මාණය වී ඇත. නමුත් ගැටලුව වන්නේ මේ සඳහා පවතින විද්‍යාත්මක වලංගුභාවය අවම වීමයි.

එබැවින් මෙම ඖෂධීය ටොෆියේ විද්‍යාත්මක වලංගුභාවය සනාථ කිරීම උදෙසා අහඹු, ප්ලැසිබෝ-පාලිත සායනික (Randomized, Placebo-Controlled Clinical Trial) පරීක්ෂණයක් සැලසුම් කළ අතර මේ සඳහා අලව්ව ප්‍රදේශයේ අධික බර සහ තරබාරු වැඩිහිටියන් 30 දෙනෙක් (වයස අවුරුදු 20–55) තෝරා ගන්නා ලදී. ඔවුන්ව අහඹු ලෙස කණ්ඩායම් දෙකකට බෙදා ඉන් එක් කණ්ඩායමකට මෙම ඖෂධීය ටොෆිය ද අනෙක් කණ්ඩායමට පෙනුමෙන් සමාන නමුත් ඖෂධීය ගුණයක් නොමැති ටොෆියක් ද (Placebo) ලබා දෙන ලදී.

සති 8ක කාලයක් පුරාවට මෙම ටොෆි 2.5 g බැගින් දිනකට දෙවරක් ලබා දෙන ලදී. පර්යේෂණය ආරම්භ වීමට පෙර, පර්යේෂණය ආරම්භ වී සති 2කට පසු සහ සති 8කට පසු සහභාගී වූවන්ගේ රුධිර පරීක්ෂණ සිදු කරන ලදී. විශේෂයෙන්ම:

- අක්මා එන්සයිම මට්ටම් (ALT, AST, GGT, ALP) සහ බිලිරුබින් මට්ටම - අක්මා ජෛව සලකුණු කාරක
- නිරාහාර රුධිර ග්ලූකෝස් (FPG)
- ලිපිඩ පැතිකඩ (කොලෙස්ටරෝල් සහ ට්‍රයිග්ලිසරයිඩ මට්ටම්)
- ට්‍රයිග්ලිසරයිඩ-ග්ලූකෝස් දර්ශකය



අවසානයේ මෙම දත්ත විශ්ලේෂණය කිරීමේදී ඖෂධීය ටොෆිය ලබාගත් කණ්ඩායමේ පමණක් සමහර අක්මා ජෛව සලකුණු කාරකවල සැලකිය යුතු අඩුවීමක් දැක ගත හැකි විය. ඉන් ප්‍රධාන වශයෙන් අක්මාව සඳහා පමණක් විශේෂිත වන ALT එන්සයිම මට්ටමෙහි සැලකිය යුතු අඩුවීමක් දැකගත හැකි වූ අතර, AST සහ බිලිරුබින් මට්ටමෙහිද සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කළේය. මෙම අක්මා ජෛව සලකුණු කාරකවල අඩුවීම අක්මා සෛල හානිය අඩු කරන බවට සලකුණක් වන අතර, මෙහිදී අක්මා සෛල හානියේ අඩුවීම පිළිබඳව ඇඟවීමක් ලබා දෙයි. GGT සහ ALP මට්ටමෙහි සැලකිය යුතු වෙනසක් දැක ගත නොහැකි විය. සමහර විට මේවායේ සැලකිය යුතු වෙනසක් පෙන්වීමට සති 8ක් වැනි කුඩා කාලයක් ප්‍රමාණවත් නොවන අතර, මේ සඳහා දිගුකාලීන අධ්‍යයනයන්ගේ අවශ්‍යතාවය පැන නගිනු ඇත. මේ අනුව අවසානයේදී ස්වාභාවධර්මයේ දායාදයක් ලෙස කරලියට පැමිණි මෙම ඖෂධීය ටොෆිය "LivosBEE", අපගේ නිහඬ වීරයා වන අක්මාව රැක ගැනීමට මහත් පිටුවහලක් වනු ඇති බවට නිගමනයකට එළඹිය හැකිය.

වඩා හොඳ ගොඩ කරවලද? බෝට්ටු කරවලද? – ඔබේ බත් පතට එන කරවල කැබැල්ලේ සැඟවුණු ඇත්ත



ආලෝකා ප්‍රේමනාත්

බතකින් හා එක් ව්‍යාංජනයකින් පමණක් සමන්විත වූ ඉතා සරල බත් පතක් පවා රසයෙන් පරිපූර්ණ කිරීමට කුඩා කරවල කැබැල්ලකට ඇත්තේ පුදුමාකාර හැකියාවකි. කරවල වල මෙම අනන්‍ය වූ රස අභිභවා ගිය, එහි පෝෂණ ගුණය නිසාම එය කුඩා පෝෂණ බලාගාරයක් ලෙස ද හැඳින්විය හැකි ය. අඩු ආදායම් ලාභී පවුල් වල ප්‍රෝටීන අවශ්‍යතාවයෙන් 40% කටත් වඩා සම්පූර්ණ කිරීමට කරවල වලට හැකිවීම මෙයට කදිම නිදසුනකි.

නමුත් මෙලෙස අපව පෝෂණය කරමින් රස නහර පින වූ ඒ කරවල කැබැල්ල බත් පතට පැමිණෙන ගමන් මග නම් එතරම් ප්‍රියජනක නොවේ. ඒ අප එදිනෙදා වෙළඳ පොලෙන් මිල දී ගන්නා, මුහුදු වෙරළ මත වියලන ලද කරවල, එනම් ගොඩ කරවල වල සෞඛ්‍යාරක්ෂිත බව හා ගුණාත්මක බව දැඩි ලෙස අභියෝගයට ලක්වෙන නිසා වෙනි.

මාළු අස්වැන්නෙන්, තැලුණු සහ ඇතැම් විට මධ්‍යස්ථ වශයෙන් නරක් වූ මාළු (සෘජුවම නැවුම් මාළු ලෙස විකිණිය නොහැකි මාළු) ගොඩ කරවල සෑදීමට යොදා ගන්නා ප්‍රධාන අමුද්‍රව්‍යය වේ. ආරම්භයේදීම ඉතා අඩු ප්‍රමිතියකින් යුක්ත වීම නිසා, තවදුරටත් මෙම මාළු නරක් වීම වළක්වා ගැනීමට, වියළීමේ දී යොදන ලුණු ප්‍රමාණය ද අධික වේ. එලෙස ලුණු දැමූ මාළු ඉන් පසු වෙරළ මත එළන ගෝනි, පැදුරු හෝ ලී රාක්ක මත අසුරා වියළනු ලැබේ. විටින් විට වැටෙන වර්ෂාවෙන් හා දුවිලි වලිනුත්, කපුටන් වැනි පක්ෂීන්ගේ මල අපද්‍රව්‍ය වලිනුත්, සුනඛයින්ගේ ලොම් වලිනුත් මෙම කරවල නිරන්තරයෙන් අපවිත්‍ර වේ. කරවල වලින් නැගෙන පිළී ගඳට ආකර්ෂණ වන මැස්සන් විටෙක කරවල මතත්, තවත් විටෙක අසබඩ ඇති මීයෙකුගේ මළකුණ මතත් මාරුවෙන් මාරුවට වසයි. වචනයෙන් ඔබ්බට ගිය අනතුරක් මෙම කරවල තුල සැඟව ඇත්තේ මෙලෙසිනි.



නමුත් ඔබ දන්නවාද, ඔබේ කරවල පිළිබඳ ඇති රුචිකත්වය සංසිඳුවීමට, වඩාත් සෞඛ්‍යාරක්ෂිත විසඳුමක් ඇති බව?

ඒ බෝට්ටු කරවල යි. බහුදින ධීවර යාත්‍රාවල පළමු මාළු අස්වැන්න ලබාගත් විගස, ඉතා නැවුම් මාළු ලුණු දමා යාත්‍රාව මතම වියළීම මෙහි දී සිදු වේ. මේ නිසා ම සතුන්ගෙන්ද, රෝග වාහක මැස්සන්ගෙන්ද, දුවිලි වලින්ද මෙම කරවල ආරක්ෂා වේ. මෙම බෝට්ටු කරවල, වඩාත් සෞඛ්‍යාරක්ෂිත ආහාරයක් ලෙස ප්‍රකට වුවත්, බෝට්ටු කරවල හා ගොඩ කරවල අතර විදිමත් සංසන්දනාත්මක, විද්‍යාත්මක පර්යේෂණ දත්ත නොමැති තරම් ය. එබැවින් ඒ සඳහා ආරම්භක පියවරක් ලෙස මෙම අධ්‍යනය සිදු කෙරිණි.

එහිදී දිස්ත්‍රික්ක 4 කින්, වියළීමේ ක්‍රමවේද දෙකම නියෝජනය වන පරිදි ලබාගත්, බලයා සහ කට්ටා කරවල සාම්පල 32 ක්, ඒවායේ සෞඛ්‍යාරක්ෂිත බව හා ප්‍රමිතිය හා සම්බන්ධ රසායනාගාර පරීක්ෂණයන් ගණනාවකට භාජනය වුණි.

එම රසායනාගාර පර්යේෂණ ප්‍රතිඵල වලට අනුව, ගොඩ කරවල වල තෙතමනය, ලුණු අන්තර්ගතය, ක්ෂුද්‍රජීවී ඝනත්වය, බැරලෝහ අන්තර්ගතය, පිළිකාකාරක ඇෆ්ලටොක්සින්, සහ ආසාත්මිකතා වලට හේතු වන හිස්ටැමීන් අන්තර්ගතය බෝට්ටු කරවල වලට වඩා සැලකිය යුතු ඉහළ මට්ටමක පැවතුන අතර, ඇතැම් අගයන් කරවල හා සම්බන්ද රෙගුලාසි වල සඳහන් වන උපරිම දේහලීය අගයන් පවා ඉක්මවා ගොස් තිබුණි. මෙහි ඇති බරපතළම කරුණ වන්නේ, මෙම සංයෝග අහිතකර මට්ටමින් දෛනික ව ශරීරගත වීම හරහා මහජන සෞඛ්‍යය අනතුරේ හෙලන නොයෙකුත් කෙටි කාලීන මෙන් ම දීර්ඝකාලීන රෝගාබාධ රැසක් ඇති වීමේ අවධානම පැවතීමයි. අධික ලුණු භාවිතය හේතුවෙන් හෘද සෞඛ්‍යය හානි වීම, බැර ලෝහ හා ඇෆ්ලටොක්සින් හේතුවෙන් අක්මා පිළිකා වැනි තත්ත්වයන් සහ හිස්ටැමින් ශරීරගත වීම නිසා ආසාත්මිකතා ඇති වීම නිදසුන් ලෙස දැක්විය හැකිය.

නමුත් ගොඩ කරවල වල ප්‍රතිඵල වලට ප්‍රතිවිරුද්ධව යමින්, බෝට්ටු කරවල වල ඉහත සඳහන් කළ පරාමිතීන් සැළකිය යුතු ලෙස පහල අගයන් සහිත ව ආරක්ෂිත පරාසයන් තුළ පැවතුණි. ප්‍රමාණවත් පරිදි වියළීම නිසා අඩු තෙතමනයකින්ද, නැවුම් මාළු භාවිත කිරීම නිසා වඩා සමබර ලුණු අන්තගයකින් ද, අපද්‍රව්‍ය අඩු පරිසරයක් තුළදී වියළීම නිසා අඩු ක්ෂුද්‍රජීවී ඝනත්වයකින්ද, එහි ද්විතීයික ප්‍රතිඵලයක් ලෙස පිළිකාකාරක ඇෆ්ලටොක්සින් සහ ආසාත්මිකතා වලට හේතු වන හිස්ටැමීන් ජනනය වීම අවම වීමද, මෙම බෝට්ටු කරවල හා සම්බන්ද වැදගත් තොරතුරු වේ. මේ අනුව බෝට්ටු කරවල යනු ගොඩ කරවල වෙනුවට ගත හැකි වඩාත් සෞඛ්‍යාරක්ෂිත හා ගුණාත්මක විසඳුමක් ලෙස හැඳින් විය හැක.

වාර්ෂික ඒක පුද්ගල කරවල පරිභෝජනය 3.5 kg ඉක්මවූ රටක, කරවල හා සම්බන්ධයෙන් සොයාගත් මෙම නව දැනුම වියැකී යාමට නොදී, පාරිභෝගිකයන් අතර විමධ්‍යගත කිරීමත්, එම දත්ත පාදක කරගෙන නව නීති හා රෙගුලාසි සම්පාදනය කිරීම හා බලාත්මක කිරීමත්, මහජන සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් ගතහැකි අත්‍යාවශ්‍ය පියවරයන් ලෙස, අවසාන වශයෙන් දැඩිව අවධාරණය කළ යුතුය.



ලොව සුපතළ අමෘතයට විදු ඇසින් අත්වැලක්



පැතුම් සංජීව

විඩාබර දවසක අවසානයේ, ගතත් සිතත් ප්‍රබෝධයෙන් පුරවාලන්නට උණුසුම් තේ කෝප්පයකට ඇති හැකියාව අන් කිසිවකට සමකළ නොහැකි බව ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපි හොඳින් ම දනිමු. එහි රස අන් කිසිදු පානයකට තවමත් අනුකරණය කළ නොහැක්කේ ශ්‍රී ලාංකීය තේ වලට ම අනන්‍ය වූ අග්‍රගණ්‍ය රස සංකලනය නිසාවෙන්ම ය. වර්තමානය වන විට, ලෝකයේ වැඩිම මිලකට අලෙවි වූ තේ සන්නාමය ලෙස ගිනස් වාර්තා පොතට පවා ඇතුළත් වීමේ හැකියාව ලැබීම ද මෙයට කදිම නිදසුනකි.



මෙම අද්විතීය රසයට හේතු වන ප්‍රධානතම සාධක අතුරින් ඉතාම වැදගත් සාධකය වන්නේ තේ වර්ගීකරණයේදී භාවිත වන "tea grade" හෙවත් තේ ශ්‍රේණිය යි. PEK, BOP, BOPF, Dust වැනි නම් ගණනාවකින් යුත් තේ ශ්‍රේණි මාලාවක් ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කෙරෙන අතර, මෙම එක් එක් ශ්‍රේණියට විශිෂ්ට වූ වර්ණයන්, රසයන් හා රසායනික සංයුතීන් පවතී. නමුත් ඔබ දන්නවාද, ලොවක් ඉදිරියේ අද්විතීය නිෂ්පාදනයක් ලෙස සුප්‍රකට ශ්‍රී ලාංකීය තේ තවමත් වර්ගීකරණය කෙරෙන්නේ, ඉතා පැරණි, වැඩි වශයෙන් කාලය වැයවන, නිරවද්‍යතාව අඩු භෞතික හා සංවේදන ක්‍රමවේද වලට අනුව බව?

සිතන්න, ගෝලීය වශයෙන් ඇතිවන තාක්ෂණික දියුණුවත්, අධික වෙළඳපල තරහකාරීත්වයත් සමඟ කරට කර ගැටෙන්නට නම් අපි තවදුරටත් මෙම යල් පැනගිය ක්‍රමවේද මත රැඳී සිටීමට හැකි ද? මෙම ගැටලුවට පිළිතුරු සැපයීම අරමුණු කරගෙන තේ ශ්‍රේණි වර්ගීකරණය වෙනුවෙන් වඩාත් නිරවද්‍ය, ඉක්මන් හා තාක්ෂණික වශයෙන් නවීන විසඳුමක් සෙවීමට මෙම පර්යේෂණය දියත් කෙරිණි.

ඒ අනුව, පළමුව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම තේ වගා කෙරෙන කලාප හෙවත් කෘෂි - දේශගුණික කලාප සියල්ල නියෝජනය වන පරිදි, BOP, BOPF හා Dust 1 යන ශ්‍රේණි වලට අදාළ තේ සාම්පල 1050ක් එකතු කරන ලදී. ඉන් පසු එම තේ සාම්පල වල රසායනික සංයුතිය NIR Analyser නම් උපකරණය භාවිතයෙන් විශ්ලේෂණය කර එම දත්ත භාවිතයෙන්, කෘතිම බුද්ධිය මත පදනම් වූ මොඩලයන් (AI Models) දෙකක් නිර්මාණය කරන ලදී. මෙම මොඩලයන් අතරින් එක් මොඩලයක් තේ සාම්පල වල රසායනික සංයුතිය ඇසුරින්, ඒවා අයත් වෙන ශ්‍රේණියත්, අනික් මොඩලය මගින් තේ සාම්පල වලට අදාළ කෘෂි - දේශගුණික කලාපයත් හඳුනා ගැනීමට හැකි වන පරිදි නිර්මාණය කර තිබේ.

ඉන් පසු මෙම මොඩලයන් ක්ෂේත්‍ර මට්ටමින් භාවිත කළ හැකි වන අයුරින් ජංගම යෙදුමක් (Mobile application) තුළ ඒකාබද්ධ කරන ලදී. එමගින් තේ ආශ්‍රිත ව්‍යාපාරිකයින්ටත්, තත්ත්ව පරීක්ෂකයින්ටත්, වඩා නිරවද්‍යව, කාර්යක්ෂමව හා වඩා පහසුවෙන්, තේ ශ්‍රේණියත්, අදාළ කෘෂි - දේශගුණික කලාපයත් හඳුනාගත හැක.



ශ්‍රී ලංකා තේ කර්මාන්තය සඳහා නවීන, කාර්යක්ෂම හා දත්ත මත පදනම් වූ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමට තැබූ මූලික පියවරක් ලෙස ආරම්භ කළ මෙම පර්යේෂණය, දශක ගණනාවක් පුරාවට අනුගමනය කරමින් තිබූ, යල් පැන ගිය, ඒකාකාරී ගමන් මඟ නවමු මානයකට රැගෙන යන බව නම් නොඅනුමානය.

නැවුම් සාරවත් සලාද අස්වැන්නකට - සාර්ථක පිළියමක් !



යහනි ලංකාතිලක

ලෝක ජනගහනයේ සීඝ්‍ර වර්ධනයත් සමග ආහාර සුරක්ෂිතතාව පිළිබඳ විවිධාකාර ගැටලු රාශියක් පැන නැඟී ඇත. වගා ඉඩම් හායනය, පස නිසරු වීම, පරිසර දූෂණය ආදී සාධක හේතුවෙන් සාම්ප්‍රදායික බෝග වගාවේ අස්වනු වල ගුණාත්මක බව හා ප්‍රමාණාත්මක බව අඩු වීම ආදිය සිදුවෙමින් පවතියි. මේ හේතුවෙන් පස වෙනුවට විකල්ප වගා මාධ්‍යයන් යොදාගන්නා නිර්පාංශු වගාව නොහොත් ජලරෝපිත වගාව (Soil-less Culture / Hydroponics) වර්තමානයේ නවීන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විශාල පියවරක් අත්පත් කරගෙන ඇත.

මේ අයුරින් සිදු කරන වගාවන් අතර සලාද බෝග වගාව බහුල වශයෙන් දක්නට ලැබෙයි. ආහාර වේලක ගුණාත්මක භාවය, රසය මෙන්ම පෙනුම ඉස්මතු කරවන නොපිසූ ආහාරයක් ලෙස, නැවුම්ව ආහාරයට ගත හැකි මෙම බෝගයට දේශීයව මෙන්ම විදේශීයව ද අධික ඉල්ලුමක් ඇත. කෙටිකාලීන බෝගයක් වීම නිසාත්, වගා පහසුව හා වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුම නිසාත් සලාද බෝගය වැඩි වශයෙන් වගාවන් සඳහා යොදා ගැනීමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙයි. මහා පරිමාණයේ වාණිජමය සලාද බෝග වගාව බොහෝ විට ජලරෝපිත වගාව ආශ්‍රයෙන් සිදු කරනු ලබන අතර, මේ සඳහා ගැඹුරු පෝෂක ධාරා තාක්ෂණය යටතේ පාවෙන ස්ථරයක වගා කිරීමේ ක්‍රමවේදය (Deep Floating Technique) සුලභව භාවිත වේ.

මෙම ක්‍රමය යටතේ සිදු කරන සලාද බෝග වගාව තුළ සිදුවන කායික අසාමාන්‍යතාවක් ලෙස බෝග මැලවීම නිරන්තරයෙන් වාර්තා වේ. විශේෂයෙන් හරිතාගාර තත්ත්ව යටතේදී උෂ්ණත්වය, ආර්ද්‍රතාව හා ආලෝකය ආදී ක්ෂුද්‍ර පාරිසරික තත්ත්ව මෙන්ම ආම්ලික-භාස්මිකතාව හා විද්‍යුත් සන්නායකතාව ඇතුළු පෝෂක ද්‍රාවණයේ ප්‍රධාන සාධකද ප්‍රශස්ත ලෙස පාලනය වුවද, පෝෂක ද්‍රාවණය තුළ ඇති වෙනත් බලපෑමක් මත මෙම මැලවීම ඇති විය හැකි බව නිරීක්ෂණය කළ හැකිය. මෙම ගැටලුව සඳහා සුදුසු ප්‍රතිකර්මයක් පර්යේෂණාත්මකව සොයාබැලීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.

පාවෙන ස්ථර මත සිදු කරන ගැඹුරු පෝෂක ධාරා තාක්ෂණයේදී (Deep Floating Technique) එකම ජල ධාරිතාවක් වගාවාර කිහිපයකදී භාවිත කිරීම වාණිජ මට්ටමේදී ඉතා සුලභ වන අතර, එහිදී ජල ස්ථරය තුළ ඇතිවන අහිතකර තත්ත්වයන් මත මෙම මැලවීම ඇති විය හැකි බවට නිගමනය කළ හැකිය. මෙම තත්ත්වය යාමනය කිරීම සඳහා හිතකර පාංශු ක්ෂුද්‍රජීවී විශේෂයක් වන *Trichoderma harzianum* හා හයිඩ්‍රොජන් පෙරොක්සයිඩ් (H_2O_2) රසායනිකය යොදාගෙන එය සලාද වර්ග ද්විත්වයක් යටතේ අත්හදා බලන ලදී. මෙහිදී හිතකර පාංශු ක්ෂුද්‍රජීවීන් ශාක මූලයන් කේන්ද්‍ර කර ගනිමින් වර්ධනය වී නිපදවන එන්සයිම එකී මූල මණ්ඩලයේ හා ශාකයේ ප්‍රශස්ත වර්ධනයට උපකාරී වූ අතර, (H_2O_2) මගින් මූල කලාපය ආසන්නයේ අහිතකර ක්ෂුද්‍රජීවී ගහනය පාලනය සිදු කර, එමගින් ශාක සෞඛ්‍යය හා වර්ධනය තහවුරු කළ බව නිරීක්ෂණය විය.

මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය තුළින් සලාද බෝග ආශ්‍රිතව ඇතිවන මැලවීමේ තත්ත්වයන් පාලනය කිරීම සඳහා මූල කලාපය අවට පරිසරය හිතකර අන්දමින් පවත්වා ගැනීමට පිළියමක් ලෙස ඉහත ප්‍රතිකාර යොදාගත හැකි බව පෙන්වා දෙයි. H_2O_2 වැනි රසායනික ද්‍රව්‍ය ජලය සමග යෙදීමේදී ප්‍රශස්ත සාන්ද්‍රණයන් පවත්වා ගැනීම වැදගත් වන අතර, එය ඉක්මවා යාම තුළින් බෝග මූල කලාපයට අහිතකර බලපෑම් ඇතිවිය හැක.

සාරවත්, ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ සලාද වගාවක් සඳහා පහසු හා ඉක්මන් රෝග පාලන ක්‍රමවේදයක් ලෙස මෙම ප්‍රතිකාර ඉදිරියේදී හඳුන්වා දිය හැක.









තේ දළුලන පස නොමරා වල් පාලනය කරමුද?



S.H.G.D.M.M. විමලරත්න




ශ්‍රී ලාංකීය තේ" යැයි කියූ පමණින් සුවහසක් දේශීය ජනයා සාඩම්බරයටත්, විදේශීය ජනයා ආනන්දයටත් පත් වේ. අද වන විට ලොව සිව්වන විශාලතම නිෂ්පාදකයා ලෙසත්, තෙවන විශාලතම අපනයනකරුවා ලෙසත් සිය ස්ථානය තහවුරු කරමින් රටේ ආර්ථිකයේ විශාල සන්ධිස්ථානයක් තේ වගාව මත රඳා පවතී. දිනපතා වැඩිවන ඉල්ලුම, රටේ ආර්ථිකයේ සුභ ලකුණු පසක් කරද්දී, තේ නිෂ්පාදනයේ වර්ධන වේගයත්, දළු අස්වැන්නත් 2013 වසරේ සිටම අඛණ්ඩ බැස්මකට ගොදුරු වන බවක් තහවුරු වෙමින් පවතී. එයට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස තේ වගාවේ පස නිසරු වීම හඳුනාගෙන ඇත.

ආර්ථිකය යළි නගා සිටුවීමට තේ වගාවෙන් විශාල පන්නරයක් ලද හැකි බව පසක් වෙද්දීත්, නොසිතා, නොදැනුවත්ව කරන ඇතැම් කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හේතුවෙන් වගාකරුවා අතින්ම වගාවේ ඵලදායිතාවය විනාශ විය හැකිය. පමණ ඉක්මවා නිර්දේශිතයන්ගෙන් බැහැරව වල්නාශක භාවිතය තේ වගාවට සිදුවන මෙවන් එක් විනාශයකි. මෙහිදී තේ වගාකරුවා විශාල වශයෙන් තේ වගාවේ වල් මර්දනය සිදු කරනුයේ "ග්ලයිෆොසේට්" (Glyphosate) හෙවත් "රවුන්ඩප්" (Roundup) වල්නාශකය භාවිතයෙනි.

මධ්‍යම කඳුකරයේ ගිරාගම සහ කිරිමැටිය ප්‍රදේශවල මහා පරිමාණ තේ වගාවක් ආශ්‍රිතව, මාස දෙකක් පුරාවට ක්ෂේත්‍ර පරීක්ෂණයක් ඔස්සේ, විවිධ ප්‍රමාණයන්ගෙන් ග්ලයිෆොසේට් යෙදූ පසෙහි සති දෙකෙන් දෙකට ලබාගත් පස් සාම්පලවල සරුසාර බවත්, තත්ත්ව පරීක්ෂාවත්, විද්‍යාගාර මට්ටමින් සිදු කෙරිණි. මේ සඳහා නිර්ණායක ලෙස, තෝරාගත් භෞතික, රසායනික සහ ජීව විද්‍යාත්මක පාංශු සාධක පරීක්ෂාවට ලක් කෙරිණි.

පරීක්ෂණවලින් තහවුරු වූයේ මෙම වල්නාශකය පමණ ඉක්මවා භාවිතය පසේ ජීව විද්‍යාත්මක ගුණයට ඍණාත්මක ලෙස බලපාන බවයි. එනම් පාංශු ජීවීන්ට ඇතිවන කෙටිකාලීන ආතතිය පසේ සරුසාර බවට ඍණාත්මක ලෙස මහත් බලපෑමක් ඇති කරන බවයි. තවදුරටත් මෙම කෙටි කාලීන බලපෑම දිගු කාලීන ලෙස අනෙකුත් භෞතික, රසායනික පාංශු සාධකවලට බලපෑම් ඇතිකර, පසේ සාරවත් බව අඩාල කරනු ඇතැයි තහවුරු වී ඇත.



පසේ ග්ලයිෆොසේට් ප්‍රමාණය මත පාංශු ශ්වසනයේ වෙනස්වීම

පසේ ජීවත් වන ක්ෂුද්‍ර ජීවීන්ගේ පරිවෘත්තීය ක්‍රියා හේතුවෙන් පිටවන කාබන්ඩයොක්සයිඩ් (CO_2) වායුව පාංශු ශ්වසනය ලෙස සැලකේ. වැඩි ග්ලයිෆොසේට් ප්‍රමාණයක් යෙදූ පසෙහි ශ්වසනය අඩු අගයක් පෙන්වීම මගින් ක්ෂුද්‍ර ජීවීන්ගේ පරිවෘත්තීය ක්‍රියා අඩාල වීම පෙන්වයි. ග්ලයිෆොසේට් යෙදවුම් වාර ගණන වෙනස් කිරීම මගින් පසට එක්වූ ග්ලයිෆොසේට් ප්‍රමාණය වෙනස් කර ප්‍රතිකාරක තුන සකසාගෙන ඇත.

සරු පසක් යනු තේ වගාවේ පදනමයි. ඇසට පෙනෙන විශාල හානීන් තිබියදීත්, නොවිමසිලිමත් ලෙස රසායන ද්‍රව්‍ය භාවිතා කර අපිම තේ වගාවත්, එයින් ගොඩනැගෙන ආර්ථිකයත් බිඳ නොදැමිය යුතුය. පස සරු කිරීමට, පසේ කාබනික ද්‍රව්‍ය වැඩි කරන විකල්ප ක්‍රම පිළිබඳවත්, පසට සිදුවන හානිය අවම කිරීමට නිර්දේශිත ප්‍රමාණයෙන් කෘෂි යෙදවුම් භාවිතය සහ පසට හානි නොවන වල් මර්දන ක්‍රම ගැනත් සුවහසක් තේ වගාකරුවනි, ඔබේ අවධානය යොමු කළ යුතුමය!

This is a non-technical summary of the project report titled "Impact of glyphosate residues and metabolites on soil fertility" supervised by Prof. R.S. Dharmakeerthi, Department of Soil Science, Faculty of Agriculture, University of Peradeniya.*
**dharmakeerthirs@agri.pdn.ac.lk*

කොකෝවා බීජ වල භෞතික හා රසායනික ගුණ හඳුනා ගනිමින් උසස් තත්වයේ ආහාර පාන නිෂ්පාදනය කරමු.



එච්. එම්. ඉසුරි ජයදිනී

දකුණු ඇමරිකාව නිජබිම කරගත් කොකෝවා ශාකය 1770 දී ලන්දේසීන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබුවේ කෝපි කර්මාන්තය බිඳ වැටීමෙන් පසුවය. ප්‍රධාන වශයෙන් කොකෝවා වර්ග තුනකි. ඒවා නම් "ක්‍රයලෝ", "ෆොරස්ටෙරෝ" සහ "ට්‍රිනිටාරියෝ" වේ. මේ කොකෝවා වර්ග කිරීම බීජයේ පියලි දෙකෙහි පැහැය අනුව සිදු කරයි. "ක්‍රයලෝ" බීජ වල පැහැය දුඹුරු වන අතර "ෆොරස්ටෙරෝ" තද දම් පැහැයක් ගනී. "ට්‍රිනිටාරියෝහි" පැහැය දුඹුරු සහ තද දම් අතර පැහැයක් වේ. කොකෝවා බීජ වල ගුණ එහි ජානමය සාධක, වගාක්‍රම, පරිසර තත්ව, හා පසු අස්වනු සැකසීමේ ක්‍රම නිසා වෙනස් වන බව සොයාගෙන ඇත. සාමාන්‍යයෙන් අමු කොකෝවා බීජ තික්ත හා කහට රසයකින් යුක්ත වන අතර පසු අස්වනු සැකසීමෙන් පසුව එය වඩාත් රසවත් නිෂ්පාදනයක් සෑදීමට අවශ්‍ය තත්වයන්ට සකසා ගනු ලබයි. එබැවින් මෙම පර්යේෂණ අධ්‍යයනය බීජ පසු අස්වනු සැකසීමේ ක්‍රියාවලියෙන් පසුව සිදු කරනු ලැබීය.

වගා ක්‍රම හා පාරිසරික තත්ත්වයන් නියතව පවත්වා ගැනීම සඳහා කුණ්ඩසාලේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් උපපර්යේෂණ ආයතනයේ වගා කර ඇති කොකෝවා ප්‍රවේණි දාහතරක් භාවිතා කරනු ලැබීය. මෙම පර්යේෂණ අධ්‍යයනයේ අරමුණ ලෙස මහනුවර ප්‍රදේශයේ වගා කරන ලද තෝරා ගත් කොකෝවා ප්‍රවේණි දාහතරෙහි භෞතික හා රසායනික ගුණාංග කෙරෙහි අවධානය යොමු කරමින්, උසස් භෞතික හා රසායනික ගුණ ඇති ප්‍රවේණි වර්ග හඳුනා ගැනීම සිදු කරන ලදි.



රූපය 1: තෝරාගත් කොකෝවා ප්‍රවේණි වර්ග සමහරක්

භෞතික හා රසායනික ලක්ෂණ ලෙස සලකන්නේ කුමක්ද?

භෞතික ලක්ෂණ ලෙස කොකෝවා බීජවල දිග, පළල, උස සහ වර්ණාණය යන සාධක බීජ සැකසීමට පෙර සහ පසු අස්වනු සැකසීමේ එක් එක් පියවර වලදී, එනම් පැසවීම, වියළීම හා බැඳීම යන අවස්ථාවලදී විශ්ලේෂණය කරනු ලැබීය. රසායනික සංයුතිය පසු අස්වනු සැකසීමට පසු එනම් බැඳීමේ ක්‍රියාවලියෙන් අනතුරුව සිදු කරනු ලැබීය. මෙහිදී තෙතමනය, ඛනිජ ප්‍රමාණය, මේද, ප්‍රෝටීන හා සීනි අන්තර්ගතය ප්‍රතිශතයක් ලෙස ගණනය කරන ලදි. මීට අමතරව ප්‍රතිඔක්සිකාරක ගුණය සඳහා බලපාන ෆිනෝල සහ ෆ්ලේවනොයිඩ අන්තර්ගතය ද විශ්ලේෂණය කරනු ලැබීය. බීජ වල දිග, පළල, උස යන මිනුම් භාවිතා කර බීජ වල පරිමාව, පෘෂ්ඨීක වර්ගඵලය ගණනය කරනු ලැබීය.

භෞතික හා රසායනික ලක්ෂණ වල වෙනස්කම් මොනවාද?

බීජ වල පරිමාව හා පෘෂ්ඨීක වර්ගඵලය පසු අස්වනු සැකසීමේ ක්‍රියාවලියේදී ක්‍රමයෙන් අඩුවන බවත් පරිමාව වැඩිම බීජය ප්‍රවේණි වර්ග 4 හි ඇති බවත් බීජ පරිමාව අඩුම ප්‍රවේණි වර්ගය 7 බවත් තහවුරු විය. බීජ වර්ණය සැලකීමේ දී බැඳීමේ ක්‍රියාවෙන් පසුව එහි පැහැය වඩාත් අඳුරු වන බවත්, බීජ වල රතු පැහැය හා කහ පැහැයේ වැඩිවීමක් ද පෙන්නුම් කරයි.




රූපය 2: ප්‍රවේණි වර්ග 4



රූපය 3: ප්‍රවේණි වර්ග 7

තවද බීජ සැකසීමේ ක්‍රියාවලියෙන් පසුව සමස්තයක් වශයෙන් තෙතමන ප්‍රමාණය හා ඛනිජ ප්‍රමාණයේ පැහැදිලි වෙනසක් ප්‍රවේණි වර්ග අතර දක්නට නොමැති අතර මේද, ප්‍රෝටීන, සීනි සහ ෆිනෝල හා ෆ්ලේවනොයිඩ විශේෂ වෙනස්කම් පෙන්වා ඇත. විශේෂයෙන්ම ප්‍රවේණි 5, 12 සහ 14 හි මේද ප්‍රමාණය ඉතා විශාල වූ අතර ඒ සමගම ෆිනෝල හා ෆ්ලේවනොයිඩ අගයන්ද වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. මෙමගින් පෙන්වන්නේ ඉහළ මේද ප්‍රමාණයක් ඇති බීජ වල ප්‍රතිඔක්සිකාරක සංයෝග වැඩි බවයි. සීනි ප්‍රමාණය සාපේක්ෂව අඩු අගයන් පෙන්නුම් කළ අතර මෙය බැඳීමේ ක්‍රියාවලියේදී රස හා වර්ණය සඳහා බලපාන මයිලාර්ඩ් (Maillard) ප්‍රතික්‍රියාවට සහභාගි වූ බව පෙන්නුම් කළ හැකිය.

සමස්තයක් ලෙස ප්‍රවේණි වර්ග 9, 12 සහ 14 ෆිනෝල හා ෆ්ලේවනොයිඩ සහ මේද අන්තර්ගතය ඉතා ඉහළ වන බවත් ඒවායේ ප්‍රතිඔක්සිකාරක ප්‍රමාණය, ගුණ සහ රස තත්වයන් උසස් කළ හැකි ප්‍රවේණි ලෙසට හඳුනා ගැනීමට හැකි විය. එමෙන්ම ප්‍රවේණි වර්ග 5 සහ 7 අඩු ෆිනෝල හා ෆ්ලේවනොයිඩ අගයන් දැක්වූ අතර ඒවායේ මූලික රසායනික ගුණ අඩු ප්‍රවේණි වර්ග බව හඳුනා ගන්නට ලැබුණි.



රූපය 4: ප්‍රවේණි වර්ගය සමඟ රසායනික සංයුතියේ වෙනස් වීම

ඒ අනුව මෙම අධ්‍යයනයෙන් පැහැදිලිව පෙනෙන්නේ කොකෝවා බීජ වල භෞතික සහ රසායනික ගුණ ප්‍රවේණි අතර එකිනෙකට වෙනස් බවත් මෙවැනි වෙනස්කම් සහිත ප්‍රවේණි නිවැරදිව තෝරා ගැනීම මඟින් උසස් ගුණාත්මක භාවයකින් යුතු ආහාර වර්ග නිපදවීමේ හැකියාවක් පවතින බවත්ය.

නිවිති ක්ෂුද්‍ර පැළ (මයික්‍රොග්‍රීන්ස්) සඳහා වඩාත් යෝග්‍ය මාධ්‍යයක්



සවීනා පවනි සපුමොහොට්ටි



- සෞඛ්‍ය සම්පන්න ජීවිතයක්.
- නැවුම් ආහාරයක්.
- පරිසර හිතකාමියෙක්.

මොනවාද මේ ක්ෂුද්‍ර පැළ හෙවත් මයික්‍රොග්‍රීන්ස්?

ආහාරයට ගත හැකි කුඩා පැළ: බීජ පැළ කිරීමෙන් පසු සතියකින්, දෙකකින් හෝ තුනකින් මාධ්‍යයට ඉහළ පැළෑටි කොටස කපා ආහාරයට ගැනීම සිදු කළ හැකිය.

ප්‍රධාන වශයෙන් මේවා සලාද, සැන්ඩ්විච්, ඔම්ලට්, ව්‍යාංජන, සුප් සහ ආහාර අලංකරණය සඳහා යොදා ගැනීම සිදු කරනු ලබයි.




මයික්‍රොග්‍රීන්ස් වගා කිරීමේදී භාවිතයට ගන්නා මාධ්‍ය අනුව එහි පෝෂ්‍යදායී බව බොහෝ වශයෙන් අඩු වැඩි වීම සිදු වේ. එම නිසා මේවා වගා කිරීමට යොදා ගන්නේ කුමන මාධ්‍යයක් ද යන්න ගැටලුවකි.

මෙම පර්යේෂණයෙන් දැනුවත් කරන්නේ, නිවිති ක්ෂුද්‍ර පැළ සඳහා කොම්පෝස්ට්, ගැඩවිලි පොහොර, කොහුබත් සහ ඒවායේ 1:1 පරිමා අනුපාතයන්ගේ මිශ්‍රණයන් අතරින් වඩාත් යෝග්‍ය මාධ්‍ය තෝරා ගැනීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස පෙන්වා දෙන්නේ: **ගැඩවිලි පොහොර සහ කොහුබත් මිශ්‍ර මාධ්‍යයෙහි වගා කළ නිවිති මයික්‍රොග්‍රීන්ස් මගින්:**

- වැඩි පෝෂක අගයක් (විටමින් සහ ඛනිජ)
- වඩාත් හොඳ අස්වැන්නක්
- රසායන රහිත, පරිසර හිතකාමී ආහාරයක්

ලබා ගත හැකි බවයි.



ඇයි මයික්‍රොග්‍රීන්ස් වැදගත්?

- ශක්තිය සහ ප්‍රතිශක්තිකරණය වැඩි කරයි
- ආහාරයට නැවුම් රසය සහ පෝෂණය එකතු කරයි
- නිවසේදීම කුඩා ඉඩක් තිබුණත් වගා කළ හැකිය
- සිරුරේ බර, කොලෙස්ටරෝල් අඩු කරන, පිළිකා සෛල නසන ආහාරයෙකි

ඔබේම ක්ෂුද්‍ර හරිතයන් වගා කිරීම අදහසකට වඩා වැඩි දෙයකි - එය සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් සහ හරිත ග්‍රහලෝකයක් කරා යන පියවරකි. කුඩා ඉඩක් සහ සැලකිල්ලක් ඇතිව, ඕනෑම කෙනෙකුට නිවසේදීම නැවුම්, පෝෂ්‍යදායී ආහාරයක් නිපදවිය හැකිය. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ තිරසාර තේරීම් අපගේ දෛනික ජීවිතයේ කොටසක් බවට පත් කර ගනිමු.



බිඟු ලොව දිවි තතු




P.A.D.M. මිහිසරණි

විද්‍යාත්මකව *Apis cerana* නාමයෙන් හඳුන්වනු ලබන ආසියාතික මී මැස්සා ශ්‍රී ලංකාව ඇතුළු ආසියාතික රටවල හමුවේ. පරාගකාරකයෙකු ලෙස පරිසරයට මෙන්ම කෘෂි බෝගවල ඵල හටගැනීමට ද, මීපැණි, මී ඉටි ඇතුළු නිෂ්පාදන ලබා දෙමින් බිඟු පාලනය කරන ගොවීන්ගේ ආර්ථිකය සවිමත් කිරීමට ද මී මැස්සන් ඉමහත් දායකත්වයක් දක්වයි. යුරෝපීය රටවල බහුලව වෙසෙන *Apis mellifera* හෙවත් යුරෝපීය මී මැස්සන් පිළිබඳව ඉතා පුළුල් අයුරින් අධ්‍යයනය කර ඇති අතර ඔවුන්ගේ ජීවන චක්‍රය සහ එක් එක් වර්ධන අවධි පිළිබඳව මැනවින් විග්‍රහ කර ඇත.

නමුත් ආසියාතික මී මැස්සා ගැන සිදුකර ඇති විද්‍යාත්මක අධ්‍යයන සංඛ්‍යාව ඉතාමත් සීමිත ප්‍රමාණයකි. ඒ අතරින් ද ශ්‍රී ලංකාව තුළ සිදු කරන ලද මී මැස්සාගේ ජීවන චක්‍රය පිළිබඳ පළවුණු අධ්‍යයන වාර්තාවක් නොමැති තරම්ය.

මී මැස්සා යනු Apidae පවුලට අයත් පූර්ණ රූපාන්තරණය පෙන්වන සත්ත්වයෙකි. මොවුන්ට බිත්තර, කීට, පිලා සහ සුහුඹුල් ලෙස වර්ධන අවධි හතරකි. මී මැසි ජනපදයක් තුළ මී මැසි රැජින, වැඩකාර මැස්සියන් සහ පිරිමි මැස්සන් වෙසෙති. රැජිනගේ ප්‍රධාන කාර්යය බිත්තර දැමීම වන අතර මීමැසි ජනපදයේ පැවැත්මට රැජිනගේ පෙරමෝන උපකාරී වේ. පිරිමි මැස්සන් ඉතා කුඩා ප්‍රමාණයක් වෙසෙන අතර වෙනත් ජනපදයක රැජිනක් සමග පට්ටි වැටීම ඔවුන්ගේ කාර්යයයි. මී පැණි එකතු කිරීම, පරාග එකතු කිරීම, කීටයන් සහ පිළවුන් රැක බලා ගැනීම සහ මී වදය පිරිසිදු කිරීම වැනි වැඩ කටයුතු රාශියක් වැඩකාර මැස්සියන් විසින් සිදු කරයි.

මී මැසි ජනපදයක වැදගත් ම කෘත්‍යයන් රැසක් ඉටු කරන වැඩකාර මැස්සියන්ගේ ජීවන චක්‍රය පිළිබඳ තොරතුරු විමසන විට මීවදයක පහළ කොටසේ ඇති පිලා කෝෂ තුළ මී මැසි රැජින විසින් දමනු ලබන සංසේචනය වූ බිත්තර මගින් පූර්ණ දින 3කට පසු සුදු පැහැති කුඩා කීටයෝ උපදිති. මෙම කීටයන් අනෙකුත් වැඩකාර මැස්සියන් විසින් පෝෂණය කෙරෙන අතර දින 4.5–5ක පමණ කීට අවධිය පවතී. බිත්තර දැමීමෙන් පසු එළඹෙන 8 වන දිනයේදී පමණ කීට අවධියේ උපරිම වර්ධනයට පැමිණෙයි. එම අවස්ථාවේදී වැඩකාර මැස්සියන් විසින් එතෙක් සිදුකළ පෝෂක සැපයීම නතර කරයි. මෙම අවස්ථාවේදී වැඩකාර මැස්සියන් විසින් අදාළ පිළවා සහිත කුටීරය වසනු ලැබේ. දින 11–11.5ක පමණ පිලා අවධියක් මොවුන්ට ඇත. එම කාලය තුළදී ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වී මනාව වැඩුණු සුහුඹුල් මීමැස්සෙකු ලෙස පිටතට පැමිණෙයි.



දින 1, 2, 3 බිත්තර අවධිය, දින 4, 5, 6, 7, 8 කීට අවධිය, 8 වන දිනයේදී වැඩකාර මැස්සන් විසින් කීටයන් සහිත කුටීර වැසීමත් සමග පිලා අවධියට එළඹීම, එතැන් සිට 19 වන දින දක්වා පිලා අවධිය ගතකර වැඩුණු සුහුඹුල් මීමැස්සෙකු ලෙස පිටතට පැමිණීම.

විශ්වවිද්‍යාල භූමිය තුළ ස්ථාපනය කර ඇති රාමු 8ක් සහිත මී මැසි ජනපදයක් යොදාගෙන, ඔවුන්ගේ ස්වාභාවික පැවැත්මට වන හානිය අවම වන අයුරින් ඡායාරූප හා වීඩියෝ යොදාගෙන මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මාස දෙකක කාලයකදී වැඩකාර මැස්සියන් තිස් පස් දෙනෙකුගේ තොරතුරු මෙහිදී එක්රැස් කරන ලදී. ලබා ගන්නා ලද තොරතුරුවල සාමාන්‍ය අගයන් මගින් මෙම දින සීමාවන් එනම් බිත්තර තුළ දින තුනක්, කීට අවධියේ දින 4.5–5 හා පිලා අවධියේ දින 11–11.5 ලෙස ගත කරන බවත් වැඩකාර ගැහැණු මැස්සෙකු සම්පූර්ණයෙන්ම වර්ධනය වී සුහුඹුල් අවධියට පත්වීම සිදුවන්නේ දින 19ත් 19.5ත් අතර කාලයකදී බවත් තහවුරු කරගෙන ඇත. මෙම අධ්‍යයනය මගින් මීට පෙර වාර්තා කර ඇති පරිදි දින 20කදී සම්පූර්ණ වන වැඩකාර මැස්සාගේ ජීවන චක්‍රය දින 19ත් 19.5ත් අතරදී සුහුඹුල් අවධියට පත්වන බව සොයා ගන්නා ලදී.

කාබනික තක්කාලි වගාවට හරිත විසඳුම: මුරුංගා පත්‍ර සාරය!



ආර්.ඩී.ඒ.කේ. සරත්චන්ද්‍ර

ශ්‍රී ලංකාවේ තක්කාලි වගාව, දේශීය ආර්ථිකයට මෙන්ම ගොවිජනතාවගේ ජීවනෝපායට සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. එහෙත්, වර්තමානයේ රසායනික පොහොර සහ කෘමිනාශක අධික ලෙස භාවිත කිරීම නිසා පසෙහි සාරවත්බව අඩු වීම, පරිසර දූෂණය සහ ගොවීන්ගේ ආදායම පහත වැටීම වැනි ගැටලු බහුලව දක්නට ලැබේ. මෙම අභියෝගයන්ට මුහුණ දීම සඳහා, තිරසාර කෘෂිකාර්මික පිළිවෙත් වෙත යොමු වීම අත්‍යවශ්‍ය කරුණකි.

මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන, රසායනික පොහොර වෙනුවට ස්වාභාවික ජීව උත්තේජක (Bio-stimulants) භාවිත කිරීම කෙරෙහි ලෝකයේ අවධානය යොමු වී ඇත. ශාක වර්ධනයට අවශ්‍ය වන සයිටොකිනින් (Zeatin) වැනි හෝමෝන, ප්‍රතිඔක්සිකාරක, ඇමයිනෝ අම්ල සහ පෝෂක සංඝටකවලින් පොහොසත් මුරුංගා (*Moringa oleifera*) පත්‍ර සාරය, තක්කාලි වගාවේ තිරසාරත්වය සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා විශාල විභවයක් ඇති ස්වාභාවික විසඳුමක් ලෙස හඳුනාගත හැකිය.





මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ, මුරුංගා පත්‍ර සාරය (MLE) භාවිතයෙන් තක්කාලි වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීමේ ක්‍රමවේදයක් හඳුනා ගැනීමයි. විවිධ MLE සාන්ද්‍රණ, කාබනික හා අකාබනික පොහොර සමඟ සංකලනය කිරීමෙන් තක්කාලි ශාකයේ වර්ධනය, අස්වැන්න සහ පෝෂණ තත්ත්වයට සිදුවන බලපෑම් විද්‍යාත්මකව මෙහිදී අධ්‍යයනය කෙරේ.

තක්කාලි ශාකයේ වර්ධනය, අස්වැන්න සහ පෝෂණ තත්ත්වය මත මුරුංගා පත්‍ර සාරය සහ විවිධ පොහොර වර්ගවල බලපෑම නිවැරදිව තක්සේරු කිරීම සඳහා, මෙම පර්යේෂණයේදී පහත සඳහන් ප්‍රධාන පර්යේෂණ සාධක විධිමත් ලෙස සැලකිල්ලට ගන්නා ලදී. පොහොර වර්ග ලෙස කාබනික (Vermicompost) සහ අකාබනික (කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත NPK) යන දෙවර්ගයම භාවිතා කරන ලදී. MLE සාන්ද්‍රණය සම්බන්ධයෙන්, 0% (කිසිදු MLE යෙදීමක් සිදු නොවන අවස්ථාව), 3% (v/v), 20% (v/v) මට්ටම් තුනක් පරීක්ෂා කරන ලදී. තවද, MLE ද්‍රාවණය ශාක මතට යෙදීමේ කාල පරතරය ද වැදගත් සාධකයක් ලෙස සලකමින්, දින 7කට වරක් සහ දින 14කට වරක් යන පරතරයන් යටතේ යෙදීම් සිදු කෙරිණි. මෙම සාධකයන් විවිධ සංයෝජනවලින් අත්හදා බැලීම මගින්, තක්කාලි ශාකයේ වර්ධන ලක්ෂණ (උස, කඳේ විෂ්කම්භය, පත්‍ර ප්‍රමාණය ආදිය), අස්වැන්නෙහි අගය සහ ශාක පත්‍රවල පෝෂණ මට්ටම් (N, P, K) පිළිබඳ විද්‍යාත්මක දත්ත රැස් කර විශ්ලේෂණය කරන ලදී.

මුරුංගා පත්‍ර සාරය (MLE) සකස් කරගත් ආකාරය: ගොවීන්ට පහසුවෙන් MLE සකස් කරගත හැකි වන පරිදි සරල ක්‍රමවේදයක් මෙහිදී භාවිතා කරන ලදී. නැවුම්, පිරිසිදු කරන ලද මුරුංගා පත්‍ර පිරිසිදු ජලය සමඟ 1:10 අනුපාතයකින් (පත්‍ර : ජලය) මිශ්‍ර කර, හොඳින් අඹරා ගෙන හොඳින් පෙරා සාන්ද්‍රිත මුරුංගා සාරය ලබා ගන්නා ලදී. ඉන්පසුව, මෙම සාන්ද්‍රිත මව් සාරය ශාක මත යෙදීම සඳහා අවශ්‍ය සාන්ද්‍රණයට ජලය සමඟ මිශ්‍ර කෙරේ.

- **3% MLE ද්‍රාවණය:** ලීටර් 100ක ද්‍රාවණයක් සෑදීමට, සාන්ද්‍රිත මුරුංගා සාරය ලීටර් 3ක් හා ජලය ලීටර් 97ක් එක්කර හොඳින් මිශ්‍ර කරන්න.
- **20% MLE ද්‍රාවණය:** ලීටර් 100ක ද්‍රාවණයක් සෑදීමට, සාන්ද්‍රිත මුරුංගා සාරය ලීටර් 20ක් හා ජලය ලීටර් 80ක් එක්කර හොඳින් මිශ්‍ර කරන්න.

මෙලෙස සකස් කරගන්නා ලද ද්‍රාවණය, ශාක පත්‍ර මත සෘජුව ඉසීම (Foliar Spray) මගින්, පත්‍රවලට අත්‍යවශ්‍ය පෝෂක සහ ජීව ක්‍රියාකාරී සංඝටක සෘජුවම අවශෝෂණය කර ගැනීමට සැලැස්විණි.

මෙම පර්යේෂණයෙන් තහවුරු වූයේ, කාබනික පොහොර සමඟ 3% මුරුංගා පත්‍ර සාරය යෙදීමෙන් තක්කාලි අස්වැන්න සැලකිය යුතු ලෙස වැඩි වන අතර, ශාකයේ උස, කඳේ වට ප්‍රමාණය සහ පත්‍රවල ප්‍රමාණය වැනි වර්ධන ලක්ෂණ දියුණු වන බවයි. එපමණක් නොව, මුරුංගා පත්‍ර සාරය භාවිතය මඟින් ශාකයේ පෝෂක අවශෝෂණය සහ හරිතප්‍රද නිෂ්පාදනය වැඩි දියුණු වී, ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය කාර්යක්ෂම කරන අතර, රසායනික පොහොර භාවිතය අවම කිරීමටත්, ඒ මඟින් පසට සිදුවන හානිය සහ ගොවීන්ට වන වියදම අඩු කිරීමටත් උපකාරී වන බව අනාවරණය විය.

නිර්දේශය: තක්කාලි වගාවේදී රසායනික පොහොර භාවිතය අවම කර, කාබනික පොහොර (Vermicompost වැනි) සමඟ සතියකට වරක් 3%ක සාන්ද්‍රණයෙන් යුත් මුරුංගා ද්‍රාවණයක් පත්‍ර මතට යෙදීමෙන් අස්වැන්න සහ ශාක සෞඛ්‍යය ප්‍රවර්ධනය කළ හැක. මෙය නිෂ්පාදන වියදම් අඩු කර ආදායම වැඩි කර ගැනීමට ද උපකාරී වේ.

නිගමනය: මුරුංගා පත්‍ර සාරය යනු තක්කාලි වගාවේ ඵලදායිතාව සහ තිරසාරත්වය වැඩි දියුණු කිරීම සඳහා වූ ස්වාභාවික, ඵලදායී සහ ලාභදායී ප්‍රවේශයකි. මෙම ක්‍රමවේදය මගින් රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය අඩු වී, පාරිසරික හානිය අවම වී, පරිසර හිතකර කෘෂිකර්මාන්තයක් ප්‍රවර්ධනය කළ හැකිය.





ආහාර ආසාත්මිකතාවයෙන් පීඩා විඳින ඔබට තාක්ෂණයෙන් විසඳුමක් !



සූරියගේ දිනේශිකා තරංගනී

ආහාර වේලක් රස විඳීමේදී එහි අඩංගු විය හැකි ආසාත්මිකතා පිළිබඳ ඔබ සැලකිලිමත්ද?

ආහාර ආසාත්මිකතාවය (Food Allergy) යනු ආහාර ද්‍රව්‍යවල ඇති ප්‍රෝටීන කෙරෙහි ඇතිවන අහිතකර ප්‍රතිශක්ති ක්‍රියාවලියකි.

මේ වන විට ලෝක මානව ප්‍රජාවෙන් මිලියන 200කට අධික ප්‍රමාණයක් ආහාර ආසාත්මිකතාවය සහිත බව හඳුනාගෙන ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් දැනට ආහාර ආසාත්මිකතාවයට හේතු වන ප්‍රධාන ආහාර වර්ග 14ක් හඳුනාගෙන ඇත. නමුත් ඊට අමතරව විශාල ප්‍රමාණයක ආසාත්මිකකාරක ආහාර පවතින අතර, පුද්ගලානුබද්ධව මෙම ප්‍රතික්‍රියා විවිධත්වයක් පෙන්වයි.



මේ සඳහා ස්ථිර ප්‍රතිකාර ක්‍රම තවමත් සොයාගෙන නොමැති බව ඔබ දන්නවාද?

එබැවින් ප්‍රතිකාරයට පෙර වළක්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ. නමුත් එය ඉතා සංකීර්ණ වී ඇත්තේ ආසාත්මිකතාවය පුද්ගලයන් අතර විශාල විවිධත්වයක් පෙන්වීමයි. මහා පරිමාණ ආහාර නිෂ්පාදකයින් විසින් මෙම අභියෝගයට මුහුණ දීමට විවිධ උපක්‍රම අනුගමනය කරයි. විශේෂයෙන්ම දේශීය පාරිභෝගිකයන් සහ විදේශිකයන් සඳහා ආහාර සපයන හෝටල් ක්ෂේත්‍රය මෙන්ම ජාත්‍යන්තර මගීන් සඳහා ආහාර සපයන Sri Lankan Catering වැනි ආයතනයන්ගේ නිරන්තර අවධානයට ලක් වන මෙම ගැටලුව සඳහා කාලීන පිළිතුරක් ලබා දීමට මෙම අධ්‍යයනය සමත් වී ඇත.

මහා පරිමාණ ආහාර සැකසුම්කරුවන් සහ එම ආයතන අතර විවිධ තරාතිරම් සහ දැනුම් පද්ධතීන් සහිත සේවක ප්‍රජාවන් හමුවේ. ආහාරයක් එහි ප්‍රාථමික අවස්ථාවේ සිට පාරිභෝගිකයා සතු කරන මොහොත දක්වා විවිධ වෙනස්වීම් රාශියකට භාජනය වන අතර ආහාරයට එක් වන විවිධ අමුද්‍රව්‍ය එහි සුරක්ෂිතභාවය තීරණය කරයි. මෙහිදී ආහාරයක පිටත පෙනුම පමණක් නිරීක්ෂණයෙන් එහි ආසාත්මිකතාවය පිළිබඳ තීරණය කිරීම කළ නොහැකිය. මේ සඳහා එකිනෙකට සම්බන්ධ පද්ධතියක් අත්‍යවශ්‍ය වේ. ආහාරයක් පරිභෝජනයට සුදුසු තත්වයට පත් කිරීමේදී ඊට විවිධ අවස්ථා කිහිපයක් පසු කිරීමට සිදුවන බව ඔබ හොඳින් දන්නා කරුණකි.

නමුත් ඒ එක් එක් අවස්ථාව සඳහා දායක වන පිරිස අතර විශාල විවිධත්වයක් පවතී. ඔවුන්ගේ දැනුම, අත්දැකීම් එකිනෙකාට වෙනස් වන අතර ආහාරය පිළිගන්වන පුද්ගලයා සතුව එහි අන්තර්ගතය පිළිබඳ පුළුල් අවබෝධයක් නොතිබිය හැකිය.

මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් Sri Lankan Catering ආයතනය සහ Cinnamon Hotels & Resorts ආයතනය සමඟ සම්බන්ධ වීමෙන් සිදු කළ අතර එහිදී ඔවුන් දෙපිරිස සඳහා වෙන වෙනම එම දත්ත පද්ධති වැඩිදියුණු කළ අතර ඔවුන් භාවිතා කරන සෑම අමුද්‍රව්‍යක්ම එම දත්ත ගබඩාවලට ඇතුළත් කරන ලදී.

විශේෂයෙන්ම එම එක් එක් අමුද්‍රව්‍ය සහ ඒවා භාවිතයෙන් සකසන ආහාර සම්බන්ධ සියලු තොරතුරු ඇතුළත් වෙබ් අඩවියක් වැඩිදියුණු කිරීම සිදු විය. එහිදී විශේෂ අවධානයක් ආහාර ආසාත්මිකතාවය සඳහා ලබා දුනි. වෙබ් අඩවිය ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර ආයතන නිලධාරීන් මෙන්ම පාරිභෝගිකයන්ට ද එය භාවිතා කළ හැකි වේ.

මෙම විශේෂාංග මගින් සෑම පාරිභෝගිකයෙකුටම තමා ගන්නා ඕනෑම ආහාරයක අඩංගු සියල්ල පිළිබඳ තොරතුරු පහසුවෙන් සොයා ගැනීමට පහසුකම් සලසා ඇත. එමගින්,

- නිරන්තරයෙන් ආසාත්මිකතාවන්ට ගොදුරු වන පුද්ගලයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.
- ක්ෂේත්‍රයේ නියැලෙන සියලු දෙනා අතර සන්නිවේදනය සහ තොරතුරු යාවත්කාලීන කිරීමට ද අවස්ථාව ලැබුණි.

වෙබ් අඩවිය නිර්මාණය කිරීමෙන් පසුව ඉහත නම් කරන ලද ආයතන නිලධාරීන්ට එය භාවිතා කිරීමට ලබා දුන් අතර ප්‍රායෝගිකව මතු විය හැකි ගැටලු විමසීම සිදු විය. එමඟින් මෙම වෙබ් අඩවියෙහි කාර්යක්ෂමතාව තවදුරටත් ඉහළ නැංවීමට හැකි විය.

එමෙන්ම මෙම යෙදවුම පාරිභෝගිකයන්ගේ විශ්වාසය තහවුරු කිරීමට බෙහෙවින් බලපෑ අතර ආයතන දෙකෙහිම ඉදිරි ගමනට පිටිවහලක් වන බව තරයේ විශ්වාස කරමු.



සකස් කළ තේ වල ක්ෂණිකව ජල ප්‍රතිශතය සෙවීමට නවෝත්පාදනයක්



හෂාන් නිලංක



Camellia sinensis යන විද්‍යාත්මක නමින් හඳුන්වනු ලබන තේ ශාකයෙන් ලබාගත් තේ, එහි රසය සහ සෞඛ්‍ය ප්‍රතිලාභ සඳහා ලොව පුරා බහුලව පරිභෝජනය කරන ඇරෝමැටික, මධ්‍යසාර නොවන පානයකි.

චීනයේ ආරම්භ වූ තේ, ජලයට පසු ලොව දෙවන වඩාත් ජනප්‍රිය පානය වන අතර, ගෝලීය නිෂ්පාදනය වාර්ෂිකව ටොන් 6,012,000 ක් පමණ වේ. තේ නිපදවන ප්‍රධාන රටවලට කෙන්යාව, චීනය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, ඉන්දුනීසියාව සහ වියට්නාමය ඇතුළත් වන අතර, කෙන්යාව ලොව ප්‍රමුඛතම තේ අපනයනකරු ලෙස පෙරමුණ ගෙන සිටී. තේවල ආකර්ශනීය බව ඇති වන්නේ එහි පොහොසත් ප්‍රතිඔක්සිකාරක අන්තර්ගතයෙනි. ප්‍රධාන වශයෙන් පිළිකා වැළැක්වීම ඇතුළු එහි ඖෂධීය ගුණාංග සඳහා දායක වන පොලිෆෙනෝල් සහ ෆ්ලේවනොයිඩ් නිසාය.

තේවල ගුණාත්මක භාවය එහි තෙතමනය ප්‍රමාණය මත බෙහෙවින් රඳා පවතින අතර එය රසය, සුවඳ සහ ස්ථායිතාවයට සෘජුවම බලපායි. තේ සැකසීමේදී, ක්ෂුද්‍රජීවී වර්ධනය වැළැක්වීමට සහ එහි සංවේදක ලක්ෂණ ආරක්ෂා කිරීමට නිවැරදි තෙතමන මට්ටම සාමාන්‍යයෙන් 2-6% අතර පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, උඳුන් වියළීම (Oven dry) වැනි පවතින තෙතමනය මැනීමේ ක්‍රම මන්දගාමී, විනාශකාරී සහ තත්‍ය කාලීන අධීක්ෂණය සඳහා නුසුදුසු ය. සැකසූ තේවල තෙතමනය අන්තර්ගතය පිළිබඳ වේගවත්, නිවැරදි සහ විනාශකාරී නොවන මිනුම් ලබා දිය හැකි අතේ ගෙන යා හැකි, ධාරිතාව මත පදනම් වූ තේ තෙතමනය මීටරයක් සංවර්ධනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.

විසඳුමක්!!

මෙය විශේෂ විද්‍යුලි සංවේදකයකි. තේ පත්‍රවල තෙතමනය අනුව විද්‍යුලි ධාරිතාවය (Capacitance) වෙනස් වීම මිනුමක් ලෙස කියවීමට හැකි උපාංගයකි.

මෙහිදී සංවේදකය ලෙස ඇලුමිනියම්වලින් සාදා ගන්නා ලද සිලින්ඩර දෙකක් යොදාගන්නා ලදී (Co-Axial Cylinders). ඉන්පසු එම සංවේදකය සකස් කරගත් පරිපථයක් හරහා ESP32 යන ක්ෂුද්‍ර පාලක පරිපථයක් සමඟ සම්බන්ධ කරන ලදී. මෙහිදී ESP32 පාලක පරිපථයෙන් පෙර සකස් කරගන්නා ලද පරිපථය තුළින් පාලිත ධාරාවක් යවන අතර, සංවේදකය තුළ තේ අතුරා ඇති විට එහි පවතින ජලය තුළින් මෙම පාලිත ධාරාව ගමන් කරයි.

එම ධාරාව තේ තුළ පවතින ජලය තුළින් ගමන් කිරීමේදී ධාරාව අඩු වේ. එම අඩු වී පැමිණෙන ධාරාව සකස් කරගත් සංඥා ප්‍රවර්ධකය තුළින් ගමන් කිරීමෙන් පසු නැවත වරක් ESP32 පරිපථය වෙත ගමන් කරයි. එහිදී පසුව විභව අන්තරය ගණනය කර එමගින් තේවල පවතින ජල ප්‍රතිශතය නිරූපණය කිරීම සිදු කරයි. මෙහිදී ප්‍රථමයෙන් දන්නා ජල ප්‍රතිශතයක් සහිත තේ සාම්පල භාරමිතික ක්‍රමය (Gravimetric method) ආධාරයෙන් සකස් කර (0%, 2%, 4%, 6%, 8%, 10%) ලබා ගන්නා ලදී. පිළිවෙලින් මෙම සාම්පල සංවේදකය තුළට ඇතුළු කරමින් ඒවාට අදාළ වෝල්ටීයතා වෙනස්කම් වෙන වෙනම සටහන් කර ගැනීමෙන් පසු ඒවා ප්‍රස්ථාරගත කර පොදු සමීකරණයක් ලබා ගන්නා ලදී. පසුව එම සමීකරණය C++ කේතයක් යොදාගනිමින් අදාළ තේ සාම්පලයේ ජල ප්‍රතිශතය ගණනය කරනු ලැබේ.

මෙමගින් පෙර පැය 24 ක් පමණ ගතවන ජල ප්‍රතිශතය සෙවීමේ ක්‍රමය, මිනිත්තුවකින් ඉතාමත් පහසුවෙන් සොයාගත හැක.





ඔබ පානය කරන නළ ජලය ගැන තවමත් සැකයක් තියෙනවා ද?



එච්. ඩබ්. දසුනි පබෝධා

පිරිසිදු හා ආරක්ෂිත ජලය මිනිසාගේ මූලික අයිතිවාසිකමක් වන නමුත්, ශ්‍රී ලංකාව තුළ මුළු ජනගහණයට පිරිසිදු හා ආරක්ෂිත පානීය ජලය ලැබෙනවා ද යන්න තවමත් ගැටලුවකි. කෙසේ වෙතත්, වර්තමානයේ දී, බොහෝ පළාත්වලට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු ජලය ලබා දෙනු ලැබේ. නමුත්, මෙම ජලයෙහි ගුණාත්මකභාවය පිළිබඳව ඇති විවිධ මතවාද නිසා, නළ මඟින් ලැබෙන මෙම ජලය විවිධ ප්‍රතිකාර ක්‍රම භාවිතයෙන් නැවත ප්‍රතිකාරවලට ලක් කිරීම ඉතා බහුලව දැක ගත හැකිය. මෙම පිරිපහදු කරන ලද ජලය හෝ නොකරන ලද ළිං ජලය සඳහා බොහෝ විට ඔබගේ නිවසේදීත්, ජලය උණු කිරීම හෝ විවිධ පෙරහන් ක්‍රම (Filters) වැනි ගෘහස්ථ මට්ටමින් සිදු කළ හැකි ප්‍රතිකාර ක්‍රම භාවිතා කරනවා නොඅනුමානයි. නමුත් මෙම එක් එක් ප්‍රතිකාර ක්‍රමවල ඵලදායීතාව පිළිබඳව ඔබ දැනුවත් ද?

මෙම අධ්‍යනයේ දී, ජලය උණු කිරීම සහ විවිධ පෙරහන් ක්‍රමවල බලපෑම සොයා බැලීම සඳහා ලංකාවේ විවිධ ප්‍රදේශවල විවිධ මට්ටම්වල ජල සාම්පල පරීක්ෂා කරන ලදී. මෙහි දී ලැබුණු දත්ත අනුව නිගමනය කළ හැකි වූයේ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් දැනටමත් පිරිසිදු කරන ලද ජලය, නැවත වතාවක් පිරිසිදු කිරීමෙන් අමතර ප්‍රයෝජනයක් නොලැබෙන බවයි. මෙලෙස, නැවත පිරිපහදු කිරීමේ දී, විද්‍යුත් සන්නායකතාව (Electrical conductivity), ජලයේ ද්‍රාවිත සහ ද්‍රව්‍ය ප්‍රමාණය (Total dissolved solids), ක්ෂාරීය බව (Alkalinity), කඨින බව (Hardness) වැනි පරාමිතීන් ඉහළ යන බව නිරීක්ෂනය කරන ලදී. මෙම පරාමිතීන්වල අගයන් පිරිපහදුවෙන් පසු පානයට නුසුදුසු සහ අනාරක්ෂිත ලෙස ඉහළ නොගිය නමුත්, මෙමඟින් පෙනී යන්නේ දැනටමත් පිරිපහදු කරන ලද ජලය නැවත පිරිපහදු කිරීම ඵලදායී නොවන ක්‍රියාවලියක් බවයි. කෙසේ වෙතත්, මෙම පිරිපහදු කරන ලද ජලයේ ගුණාත්මක බව ජලය සපයන නළ, ඔබගේ නිවසේ ජලය ගබඩා කරන ටැංකිවල තත්ත්වය වැනි කාරණා මත රඳා පැවතිය හැක.

කලින් පිරිපහදු නොකරන ලද ජල සාම්පල අධ්‍යනයේ දී පෙනී ගියේ විවිධ ප්‍රතිකාර ක්‍රම, විවිධ පරාමිතීන්වලට එකිනෙකට වෙනස් ඵලදායීතාවයන් පෙන්වන බවයි.

ජලය උණු කර නිවාගත් විට එය ක්ෂුද්‍ර ජීවීන්ට එරෙහිව ඉහළ ඵලදායීතාවයක් පෙන් වූ නමුත් ජලයේ ද්‍රවණය වී ඇති සන ද්‍රව්‍ය වැනි භෞතික පරාමිතීන් සහ සල්ෆේට, පොස්ෆේට වැනි රසායනික පරාමිතීන්වල දී ජලය උතුරවා නිවා ගැනීම එතරම් ඵලදායී නොවුනි. ජලය පෙරහන් කරන සෙරමික් ෆිල්ටර් (Ceramic filter) භාවිතයේ දී, ජලයෙහි ඇති යකඩ මට්ටම් අවම කිරීම සඳහා ඉහළ ඵලදායීතාවයක් පෙන්වන බව නිරීක්ෂණය කරන ලදී. කෙසේ වෙතත් මෙම අධ්‍යනයේ දී එක් ප්‍රතිකාර ක්‍රමයක් ලෙස යොදාගත් සක්‍රිය කාබන් පෙරහනක් (Activated Carbon Filter) සහිත ක්ලෝරින් නිදහස් කළ හැකි ෆිල්ටරය, සමස්තයක් ලෙස භෞතික, රසායනික සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරාමිතීන්වල දී ඉහළම ඵලදායීතවක් පෙන්වන ලදී. විශේෂයෙන්ම, ජලයේ අපහැදිලි බව, පැහැය, සල්ෆේට මට්ටම්, කඨිනත්වය සහ ක්ෂුද්‍ර ජීවීන් යන පරාමිතීන් සඳහා මෙම ෆිල්ටරය ඉතාමත් සුදුසු බව නිරීක්ෂණය කරන ලදී.

එසේම මෙම අධ්‍යනයේ දී පෙනී ගියේ ඉතා ඉහළ දූෂිත මට්ටම් සහිත ජල සාම්පල, ගෘහාශ්‍රිත පිරිපහදු ක්‍රම මඟින් පමණක් ප්‍රතිකාර කිරීමෙන් පිරිසිදු, ආරක්ෂිත සහ පානයට සුදුසු ජලය ලබා ගත නොහැකි බවයි. මේ සඳහා, ප්‍රතිලෝම ඔස්මොසිස් (Reverse Osmosis) වැනි උසස් තාක්ෂණික ක්‍රම භාවිතා කළ යුතු වේ. මෙහි දී, නිගමනය කළ හැකි වන්නේ එක් එක් ප්‍රතිකාර ක්‍රමවල ඵලදායීතාව අදාළ ජලයේ ආරම්භක ගුණාත්මකතාව මත රඳා පවතින බවයි.

අවසාන වශයෙන් මෙම අධ්‍යනය අනුව පෙනී යන්නේ, දැනටමත් පිරිපහදු කරන ලද ජලය නැවත පිරිසිදු කිරීම කාලය සහ පිරිවැය පිළිබඳ සැලකීමේ දී ඵලදායී නොවන බව සහ පිරිසිදු නොකරන ලද ළිං ජලය වැනි ජල මූලාශ්‍ර භාවිතයේ දී, සුදුසු ගෘහාශ්‍රිත ප්‍රතිකාරක ක්‍රමයක් තෝරා ගැනීමට පෙර ඔබේ ජල මූලාශ්‍රයේ ගුණාත්මක බව සහ ප්‍රතිකාර ක්‍රමයේ ඵලදායීතාව පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම ඉතා වැදගත් බවයි. ඒ අනුව, පිරිසිදු හා ආරක්ෂිත ජලය ලබා ගැනීම සඳහා විද්‍යාත්මක අවබෝධය සමඟ නිවැරදි පුරුදු ගළපා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බව මනාව පැහැදිලි වේ.



This is a non-technical summary of the project report titled "Evaluating the common household water treatment methods on physico-chemical and microbiological parameters of water obtained from selected regions in Sri Lanka" supervised by Mr. N. Y. Jayanath, Department of Food Science and Technology, Faculty of Agriculture, University of Peradeniya.
*jayanathny@agri.pdn.ac.lk

ඖෂධීය ගුණයෙන් සපිරි උළුහාල් පදනම් කරගත් ක්‍රියාකාරී පානය



එම්.ජී.ඒ.ඒ.ජී.එන්. අතපත්තු

උළුහාල් (*Trigonella foenum-graecum*) යනු ශ්‍රී ලංකාවේ බොහෝ නිවෙස්වල කුළුබඩු ක් ලෙස ආහාර රස ගැන්වීමට යොදා ගන්නා ප්‍රධාන අමුද්‍රව්‍යකි. උළුහාල් ආහාරයට ආවේණික සුවඳක් මෙන්ම රසයක් එක් කරයි. හුදෙක් ආහාර රස ගැන්වීමට එහා ගිය සෞඛ්‍ය ප්‍රතිලාභ රැසක් ලබා දෙන ක්‍රියාකාරී සංයෝග වලින් පිරුණු ගබඩාවක් වන උළු හාල්වල ඖෂධීය ගුණය ඉතා ඉහළ ය. උළුහාල්,ආහාරමය තන්තු විශේෂයක් වන ග්ලැක්ටෝ මැනන්(Galactomannan), ඇමයිනෝ අම්ල(4-හයිඩ්‍රොක්සි අයිසෝලෙවුසීන්), ජීව ක්‍රියාකාරී සංයෝග වන ඇල්කලොයිඩ (Alkaloids), ෆ්ලේවොනොයිඩ (Flavonoids), සැපොනින් (saponin) වලින් පොහොසත් වන අතර එබැවින් උළුහාල් එදිනෙදා පරිභෝජනය කිරීම මගින් විශේෂයෙන් පළමු ඛාණ්ඩයේ (Type 1) හා දෙවන කාණ්ඩයේ (Type 2) දියවැඩියා රෝගීන්ගේ රුධිර සීනි මට්ටම සාමාන්‍ය අගයක පවත්වා ගැනීමට දායක වන අතර, ශරීරයේ පවතින අඩු ඝනත්ව ලිපෝප්‍රෝටීන (LDL) මට්ටම පහළ දැමීම මගින් හෘද සෞඛ්‍ය පවත්වා ගැනීමට උදවු වේ.

එපමණක් නොව මෙහි ඇති තන්තු වල පවතින ජෙලිමය ස්වභාවය මගින් ආමාශය පිරී ඇති බවක් දනවන නිසා කුසගිනි දැනීම පමා කොට ශරීරයේ බර පාලනය කර ගැනීමට මෙන්ම ආහාර ජීර්ණය ද පහසු කර ගැනීමට උළුහාල් වැදගත් වේ. එසේම උළුහාල් වල ප්‍රතිඔක්සිකාරක ගුණය (Antioxidant) මෙන්ම පිළිකා නැසීමේ (Anticarcinogenic) ගුණ ද ගැබ්ව පවතින අතර කිරි දෙන මවුවරුන්ගේ කිරි නිපදවීම උත්තේජනය කිරීම හා ශරීරයේ හෝර්මෝන සමතුලිතතාවය පවත්වා ගැනීමට දායක වේ.මෙවැනි සෞඛ්‍ය ප්‍රතිලාභ රැසකට උළු හාල් හිමිකම් කීවද, උළුහාල් වල පවතින සුවිශේෂී ප්‍රියජනක නොවන තික්ත රස ය, බොහෝ දෙනා උළු හාල් පරිභෝජනයේ වැළකී සිටීමට පොළඹවයි.

මෙයට විසඳුමක් ලෙස, මාගේ මෙම ව්‍යාපෘතිය මගින් උළුහාල් පදනම් කරගත් ක්‍රියාකාරී පානයක් (Fenugreek-based functional beverage) නිෂ්පාදනය කළ අතර, මෙහි ඖෂධීය ගුණය රැකෙනා පරිදි මෙන්ම තික්ත රසය ඉස්මතු නොවන ලෙසද ස්වභාවික අමුද්‍රව්‍ය (උදා; අන්නාසි,ඉඟුරු සහ දෙහි) භාවිතා කරමින් රසය ඉහළ නංවන ලදී. මෙහිදී උළුහාල් ජලය සමග 1:10 අනුපාතයෙන් මිශ්‍ර කර ultrasonicactor යන්ත්‍රයක් මගින් උළුහාල් සෙලසියස් අංශක 45-55 උෂ්ණත්වයේ පවත්වා ගනිමින් පැය දෙකක් පමණ කාලයක් නිස්සාරණය කරන ලදී. මෙසේ ලබා ගත් නිස්සාරකය තික්ත රසය යටපත් කිරීම සඳහා ස්වභාවික අමුද්‍රව්‍ය (ඉඟුරු, දෙහි, අන්නාසි) රසකාරක (Flavours) ලෙස භාවිතා කෙරිණි. මෙම අමුද්‍රව්‍ය දෙක බැගින් විවිධ අනුපාතයන් සංයෝජනය කර (ඉඟුරු හා දෙහි රසැති) (ඉඟුරු හා අන්නාසි රසැති), සහ (අන්නාසි හා දෙහි රසැති) සංයෝග මිශ්‍රණ 15 ක් සාදන ලදී.

මෙම ස්වභාවික අමුද්‍රව්‍ය රසකාරක ලෙස භාවිතයේ ඇති වාසිය නම් කෘතිම රසකාරක මෙන් නොව මේවායේ ප්‍රතිඔක්සිකාරක ගුණ, පිළිකා නැසීමේ හැකියාව මෙන්ම ප්‍රතිශක්තිකරණය ඉහළ නැංවීමේ ගුණය ද ගැබ්ව තිබීමයි.

එසේම මෙම පානය සඳහා (සුක්‌රෝස්) සීනි වෙනුවට අඩු කැලරි ප්‍රමාණයක් අඩංගු පැණි රසකාරක මිශ්‍රණයක් (සුක්‍රලෝස් (Sucralose),අයිසෝ මෝල්ටුලෝස් (Isomaltulose) සහ ඇසිසල්ෆේම් K(Asisulfame K) භාවිතා කිරීමද මෙහි ගුණාත්මක භාවය ඉහළ නැංවීමට දායක වී ඇත. මෙසේ නිපදවන ලද ක්‍රියාකාරී පානය ආහාර විද්‍යාව හා තාක්ෂණය දෙපාර්තමේන්තුවේ සිදු කළ රස ඇගයීම් (sensory evaluation) වලින් අනතුරුව සහභාගි වුවන් වැඩිම රුචිකත්වය දක්වන රස සංයෝග අනුපාතයන් 3 ක් තෝරා ගන්නා ලදී. එම පානයන් 3 සඳහාම භෞතික රසායනික ගුණ (Total Soluble Solids, Titratable Acidity,සහ pH) පරීක්ෂා කෙරුණු අතර අවසාන වශයෙන් උළුහාල් වල සුවිශේෂී ගුණාංග ලෙස දියවැඩියාව (Diabetes) පාලනය හා කොලෙස්ටරෝල් (Cholesterol) මට්ටම පාලනය හේතු වන අග්න්‍යාශයික ඇමයිලේස් එන්සයිම නිශේධනය (Pancreatic Amylase enzyme inhibition) කිරීම සහ අග්න්‍යාශයික ලයිපේස් එන්සයිම නිශේධනය (Pancreatic lipase inhibition) කිරීමේ ක්‍රියාකාරී හැකියාව මෙම පානය නිපදවීම සඳහා භාවිතා කරන ලද උළුහාල් ජල නිස්සාරකය (Fenugreek water extract) සඳහා පරීක්ෂා කෙරුණි. එම පරීක්ෂණ ප්‍රතිඵල මගින් සැලකිය යුතු අග්ග්න්‍යාශයික ලයිපේස් නිෂේධන හැකියාවක් (11.13%) සහ අග්ග්න්‍යාශයික ඇමයිලේස් නිෂේධන හැකියාවක් (8.95%) මෙහි පවතින බව තහවුරු කර ගන්නා ලදී. මෙමගින් සනාථ වනුයේ දියවැඩියා රෝගින්ගේ රුධිරගත සීනි මට්ටම පාලනය කිරීමට මෙන්ම අධික ස්ථූලතාවය වළක්වා ගැනීමේ විශ්මිත හැකියාවක් මෙම ක්‍රියාකාරී පානය සතුව පවතින බවයි.

එබැවින් මෙවැනි සෞඛ්‍ය ප්‍රතිලාභ රැසකින් සමන්විත මෙම ස්වභාවික ක්‍රියාකාරී පානය තවදුරටත් වැඩි දියුණු කර වෙළඳ පොලට සැපයීම මගින් ඖෂධ භාවිතය අවම කර ලෙඩ රෝග රැසක් වළක්වා ගැනීමට මහගු පිටිවහලක් වනු නොඅනුමානය.

සාරවත් පසක් ගුණාත්මක ආහාරයක් - අපේ ගොවිතැනට නව මගක්



ජී. එච්. එස්. ලියනගේ

ඔබ දැන සිටියාද? සෑම දිනකම ලෝක ජනගහනයෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් සහල් පරිභෝජනය කරයි. ශ්‍රී ලංකාවේ ද මිලියන ගණනක් වන ගොවි පවුල්වල ජීවනාලිය වන සහල්, ශ්‍රී ලාංකිකයන්ගේ දෛනික ප්‍රධාන ආහාරය ද වේ. පරිභෝජනය පමණක් නොව, මුතුන්මිත්තන්ගේ සිටම සහල් නිෂ්පාදනය අප රටෙහි බොහෝ මිනිසුන්ගේ ජීවනෝපාය වී ඇත. එම නිසාම ඉන්දියන් සාගරයේ මුතු ඇටය "පෙරදිග ධාන්‍යාගාරය" ලෙසට ද ප්‍රසිද්ධ විය.

අතීතයේදී මෙන් නොව, වත්මන වන විට ශ්‍රී ලංකාවේ ගොවීන් බහුතරයක් වැඩි අස්වනු ලබා ගැනීම සඳහා පොහොර අත්‍යවශ්‍ය සාධකයක් බව විශ්වාස කරති. මෙයින් අප රටෙහි ආර්ථිකය ඔප්නැංවීමට හැකි වුවද, මෙම පොහොර යෙදීමෙන් පසෙහි ඉතිරි වන ද්‍රව්‍ය සහ ක්‍රමයෙන් අපගේ ශරීරගත වන ද්‍රව්‍යයන් වෙනස් විය හැක.

පොහොර භාවිතය වී අස්වැන්න ඉහළ නැංවීමට මෙන්ම ගොයම් ශාකය ශක්තිමත්ව වැඩීමට උපකාරී වේ. නමුත් පොහොර තුළ බොහෝ මිනිසුන් නොදන්නා සැඟවුණු කතාවක් ඇත. මෙම කතාවේ බලපෑම ප්‍රශ්නයකට නැංවූ විට: වී වගාව සඳහා විවිධ පොහොර භාවිතය, නිදසුන් ලෙස අකාබනික පොහොර, කාබනික පොහොර හෝ මෙම දෙකෙහි මිශ්‍රණය භාවිතය මගින් පසෙහි සහ වී ඇටෙහි පවතින මූලද්‍රව්‍ය වෙනස් කළ හැකි ද?

ක්ෂුද්‍ර පෝෂක මූලද්‍රව්‍ය අතරින් යකඩ (Fe) සහ සින්ක් (Zn) යන මූලද්‍රව්‍ය මානව සෞඛ්‍යයට හිතකර වන අතර, කැඩ්මියම් (Cd) සහ ලෙඩ් (Pb) යන මූලද්‍රව්‍ය පැවතීම ශරීරයට අහිතකර වේ. එබැවින් මතුවන ප්‍රශ්නය නම්, කෙත්බිම්වල හෝ සහල්වල මෙම අහිතකර සංරචක එක් වීමකින් තොරව සහල් අස්වැන්න ඉහළ නැංවිය හැකිද යන්නයි.

බතලේගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ වසර විසිදෙකක් පැරණි, විවිධ පොහොර සැලසුම් හතරකින් යුත් කෙත්බිම් ක්ෂේත්‍රයක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සෙවීම සඳහා තෝරා ගන්නා ලදී. එහිදී එය ප්‍රධාන කොටස් හතරකට බෙදා, ලක්දිව බහුලව වගා කරන Bg 358 යන සහල් වර්ගය වගා කරන ලදී. එහි පොහොර සැලසුම් ලෙස:

1. එක් කොටසකට පොහොර නොදමා ද,
2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත ප්‍රමාණවලට අනුකූලව කාබනික පොහොර පමණක් ද,
3. අකාබනික පොහොර පමණක් ද,
4. එම දෙකෙහිම මිශ්‍රණයක් ද, අනෙකුත් කොටස්වලට යොදා තිබුණි.

ඉන්පසු ගොයම් පැළ සිටුවීමට පෙර සිට අස්වැන්න ලබා ගන්නා තෙක් අදියර කිහිපයකදීම එහි පස, ගොයම් ශාකයේ කඳ පද්ධතිය සහ වී ඇටයේ පෝෂක අධ්‍යයනය කරනු ලැබූ අතර, ඒවා අවසානයේ පසෙහි, ශාකයේ කඳ හා පත්‍ර තුළ හෝ වී ඇටයේ ඉතිරි වන්නේ දැයි පරීක්ෂා කරන ලදී.



ඒ අනුව මෙම අධ්‍යයනයේදී, කාබනික සහ අකාබනික පොහොර මිශ්‍රණයෙන් යුක්ත සමතුලිත පොහොර සැලසුම ඉතා හොඳින් ක්‍රියාත්මක වූ අතර, එමඟින් වැදගත් පෝෂ්‍ය පදාර්ථ පසේ වඩා හොඳින් සමතුලිතව පැවතුණි. මෙම සංයෝජනය පස නීරෝගීව තබා ගැනීමට උපකාරී වන අතර, අනාගතයේදී හානිකර මූලද්‍රව්‍ය/භෝග ගොඩනැගීමේ අවදානම අවම කරයි. එපමණක් නොව, ශාකයේ හරිත කොටස්වල මෙන්ම වී ඇටයෙහි ද සින්ක් සහ යකඩ යන පදාර්ථ බහුලව පැවැති අතර, එය මිනිසාගේ පෝෂණ තත්ත්වයට හිතකර වේ.

මෙම සොයාගැනීම් ගොවියෙකුට හෝ විද්‍යාඥයෙකුට පමණක් සීමා නොවේ. යම් පුද්ගලයෙකු බත් පිසින විට හෝ තම පවුලට සෞඛ්‍යසම්පන්න ආහාර වේලක් ලබාදීමට නොහැකි වනු ඇතැයි සිතා බියට පත්වන සෑම අවස්ථාවකදීම මෙය වැදගත් වනු ඇත. අද දින ගොවිතැනේදී පොහොර පිළිබඳ අපගේ තේරීම, හෙට දින සෞඛ්‍යසම්පන්න මෙන්ම ගොවිතැන සඳහා වැඩි අස්වැන්නක් ලබා දෙන සාරවත් පසක් නිර්මාණය කිරීමට ඉවහල් වන බව නොඅනුමානයි.

This is a non-technical summary of the project report titled "Long-term effects of different fertilizer practices on trace element accumulation in rice (*Oryza sativa* L.) grown in low humic gley soil." supervised by Dr. D.M.P.D. Dissanayake*, Department of Soil Science, Faculty of Agriculture, University of Peradeniya. *pavanid@agri.pdn.ac.lk .

අපේ පොල් අපනයන කර්මාන්තය කොයිබටද? දැනගෙන ආයෝජනය කරමු; යහමින් උපයමු.



ප්‍රයෝමි සේනාරත්න

අපේ රට, 2023 වසරේදී දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ පෑ අවස්ථාවේ, ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ලබාදුන් ඇ.ඩො.බි. 3 ක ණය මුදල ඔබට මතකද? එදා එය ආර්ථික ස්ථාවරත්වයට මහඟු පිටිවහලක් වූ බව නොරහසකි. එතරම් සුවිශාල ණය මුදලක් වසර එකහමාරක කාලයක් තුළ ගෙවා නිම කළ හැකි සූත්තරයක් මා සොයා ගත් බව කිව්වොත් ඔබ විශ්වාස කරනවාද? එම සැහවුණු ධන නිධානය වෙනත් කිසිවක් නොව, පොල් ආශ්‍රිත සැකසූ ආහාර නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ඇති ඇ.ඩො.බි. 2 ක වාර්ෂික වෙළඳපොළ අවස්ථාව 100% ක් භාවිතයට ගැනීමයි. පොල් යනු රටේ ප්‍රධාන අපනයන භෝග ත්‍රිත්වයෙන් එකක් යැයි ආඩම්බරයෙන් පැවසුවද, අප තවමත් භාවිතයට ගන්නේ එයින් ඇ.ඩො.බි. 0.8 ක තරම් සුළු ප්‍රමාණයකි.

වෙළඳපොළේ බහුල පොල් ආශ්‍රිත සැකසූ ආහාර නිෂ්පාදනවලට අමතරව ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නැගී එන ඉල්ලුමක් සහිත නිෂ්පාදන වන්නේ:



මෙම නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් පවතින ප්‍රධාන වෙළඳපොළවල් කිහිපයක් ලෙස ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපය, ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, එක්සත් රාජධානිය සහ කැනඩාව දැක්විය හැක. වර්තමානය වන විට මෙම නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ශීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතී. බොහෝ පාරිභෝගිකයන් නිර්මාංශ ආහාර සඳහා නැඹුරු වීම, පොල් ආශ්‍රිත ආහාරවල සෞඛ්‍ය ප්‍රවර්ධනයට දායක වන සංඝටක ඇති බව විද්‍යාත්මක පර්යේෂණ මගින් තහවුරු වීම, මෙන්ම වර්තමාන පාරිභෝගිකයා කාබනික ආහාරවලට නැඹුරු වීම ද මෙම වෙළඳපොළ ඉල්ලුමට හේතු වේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ පොල්වල ඇති ලාක්ෂණික රසය, සුවඳ හා පැහැය, අප රටේ නිෂ්පාදනවලට විශේෂ ඉල්ලුමක් පැවතීමට ප්‍රධානතම සාධකයයි.

මෙම කර්මාන්තයේ නියැලීමට සුදුසුකමක් ලෙස, නිෂ්පාදකයින් හා අපනයනකරුවන් පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වීම අත්‍යවශ්‍ය වේ. එහිදී පොල් ආශ්‍රිත සැකසූ ආහාර නිෂ්පාදකයෙක් නම් ISO 22000 ජාත්‍යන්තර තත්ත්ව සහතිකය පැවතීම අත්‍යවශ්‍ය වේ. මෙමගින් නිෂ්පාදන මනා ප්‍රමිතියකින් යුතු බව හා සෞඛ්‍යාරක්ෂිත බව ජාත්‍යන්තරයට සහතික කරයි.

එමෙන්ම ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත සැකසූ ආහාර නිෂ්පාදන සෘජුවම අපනයනය කරන ආයතන සහභාගී කරගනිමින් සිදු කළ මෙම පර්යේෂණයේදී, තහවුරු වූයේ තම නිෂ්පාදනයට ඉහළ මිලක් ලබා ගැනීමට, ඉල්ලුම වැඩි කර ගැනීමට පමණක් නොව ජාත්‍යන්තර වෙළඳපොළට ඇතුළු වීමට සුදුසුකමක් ලෙස ද ස්වේච්ඡා ජාත්‍යන්තර සහතික (Voluntary Food Standards) අත්‍යවශ්‍ය බවයි. වර්තමානයේ FSSC 22000, BRCGS, Organic, Halal මෙන්ම SMETA වැනි සමාජ සුබසාධනය සම්බන්ධ ජාත්‍යන්තර සහතික පැවතීම ද සුදුසුකමක් බවට පත්වීමට හේතුව නම්, සතුන්ට වදහිංසා කිරීම තහනම් වූ පසුබිමක, සමහර රටවල පොල් කැඩීමට පුහුණු කළ වඳුරන් යොදා ගැනීමයි.



මෙම කර්මාන්තය සඳහා ඇති ප්‍රධාන අභියෝගය ලෙස අමුද්‍රව්‍ය හිඟය ද, ස්වේච්ඡා සහතික ලබා ගැනීමේදී ඇති වන ප්‍රධාන අභියෝග ලෙස පුහුණු කාර්ය මණ්ඩලයක් නොමැති වීම, සේවකයින්ගේ හැසිරීම වෙනස් කිරීමට අපහසු වීම, සහ මෙම සහතික ලබා ගැනීමට අධික පිරිවැයක් දැරීමට සිදුවීම ද හැඳින්විය හැක. මෙම නිෂ්පාදන අපනයන දාමයේ ප්‍රධාන පාර්ශවකරුවන් ලෙස වගාකරුවන්, නිෂ්පාදකයින්, අපනයනකරුවන්, පොල් සංවර්ධන අධිකාරිය, අපනයන සංවර්ධන මණ්ඩලය, ප්‍රමිති ආයතන, විශ්වවිද්‍යාල හා තාක්ෂණික ආයතන මෙන්ම පාරිභෝගිකයින් ද හඳුනාගත හැක. අපනයන අභියෝග ජය ගැනීමට නම් සියලුම පාර්ශවකරුවන් සාමූහිකව කටයුතු කළ යුතුය.

මෙවන් පසුබිමක මෙම ක්ෂේත්‍රයෙහි ආයෝජනය ඉතා වාසි සහගතය. නව නිෂ්පාදන හඳුන්වාදීම, පොල් වගාව සඳහා ආයෝජනය, කාබනික පොල් වගාවට යොමු වීම, පොල් නිෂ්පාදන අපනයන ව්‍යාපාරයක් ආරම්භ කිරීම නැණවත් ආයෝජන අවස්ථා ලෙස නිර්දේශ කළ හැක.

ව්‍යාපාරයක් වුවද අපනයන ක්ෂේත්‍රයේදී ව්‍යාපාරය විසින් නියෝජනය කරන්නේ නිෂ්පාදිත රටයි. එබැවින් සියලුම අපනයනකරුවන් රටෙහි නාමයට කැලලක් නොවන පරිදි තම නිෂ්පාදන නිසි ප්‍රමිතියෙන් හා ගුණාත්මකභාවයෙන් වෙළඳපොළට නිකුත් කිරීම ඉතා වැදගත් වේ. එසේ නම් සාමූහික ප්‍රයත්නයක් තුළින් සංවර්ධිත රටක් කරා යන ගමන් මගේ තවත් වැදගත් පියවරක් ලෙස පොල් අපනයන ආදායම දෙගුණ කර ගැනීමට සැවොම කැපවෙමු. දැනගෙන යොදවමු. යහමින් උපයමු.

ක්‍රීඩා ශක්තියට නව ජවයක් ගෙන එන බීට්රූට්



නුවන් සම්පත් බණ්ඩාර

දිනෙන් දින උණුසම් වන ක්‍රීඩා ලොව ජයගැනීම වත්මන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හමුවේ ඇති විශාල අභියෝගයකි. මෙහිදී විජලනය මගහරවා ගැනීම හා ශක්තිය ලබා ගැනීම උදෙසා බොහෝ ක්‍රීඩකයින් ක්‍රීඩා පාන භාවිතය සඳහා යොමු වී ඇත.

නමුත් දැනට වෙළඳපොළේ පවතින අතිබහුතරයක් ක්‍රීඩා පාන කෘත්‍රිම වර්ණක සහ රසකාරක යොදාගෙන නිෂ්පාදනය කර ඇත. මේ හේතුවෙන් දිගුකාලීනව හෘද රෝග, ස්නායු ආබාධ සහ අධිපෝෂණය වැනි ගැටලු ඇතිවීමේ ඉහළ අවදානමක්ද පවතී.

තොරතුරු සන්නිවේදනයේ ශීඝ්‍ර දියුණුවත් සමග, බොහෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන් තම සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව වඩාත් ප්‍රවේශම් වීමේ නව රටාවක්ද සමාජය තුළින් ඉස්මතු වී ඇත. මේ හේතුවෙන් ස්වාභාවික අමුද්‍රව්‍ය මූලික කරගත් ක්‍රීඩා පානයක අවශ්‍යතාව විද්‍යාත්මක මෙන්ම ජාතික අභියෝගයක්ද වී ඇත.



මෙම ගැටලුවට පිළිතුරු ලෙස ආහාරමය නයිට්‍රේට්, ඛනිජ ලවණ (Na^+, K^+) සහ කාබෝහයිඩ්‍රේට් වලින් පොහොසත් බීට්රූට් මූලික කරගත් ක්‍රීඩා පානයක් නිපදවීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.

ආහාරමය නයිට්‍රේට් මගින් ඔබට ලැබෙන වාසි:

- රුධිර ගලනය වැඩිදියුණු කිරීම
- රුධිර පීඩනය පාලනය කිරීම
- කාර්යසාධනය වැඩිදියුණු කිරීම

මෙතෙක් කරන ලද අධ්‍යයනයන්ට අනුව ක්‍රීඩා කාර්යසාධනය වැඩිදියුණු කිරීමට නයිට්‍රේට් 500 mg ක් ලබා ගැනීම ප්‍රශස්ත පරාසයේ ඇති බව හඳුනාගෙන ඇත. එබැවින් එම නයිට්‍රේට් ප්‍රමාණය සැපයීමට තරම් ප්‍රමාණවත් බීට්රූට් ස්කන්ධයන් යොදාගෙන ක්‍රීඩා පානය සැකසීමට සිදු විය.

වාණිජමය පැස්ටරීකරණ තත්ත්වයන් යොදාගෙන, අහිතකර ක්ෂුද්‍ර ජීවීන්ගෙන් අවම කරගෙන ඇති අතර, ආහාරයට සුදුසු සිට්‍රික් අම්ලය යෙදීමෙන් මෙහි pH අගය පහත දමා ඇත. එමගින්ද ක්‍රීඩා පානයේ කල්පැවැත්ම වැඩිදියුණු කරන අතර ආහාර සුරක්ෂිතභාවයද ඉහළ දමා ඇත. මීට අමතරව CODEX, WHO නියමයන් අනුව යමින් ආහාර පරිරක්ෂක හිතකර මට්ටමින් එකතු කර ඇත.





ක්‍රීඩා පානයේ සාර්ථකත්වය පරීක්ෂා කිරීමට විශ්වවිද්‍යාල ක්‍රීඩක ක්‍රීඩිකාවන් 30 ක ප්‍රමාණයක් යොදාගනිමින් සති 4 ක කාලයක් මෙම ක්‍රීඩා පානය ලබාදුන් අතර එහිදී බීට්රූට් වල අඩංගු වන ස්වාභාවික නයිට්‍රේට් මගින් ක්‍රීඩක කාර්යසාධනය සැලකිය යුතු ලෙස වැඩි වන අන්දම පරීක්ෂණාත්මකව තහවුරු වීම අධ්‍යයනයේ කැපී පෙනෙන ලක්ෂණයකි.

මීට අමතරව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ රුධිර පීඩනය ප්‍රශස්ත මට්ටම් දක්වා පහත හෙළීමට ද බීට්රූට් මූලික කරගත් ක්‍රීඩා පානය සමත්වීම, පර්යේෂණයෙන් ලද මහඟු ජයග්‍රහණයකි.

මෙම නිෂ්පාදනය ශ්‍රී ලංකාවේ බීට්රූට් වගාවට අතිරේක වෙළඳපොළක් සපයන අතර ආහාර හා ක්‍රීඩා කර්මාන්තයට ස්වදේශීය වටිනාකමක් එකතු කරයි. දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළෙහි ද බීට්රූට් යොදාගත් ක්‍රීඩා පාන නොමැති නිසාවෙන් වෙළඳපොළ තරගය ඉතා අවම මට්ටමක පවතී.

එසේම බීට්රූට් පමණක් නොව, තවත් ස්වාභාවික ආහාරවල පෝෂණ ගුණ ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ කිරීමේ මූලාරම්භය ලෙසද මෙම අධ්‍යයනය හඳුන්වා දිය හැකිය.

මෙම ක්‍රීඩා පානය ශරීරයට අහිතකර කෘත්‍රිම රසකාරක සහ වර්ණක වලින් තොරව නිපදවා ඇති බැවින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සෞඛ්‍යාරක්ෂිත බව ද තහවුරු කිරීමට සමත් වී ඇත.



පහතරට තේ වගාවට නව ව්‍යාධිජනකයෙක්ගේ ආගමනයක් !



හෙළමිණි ටිකිරි කුමාරි විජේකෝන්

තේ යනු යටත් විජිත සමයේ පටන් ශ්‍රී ලංකාවට ඉහළ කීර්ති නාමයක් ගෙනදුන්, ශ්‍රී ලංකාව නියෝජනය කරන සලකුණක් බඳු වූ වටිනා බෝගයක්. ඒ නිසාම එහි ආර්ථික සහ විද්‍යාත්මක වටිනාකමත් බොහෝ ඉහළ මට්ටමක පවතිනවා. ඒ නිසාම නව රෝගයක් තේ වැනි බෝගයක හටගත් විට එය මිනිස් පරිභෝජනයට හානියක් නොවන අයුරින් මර්දනය කිරීම අපගේ වගකීමක්.

පහතරට තේ වගාවේ අලුත්ම රෝගයක් මෑතකදී වාර්තා වුණා. ඒ තේ පැළ තවාන්වල හටගත් පත්‍ර ලප රෝගයක් (Leaf spot). මේ රෝගයේ ගැටලුව වූයේ දින කිහිපයක් යනවිට තේ පැළවල පත්‍ර කහ පැහැ ගැන්වී හැලී යාම. තේ පැළ තවානක් වඩාම නීරෝගී විය යුතු වන්නේ වගාවකට අවශ්‍ය පැළ සියල්ලම පාහේ ලබාගන්නේ පැළ තවාන්වලින් වෙන නිසයි. ඒ අවධියේදීම රෝග වැළඳී තිබුණොත් සම්පූර්ණ වගාවම විනාශ වී යාමේ ඉඩකඩ පවතිනවා. තවාන් වල හටගත් මේ රෝගයේ රෝග කාරකයා, පාලනය කිරීම සඳහා යෙදිය හැකි පිළියම් සොයාගැනීම සඳහා රත්නපුර තේ පර්යේෂණායතනයෙන් මේ පහතරට තේ පැළ තවාන්වල හටගත් මේ රෝගයේ සාම්පල තලවකැලේ තේ පර්යේෂණායතනයට රැගෙන එනු ලැබුවා. ඒ අනුව මේ කාර්යභාරය පැවරුණේ ශාක ව්‍යාධිවේද අංශයට.

පළමුව රැගෙන ආ ආසාදිත පත්‍ර සාම්පල වලින් රෝගකාරකයා විය හැකි යැයි සැක කෙරෙන ක්ෂුද්‍ර ජීවීන් ඒකලනය (isolate) කරගනු ලැබුවා. එම ආසාදිත පත්‍ර කොටස් පාලිත තත්ත්ව යටතේ වගා මාධ්‍යවල රෝපණය කිරීමෙන් පසු දින කිහිපයකින් රෝපණය වී ඇති ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණය කරනු ලැබුවා. ඒ අනුව රූප විද්‍යාත්මක සමානතා සලකා දිලීර කාණ්ඩ තුනක් වෙන් වෙන්ව හඳුනාගනු ලැබුවා. එම ක්ෂුද්‍ර ජීවීන් තේ පත්‍ර සඳහා ව්‍යාධිජනකයන් වේ දැයි තහවුරු කරගැනීමට පර්යේෂණයක් සිදු කළා. උඩරට තේ ප්‍රභේද දෙකක සහ පහතරට තේ ප්‍රභේද එකක වශයෙන් තේ ප්‍රභේද තුනක වර්ධනයේ අවස්ථා තුනක ලපටි, මධ්‍යස්ථව මේරූ සහ මෝරන ලද පත්‍ර ඒ සඳහා යොදාගෙන එම පත්‍ර වලට වෙන වෙනම මේ ක්ෂුද්‍ර ජීවීන් කෘතිමව ආසාදනය කළ විට එක් කාණ්ඩයක් ව්‍යාධිජනක නොවන බව තහවුරු කරගැනුණා. ඒ අනුව පර්යේෂණයේ ඉදිරි පියවර සඳහා ඉතිරි දිලීර කාණ්ඩ දෙක පමණක් යොදා ගැනීමට පියවර ගත්තා. එසේම මෙම රෝගය වඩාත් හානිදායක වන්නේ මේරූ අවධි වලට වඩා ළපටි පත්‍ර වලට බව තහවුරු වුණා. එමඟින්ද මෙම රෝගයේ වැදගත්කම අවධාරණය වූයේ නීරෝගී තේ දල්ල යනු ගුණාත්මක තේ කර්මාන්තයක මූලිකම අමුද්‍රව්‍යය වූ නිසයි.

රෝගය නව රෝගයක් නිසා නිසි පාලනයක් සිදු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග ගැන අවබෝධයක් තිබුණේ නැහැ. ඒ අනුව පාලිත තත්ත්ව යටතේ විවිධ සාන්ද්‍රණ වලින් දිලීර නාශක යොදන ලද මාධ්‍යවල (PDA) දිලීර කාණ්ඩ දෙකෙන් තෝරාගත් ප්‍රමුඛතම රූපානු දර්ශයන් දෙක වෙන වෙනම රෝපණය කරනු ලැබුවා. ඒ අනුව දිලීර නාශක ලෙස වඩා සාර්ථක වුණේ කොපර් ඔක්සයිඩ් 0.1% සහ කොපර් සල්ෆේට් 0.1% යි. තවදුරටත් රූප විද්‍යාත්මක ලක්ෂණ සඳහා බැලූ විට මෙම දිලීරවල ඒකලිතයන් (isolates) *Colletotrichum* ගණයට අයත් බව තහවුරු වුණා.

අණුක විද්‍යාත්මක පර්යේෂණ කිහිපයක් සිදු කළේ මෙම දිලීරවල විශේෂයන් සොයා ගැනීමේ අරමුණින්. ඒ අනුව මෙම දිලීරවල DNA නිස්සාරණය, PCR සහ ඇගරෝස් ජෙල විද්‍යුතාගමනයන් සිදු කළා. PCR මඟින් ගුණනය කරගත් DNA සහිත සාම්පල DNA අනුක්‍රම නිර්ණය (sequencing) සඳහා දකුණු කොරියාවේ Macrogen ආයතනයට ලබා දුන්නා. එම පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව පළමු ඒකලිතය *Colletotrichum aenigma* සඳහා 99.82% ක සමානකමක් දැක්වූ අතර දෙවන ඒකලිතය *Colletotrichum guiyangense*, *Colletotrichum cobbtiense*, *Colletotrichum tropicale* සහ *Colletotrichum ti* සඳහා 100% ක සමානතාවයක් පෙන්නුම් කළා. නමුත් ITS වැනි එක් පොදු කලාපයක් පමණක් යොදාගෙන DNA අනුක්‍රම නිර්ණය කිරීමෙන් වඩාත්ම නිවැරදිව දිලීර විශේෂය තහවුරු කර ගැනීම අපහසුයි. ඒ සඳහා විශේෂිත කලාප කිහිපයක් PCR මඟින් ගුණනය කරගත යුතු වෙනවා. එමෙන්ම BLAST search හි ප්‍රතිඵල අනුව වැඩි ප්‍රතිශතවල සමානතා දැක්වූ ඇතැම් විශේෂයන් තේ වගාවේ ව්‍යාධිජනකයන් ලෙස ශ්‍රී ලංකාවෙන් වාර්තා වන්නේ පළමු වරට බව කිව හැකියි.

තවදුරටත් මෙම රෝගය සඳහා පරිසර හිතකාමී විසඳුමක් ලෙස කෘත්‍රිම රසායන ද්‍රව්‍ය වලින් තොරව ක්ෂුද්‍ර ජීවීන් මඟින් සිදු කළ හැකි මර්දනයක් සඳහා *Trichoderma* විශේෂයන් සමඟ පාලිත තත්ත්ව යටතේ ඒකලිතයන් වෙන වෙනම රෝපණය කර පර්යේෂණයක් සිදු කළා. එයද සාර්ථක වෙමින් භාවිත කළ සියලුම *Trichoderma* දිලීර මඟින් ඒකලිතයන් දෙකටම එරෙහිව 55% කට වැඩි නිෂේධන ප්‍රතිශතයක් ලබාදීමට සමත්වුණා.

කෙසේ නමුත් ශ්‍රී ලාංකීය තේ සන්නාමය ජාත්‍යන්තරව සහ ජාතිකව ඉහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා බෝග විද්‍යාත්මක සහ ආහාර විද්‍යාත්මක පර්යේෂණ ඔස්සේ මෙවැනි රෝග වලින් වගාවට විය හැකි බලපෑම් අවම කරගැනීම මෙන්ම වඩා ගුණාත්මක තේ වගාවන් සහ අස්වැන්නක් සඳහා විශේෂිත දායකත්වයක් ලබාදෙනවා. ඒ සඳහා ශ්‍රී ලාංකික තේ ආශ්‍රිත පර්යේෂණයන්හි නියමුවා වන තලවකැලේ තේ පර්යේෂණායතනයෙන් ලබාදෙන දායකත්වය ද අතිවිශාල යි.



This is a non-technical summary of the project report titled "Isolation and identification of fungal pathogen/s causing a newly reported leaf spot disease in tea (*Camellia sinensis* (L) O. *Kuntze*) in Sri Lanka" supervised by Prof. D.M. De Costa, Department of Agricultural Biology, Faculty of Agriculture, University of Peradeniya. *dmdcosta@agri.pdn.ac.lk

හුරු පුරුදු නමුත් නුපුරුදු කොල්ලු




K.M.R.R.N.B.C.S.K. රාජගුරු

ශ්‍රී ලංකාවේ ළමයින් 36.6-37.4% හා වැඩිහිටියන් 2.6-11% ක් අතර ප්‍රමාණයක් පෝෂණ ඌනතාවලින් පෙළෙන බව ඔබ දන්නවාද?

එම දත්ත ජාතික පෝෂණ හා ක්ෂුද්‍ර පෝෂණ සංගණන (2022) දත්තවලට අනුව දක්වා ඇත. එසේ වීමට විශාල හේතුවක් වන්නේ ආහාරවලින් අවශ්‍ය ප්‍රමාණයට ප්‍රෝටීන නොලැබීම මෙන්ම ගුණාත්මක ප්‍රෝටීන ලබා නොගැනීමයි. ප්‍රෝටීන යනු ශරීරයේ වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන ප්‍රධාන පෝෂක සංඝටකයකි. ආර්ථික, සාමාජීය හා සෞඛ්‍යමය ගැටලු මේ සඳහා මූලික වුවත්, ප්‍රමාණවත් ලෙස ප්‍රෝටීන ශරීරයට ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

ඔබට හුරු පුරුදු කොල්ලු තුළ අවශ්‍ය පෝෂක සංඝටක අන්තර්ගත වන බව ඔබ දන්නවාද?



කොල්ලු කොල්ලු (*Macrotyloma uniflorum*) ලෙස හඳුන්වනු ලබන මාංශ බෝගය ශ්‍රී ලංකාව තුළ මහා පරිමාණයෙන් වගා කරනු නොලැබුවත් කුරුණෑගල, මොණරාගල, හම්බන්තොට සහ බදුල්ල වැනි දිස්ත්‍රික්කවල කුඩා පරිමාණයෙන් වගා කරනු ලබයි. මෙම මාංශ බෝග බීජයේ පෝෂ්‍ය පදාර්ථ රාශියක් අඩංගු වේ. විශාල ප්‍රමාණවලින් කාබෝහයිඩ්‍රේට (51.9–60.9%), ප්‍රෝටීන (17.9–25.3%), මෙන්ම කුඩා ප්‍රමාණවලින් මේදය (0.45–1.25%), අයන, විටමින් සහ ප්‍රතිඔක්සිකාරක සංඝටක අඩංගු වේ. නමුත් කොල්ලු බීජ දැඩි ගතියකින් යුක්ත වීම මෙහි පරිභෝජනය අඩුවීමට බලපා ඇත. සුළු වශයෙන් අඩංගු සමහර සංඝටක (ටැනින්ස්, පයිටික් අම්ල) හේතුවෙන් පෝෂක සංඝටක ශරීරයට උරා ගැනීම අඩාල වේ.

මේ නිසා කොල්ලු ආහාරයට නුසුදුසුද? කොහෙත්ම නැත. ආහාරය පිළියෙළ කිරීමට පෙර,


- දියේ පෙහවීම (පිරිසුදු ජලයේ පැය 18 ක් පමණ)
- ප්‍රරෝහණය කිරීම (පිරිසුදු ජලයේ පැය 48 ක් පමණ)
- බැදීම

මඟින් මෙහි ඇති පෝෂණය උරා ගැනීමට බාධා කරන සංඝටක අවම කරගත හැකිය. කොල්ලු බීජවල ඇති දැඩි බවද මේ මඟින් අඩු වේ.

අපේ රටට විදේශ විනිමය ලබා ගැනීමට මේ කොල්ලු දායක කරගත හැකි බව ඔබ දන්නවාද?

වර්තමාන සමාජයේ, ශාකමය ප්‍රෝටීන අන්තර්ගත කළ ආහාරවලට, නිර්මාංශ ආහාර පරිභෝජනය කරන්නන් අතර විශාල ඉල්ලුමක් ඇති බව නොරහසකි. කොල්ලු පිටි කර එමඟින් ප්‍රෝටීන නිස්සාරණය කිරීම තුළින් එහි ඇති ආර්ථික වටිනාකම පස් ගුණයකින් පමණ වැඩි වේ. එසේ නම් දෛනික ආහාර වේලේ සිට විදේශ විනිමය ඉපයීම දක්වා පුළුල් විභවයක් ඇති මේ භෝගයෙන් ගත හැකි ප්‍රයෝජන රාශියකි. එය අධ්‍යයනය කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ විය.

අපගේ පර්යේෂණයෙන් කොල්ලු පිටිවලින් නිස්සාරණය කරගත් ප්‍රෝටීන මඟින් ආහාරයක ඇති ප්‍රෝටීන මට්ටම ඉහළ දැමිය හැකිදැයි යන්න ගවේෂණය කිරීම සිදු කරන ලදී. මේ ප්‍රෝටීන කුඩු හේතුවෙන් පෝෂණ ගුණයට ඇතිවන වටිනාකම මෙන්ම ආහාරයට ඇතිවෙන අනෙකුත් බලපෑම් ගැනද මෙහිදී අවධානය යොමු විය. පෙර සැකසුම් කළ ආහාර ලෙස වෙළෙඳපොළේ ඇති nutritional bar වැඩිදියුණු කිරීමට ඇති හැකියාව මෙහිදී අධ්‍යයනයට ලක් කරන ලදී. එම පර්යේෂණයේ නිරීක්ෂණවලින් නිගමනය වූයේ ආහාරයේ ප්‍රෝටීන ප්‍රමාණය ඉහළ දැමීමට මෙන්ම ආහාරයේ කැලරි ප්‍රමාණය වැඩි කිරීමටද මෙම නිස්සාරණය කළ ප්‍රෝටීන භාවිත කළ හැකි බවයි. එමෙන්ම එසේ සැකසූ ආහාරයේ පරිරක්ෂණ (කල්තබා ගැනීමේ) ගුණය ඉතා ඉහළ බවත් සොයාගන්නා ලදී.





මෙසේ පිළියෙළ කරගත් nutritional bar වල රසයට මේ ඇතුළත් කළ ප්‍රෝටීන කුඩුවලින් වන බලපෑම අඩු බවත් එය නොගණිය හැකි බවත් අනාවරණය විය.

මෙම සොයාගැනීම්වලින් තහවුරු වූයේ නිස්සාරණය කළ කොල්ලු ප්‍රෝටීන විවිධ අවශ්‍යතා අනුව ආහාරවලට එක් කරගත හැකි බවයි. එමෙන්ම කොල්ලු බීජ දෛනික ආහාරයට එකතු කරගත හැකි ඉතාමත් වටිනා මාංශ බෝගයක් යන්න තහවුරු විය.

සත්ව ගොවිපල සෞඛ්‍යය සඳහා ස්වභාවික විසඳුමක්: දුම්කොළ අපද්‍රව්‍ය මගින් පරිසර හිතකාමී විෂබීජ නාශකයක්



D.M.L.T.J. දිසානායක

රෝග කාරකයන් සහ රසායනික ද්‍රව්‍යවල ගැටලුව

සත්ව පාලනයේදී සතුන්ගේ සෞඛ්‍යය පවත්වා ගැනීම අතිශයින් දුෂ්කර කටයුත්තකි. බැක්ටීරියා ආසාදන නිසා සතුන්ගේ ඵලදායිතාවයට හානි වන අතර, ගොවීන්ට විශාල මූල්‍ය පාඩුවක් සිදු වේ. මෙයට පිළියම් වශයෙන්, ගොවීන් සාමාන්‍යයෙන් කුඩු සහ උපකරණ පිරිසිදු කිරීමට ප්‍රබල, කෘත්‍රිම රසායනික විෂබීජ නාශක මත යැපේ. එහෙත්, මෙම රසායනික ද්‍රව්‍යවලට ආවේණික වූ ගැටලු තිබේ. ඒවා නම්, කාලයත් සමඟ ඒවායේ කාර්යක්ෂමතාව අඩු විය හැක. ඒවායේ පරිසර දූෂණ අවදානම අදිකය. සතුන්ට සහ සත්ව නිෂ්පාදන පරිභෝජනය කරන මිනිසුන්ට විෂ සහිත අවශේෂ ඇති කළ හැකි අවදානමක් පවතී. අපගේ ගොවිපලවල් පිරිසිදුව තබා ගැනීමට සහ ආහාර සැපයුම ආරක්ෂා කිරීමට, අපට වඩා ආරක්ෂිත, වඩාත් පරිසර හිතකාමී විකල්පයක් අවශ්‍ය වේ.

පරිසර හිතකාමී විසඳුම: දුම්කොළ අපද්‍රව්‍ය සාරය

දුම්කොළ කර්මාන්තයේ අතුරු ඵලයක් වන මෙම අපද්‍රව්‍ය ඉවතලනවා වෙනුවට වඩාත් හොඳ විසඳුමක් ලෙස භාවිතා කල හැකිය. මෙම පර්යේෂණය මඟින් එය දුම්කොළ අපද්‍රව්‍ය සාරය, ස්වාභාවික, 100% කාබනික, පිරිසිදු කාරකයක් බවට පත් කිරීම විමශර්නය කරන ලදී. මෙම නව්‍ය අදහස එකවර ගැටලු දෙකක් විසඳයි: එය තිරසාර, පරිසර හිතකාමී විෂබීජ නාශකයක් සපයන අතරම, කෘෂිකාමීක අපද්‍රව්‍ය සඳහා වටිනා කමක් එක් කරයි (අපද්‍රව්‍ය වටිනා කම්කරණය).

ස්වභාවික විෂබීජ නාශකය පරීක්ෂා කළ ආකාරය

මෙම දුම්කොළ අපද්‍රව්‍ය සාරයෙහි කාර්යක්ෂමතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණය ප්‍රධාන කොටස් දෙකකින් යුත් අධ්‍යයනයක් සිදු කරන ලදී.

1. රසායනාගාර පරීක්ෂණ

a. ප්‍රශස්ත සාන්ද්‍රණය සොයා ගැනීම

පළමුව, මෙම දුම්කොළ අපද්‍රව්‍ය සාරය ගෙන එය රසායනාගාරයේදී ආහාර මඟින් බෝවන බැක්ටීරියා වගර් දෙකකට එරෙහිව පරීක්ෂා කරන ලදී. ඒවා නම් Escherichia coli (ග්‍රෑම් - සෘණ රෝග කාරකයක්) හා Staphylococcus aureus (ග්‍රෑම් - ධන රෝග කාරකයක්). බැක්ටීරියා වර්ධනය නැවැත්විය හැකි අඩුම සාන්ද්‍රණය සොයා ගන්නා තෙක් මෙම දුම්කොළ අපද්‍රව්‍ය සාරය තනුක කරන ලදී - මෙය අවම නිෂේධන සාන්ද්‍රණය (Minimum Inhibitory Concentration - MIC) ලෙස හැඳින් වේ.

සොයා ගැනීම: බැක්ටීරියා වගර් දෙක සඳහාම අවම නිෂේධන සාන්ද්‍රණය වූයේ 12.5% වන දුම්කොළ අපද්‍රව්‍ය සාර සාන්ද්‍රණයයි.

b. වේග පරීක්ෂණය

මෙමගින් බැක්ටීරියා විනාශ කිරීමට කොපමණ වේලාවක් ගත වේද යන්න සොයන ලදි. මෙහිදී 12.5% සාන්ද්‍රණයෙන් යුත් ද්‍රාවණය හොඳින්ම ක්‍රියා කිරීම සඳහා බැක්ටීරියා සමඟ ස්පශර්ව තැබිය යුතු කාලය කොපමණ දැයි අපට දැන ගැනීමට අවශ්‍ය විය.

සොයා ගැනීම: සාරය එහි උපරිම බැක්ටීරියා නාශක බලපෑම ලබා ගැනීම සඳහා, එයට මිනිත්තු 120 ස්පශ කාලයක් අවශ්‍ය විය.


2. ගොවිපල පරීක්ෂණ: සත්‍ය ලෝකයේ සාක්ෂි

අවසාන, තීරණාත්මක පියවර වූයේ සැබෑ වාණිජ කුකුළු ගොවිපලවල් දෙකකදී 12.5 % වන දුම්කොළ අපද්‍රව්‍ය සාරය පරීක්ෂා කිරීමයි. එහිදී ගොවිපවල් පිරිසිදු කිරීමේ වාණිජ රසායනික විෂබීජ නාශකයක් සමඟ සෘජුවම සංසන්දනය කරන ලදී. මෙහිදී පිරිසිදු කිරීමට පෙර, සමාන්‍ය ජලයෙන් පිරිසිදු කිරීමෙන් පසු හා විෂබීජහරණය කිරීමෙන් පසු ගොවිපල පොළව මත තිබූ බැක්ටීරියා පරීක්ෂා කරන ලදී.


නිගමනය වූයේ: 12.5% වන දුම්කොළ අපද්‍රව්‍ය සාරය මගින් ගොවිපල පොළවේ ක්ෂුද්‍රජීවී ඝනත්වය සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කරන ලදි. ඇත්ත වශයෙන්ම, එහි පිරිසිදු කිරීමේ කාර්ය සාධනය වාණිජ විෂබීජ නාශකයට සැසඳිය හැකි මට්ටමක පැවතුණි.

මෙම අධ්‍යයනය මඟින් සනාථ කරන්නේ 12.5% වන දුම්කොළ අපද්‍රව්‍ය සාර ද්‍රාවණය, මිනිත්තු 120 ස්පශර් කාලයක් සමඟ, සත්ව ගොවිපල ජෛව ආරක්ෂණය සඳහා ස්වාභාවික, 100% කාබනික, ආරක්ෂිත, සහ ඵලදායී පරිසර හිතකාමී විෂබීජ නාශකයක් බවයි. මෙම කෘෂිකාමීක අතුරු ඵලය භාවිත කිරීමෙන්, අපට වඩා පිරිසිදු, වඩා තිරසාර ගොවිතැන් ක්‍රමයක් කරා ගමන් කළ හැකි අතර, අපගේ සතුන් සහ පරිසරය යන දෙකම නිරෝගීව තබා ගනිමින් කෘත්‍රිම රසායනික ද්‍රව්‍ය මත යැපීම අඩු කළ හැකිය.









ගොරකා සාරයේ සැඟවුණු කතාව

-මුත්‍රාගල් රෝගයට ස්වභාවදහමෙන් විසඳුමක්-



ඩී.ඩී. හේෂානි තිලකසිරි

ඔබට තිබෙන කොන්දේ වේදනාවකට එසේත් නැතිනම් යටි බඩේ වේදනාවකට මුත්‍රාගල් (වකුගඩු ගල් රෝගය) හේතු විය හැකි බව ඔබ දන්නවාද?

මෙම වකුගඩු ගල් රෝගය ශ්‍රී ලංකාව තුළත් ලොව පුරාමත් වර්ධනය වෙමින් පවතින ඉතා වේදනාකාරී සෞඛ්‍ය ගැටලුවක් බවට පත් වී තිබේ. නවීන ප්‍රතිකාර ක්‍රමවේදයන් ලෙස මුත්‍රාගල් කුඩු කිරීම (Lithotripsy) සහ ශල්‍යකර්ම භාවිත කරන නමුත්, ගල් නැවත ඇති වීමේ අවදානම ඉහළ වේ.

එසේම මුත්‍රාගල්වල රසායනික සංයුතිය අනුව ඒවා කැල්සියම් ඔක්සලේට් ගල්, යූරික් ඇසිඩ් ගල්, ස්ට්‍රුවිට් (Struvite) ගල් සහ මිශ්‍ර ගල් ලෙස ප්‍රධාන ආකාර හතරකට බෙදේ. පෙර කරන ලද පරීක්ෂණවලට අනුව ලොව ජනගහනයේ මුත්‍රාගල් රෝගීන්ගෙන් 80%ක් පමණ කැල්සියම් ආශ්‍රිත මුත්‍රාගල්වලින් පීඩා විඳිති.

කෘතිම ඖෂධ වෙනුවට මෙම ගැටලුවට විසඳුමක් ලබා දීමට ගොරකා අඩංගු පානයකට හැකියාව ඇති බව ඔබ සිතනවාද?

එවැනි ගොරකා අඩංගු පානයක් පුද්ගලයන්ගේ මුත්‍රාවල සංයුතියට බලපෑම් කරන්නේ කෙසේද යන්න සොයා බැලීමට සිදුකළ සායනික සහ විද්‍යාගාර පරීක්ෂණවල ප්‍රතිඵල පහත ලිපියෙන් ඔබට ගෙන එයි.

මෙම පරීක්ෂණයේ මූලිකම අදියරේදී අගය එකතු කරන ලද රසවත් ගොරකා පානයක් සඳහා විවිධ අනුපාත ඔස්සේ අමුද්‍රව්‍ය එකතු කරගත් මිශ්‍රණ කිහිපයක් පිළියෙළ කළ අතර සංවේදී ඇගයීමකින් (Sensory Evaluation) පසු වඩාත් උචිත වූ මිශ්‍රණය තෝරා ගන්නා ලදී. ඉන්පසු, දෙවන අදියර ලෙස එසේ සාදාගත් මිශ්‍රණයට සෑදුණු මුත්‍රා ගල් දිය කිරීමට සහ ශරීරය තුළ මුත්‍රා ගල් නැවත ඇති වීමේ හැකියාව වැළැක්වීමට හැකියාවක් ඇත්දැයි විද්‍යාගාර පරීක්ෂණ කිහිපයක් ඔස්සේ අධ්‍යයනය කරන ලදී.



ඉන්පසු තෙවන අදියරේදී සිදු කරන ලද්දේ එසේ විද්‍යාගාර තුළ තහවුරු කළ ගොරකා මිශ්‍රණය සායනිකව තහවුරු කර ගැනීමයි.

එසේ සායනිකව තහවුරු කරගැනීම සඳහා අවුරුදු 20 - 30ත් අතර පසුවන නිරෝගී පිරිමි පුද්ගලයන් සහභාගි කරවා ගන්නා ලදී. ප්‍රධාන වශයෙන් ගොරකා අඩංගු මිශ්‍රණයක් පානය කිරීම මගින් පුද්ගලයන්ගේ මුත්‍රාවල සංයුතිය, රුධිරයේ සංයුතිය සහ මානවමිතික මිනුම් (බර, ඉණ වටප්‍රමාණය) කෙසේ වෙනස් වූවාද යන්න මෙම අධ්‍යයනයේදී සොයා බැලීය. මෙහිදී ගොරකා පානය දින 16ක් නොකඩවා පානය කිරීමට ලබා දුන් අතර, අධ්‍යයන කාලසීමාවට පෙර සහ පසු ලබාගත් මිනුම් සංසන්දනය කිරීමෙන් ප්‍රතිඵල සොයා බැලීය. එහිදී ලැබුණු ප්‍රතිඵල අදහගත නොහැකි විය.

එහි ප්‍රධාන ප්‍රතිඵලයක් ලෙස, ගොරකා පානය මගින් මුත්‍රාවල ඔක්සලේට් අයන ප්‍රමාණය අඩු කළ බව ඔප්පු විය. මුත්‍රාවල අඩංගු ඔක්සලේට් අයන, කැල්සියම් ඔක්සලේට් ගල් සෑදීමට ප්‍රධාන හේතුවක් වන අතර, එම අයන අඩු වීම මගින් මුත්‍රා ගල් සෑදීමේ අවදානම අඩු කර ගත හැක. එසේම එමගින් මුත්‍රාවල අඩංගු රුධිරයේ සුදු රුධිර සෛල යම්කිසි ප්‍රමාණයක අඩු වීමක් දක්නට ලැබුණු අතර, එය මුත්‍රා මාර්ගයේ ආසාත්මිකතා අඩු වීමට උපකාරී වේ.



ඒ අනුව, මුත්‍රාගල් සෑදීම සහ නැවත ඇති වීම වැළැක්වීම මෙන්ම සෑදුණු මුත්‍රාගල් දිය කිරීමටද ගොරකා මිශ්‍රණයට හැකියාවක් ඇති බව සනාථ විය.

ගොරකාවල අඩංගු කුමන රසායනික සංයෝග මෙයට දායක වන බව ඔබ සිතන්නෙහිද? එයට හේතුව වන්නේ ගොරකාවල අන්තර්ගත හයිඩ්‍රොක්සි සිට්‍රික් අම්ලය, ෆිනෝල් (Phenol) සහ ෆ්ලෙවනොයිඩ්ස් (Flavonoids) වැනි ජෛව ක්‍රියාකාරී සංයෝගයන්හි ඇති හැකියාව නිසාය.

එම පරීක්ෂණවලින් අපට තහවුරු වූයේ එසේ අප පිළියෙල කරගත් ගොරකා මිශ්‍රණය සෑදුණු මුත්‍රාගල් දිය කිරීමට මෙන්ම ශරීරය තුළ මුත්‍රා ගල් නැවත ඇති වීම වැළැක්වීමට හැකියාව තිබූ බවයි. එසේම, එම හැකියාව වෙළෙඳපොළේ දැනට පවතින ප්‍රධානම ඖෂධයට වඩා ඉහළ බවත් ඔප්පු විය.



ඉතින්, ස්වභාවදහමේ මෙවන් විශ්මයජනක ශාකසාරයන් තිබියදී ඔබ තවදුරටත් මුත්‍රාගල් රෝගයට කෘතිම ඖෂධ භාවිත කරනවාද? තීරණය ඔබ සතුය....

ගොවි ජනතාව දැනුවත් විය යුතු ආක්‍රමණශීලී "කම්බි තණ" ශාකය



වර්ණිත ඡයන් දසනායක

ගොවි ජනතාව අතර "කම්බි වැල්" හෝ "කම්බි තණ" ලෙස හැඳින්වෙන *Megathyrsus trichocladus* ශාකය විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාත, සබරගමුව පළාත හා බස්නාහිර පළාත කේන්ද්‍ර කොටගෙන වේගයෙන් ව්‍යාප්ත වන ආක්‍රමණශීලී ශාකයකි. ගවයන්ට සහ වෙනත් සත්ත්වයන්ට ආහාරයක් ලෙස භාවිතා කළ හැකි තණවලට සමාන බව පෙනෙන නමුත්, එය වයස්ගත වන විට සත්ත්වයන් විසින් ආහාරයට ගැනීම අතිශය අඩු වීමක් දක්වයි. මෙම තත්ත්වය කාණ්ඩ කිහිපයකින් පැහැදිලි කළ හැකිය.



රසය හා රුචියට බලපාන වෙනත් සංයෝග

කම්බි වැල් තුළ ආහාර රුචියට බලපාන, ස්වාභාවිකව පවතින රසායනික සංයෝග කිහිපයක් ඇත. උදාහරණ ලෙස ෆීනෝල්, සැපොනින්, කුමරින්, ක්විනෝන්, ටපරීනොයිඩ වැනි සංයෝග අන්තගර්ත වේ. ශාකය වයස්ගත වීමත් සමඟ මෙම සංයෝගවල මට්ටම ඉහළ යන බව විද්‍යාත්මකව හඳුනාගෙන ඇත. කුමරින් වැනි සංයෝග දීඝර්කාලීනව ශරීරගත වීම සෞඛ්‍යයට අහිතකර විය හැකිය.


ආකෘතිමය වෙනස්කම්

ශාකයේ වධර්නය වීමත් සමඟ පොළොව මට්ටමෙන් උස්ව මීටර 1 ක් පමණ ඉහළට වැඩෙන අතර, කඳ කොටස දැඩි හා පත්‍ර මතුපිට කෙඳි සහිත වේ. මෙම වෙනස්වීම් වැඩුණු ශාකය ආහාරයට ගැනීම අපහසු කරවන අතර ගවයන්ගේ මුඛ කුහරයේ ප්‍රදාහ තත්ත්ව ඇති කරයි. මෙම තෘණ ශාකයේ පත්‍ර කඳ කොටසට දරන අනුපාතය අඩු වීමත් සමඟ, තණවල මෘදු කොටස් ප්‍රමාණයෙන් අඩු වීම සත්ත්ව ආහාරයක් ලෙස රස හා රුචිකත්වය අඩු කරනු ලබයි.

පෝෂණ අගයන්හි පරිවතර්නය

මෙම ශාකය වයස්ගත වීමේදී විශේෂයෙන්ම මල් හටගැනීමත් සමඟ පෝෂණ අගයන් විශාල ලෙස වෙනස් වීම සිදුවේ. මල් හටගැනීමට පෙර අවධියේදී කම්බි වැල්හි ප්‍රෝටීන් හා ශක්ති අන්තගර්තය ඉහළ අගයක පවතී. නමුත් වයස්ගතවත්ම ශාකය තුළ තන්තු ප්‍රතිශතය (සෙලියුලෝස්, හෙමිසෙලියුලෝස්, ලිග්නීන්) ඉහළ යයි. මෙම තන්තු ශාකයේ දැඩි බව වැඩි කරමින් ගවයන්ගේ ආහාර රුචියට හා ජීණර් ක්‍රියාවලියට දැඩිව බලපෑම් එල්ල කරනු ලබයි.

වයස්ගතවීම සමඟ ලිග්නින් ප්‍රතිශතයේ වෙනස්කම්



පරිසරයට ඇති බලපෑම්

මෙම ශාකයේ අධික වධර්න වේගය නිසා පාලනය අසීරු වන අතරම පස හා අනෙකුත් තෘණ වගර්වල මෙන්ම ශාකවල වධර්නයට ද බාධා විය හැක.

ගොවි අංශයට උපදෙස්

ගොවි ජනතාව දැනගත යුතු වන්නේ මෙම ශාකය මල් හටගැනීමට පෙර වධර්ක අවධියේදී පෝෂණ අගයන් සහ රස ගුණාංග සාමාන්‍ය අගයක පවතින බැවින් වෙනත් තෘණ සමඟ මිශ්‍රණයක් ලෙසින් තාවකාලිකව පශු ආහාරයක් ලෙස භාවිතා කළ හැකි නමුත්, එය විශාල ප්‍රමාණයකින් වගා කිරීම හෝ දීඝර්කාලීන තණ ලෙස රෝපණය කිරීම නිදෙර්ශ නොකෙරේ.



සොසේජස්වල පොස්පේට් ලවණ සඳහා ස්වාභාවික ආදේශකයක් ලෙස සිට්‍රස් තන්තු



ජී. එම්. එස්. ලක්ෂාන්

සොසේජස් යනු වයස් භේදයකින් තොරව අප සියලු දෙනා භුක්ති විඳීමට කැමති මස්වලින් සැකසූ නිෂ්පාදනයකි. දීර්ඝ කාලයක් තිස්සේ ලෝකය පුරා වැදගත් ප්‍රෝටීන් ප්‍රභවයක් ලෙස සොසේජස් පවතිනුයේ එහි ආවේණික රසය, පිසීමේ පහසුව සහ කල්තබා ගැනීමට ඇති හැකියාව නිසයි. කෙසේ වෙතත්, සොසේජස්වල පොස්පේට් ලවණ වැනි කෘත්‍රිම රසායනික ආකලන අඩංගු වේ.

කෘත්‍රිම ආකලනවල ඇති අයහපත් සෞඛ්‍ය බලපෑම නිසාම අද පාරිභෝගිකයින් තමන් ආහාරයට ගන්නා දේ පිළිබඳව වඩාත් සැලකිලිමත් වෙමින් සිටින අතර, රසායනික ආකලන අඩු හෝ නොමැති ආහාර වැඩි වැඩියෙන් පරිභෝජනයට රුචිකත්වයක් දක්වයි. මෙලෙස ස්වාභාවික අමුද්‍රව්‍ය ආහාර නිෂ්පාදන සඳහා භාවිතය ප්‍රවර්ධනය කරන "Clean label" ලෙස හැඳින්වෙන ගෝලීය ප්‍රවණතාවක් නිර්මාණය වී තිබේ. එබැවින් වර්තමානයේ ආහාර නිෂ්පාදන කර්මාන්ත තම නිෂ්පාදනවල ගුණාත්මකභාවය පවත්වා ගත හැකි වඩාත් ආරක්ෂිත ස්වාභාවික විකල්ප සොයමින් සිටිති. පොස්පේට් ලවණවල පවතින ගුණාංග එලෙසම පවත්වා ගත හැකි සාර්ථක ස්වාභාවික ආදේශකයක් සොයා ගැනීම තවමත් ගැටලුවකි. අධිශීතකරණ තුළ ගබඩා කිරීමේදී සොසේජස්වල පෙනුම, රසය, වයනය (Texture) හානි නොවී නැවුම් බව ස්ථායීව තබා ගැනීම සඳහා මෙම පොස්පේට් ප්‍රධාන කාර්යයක් ඉටු කරයි. එබැවින් පොස්පේට් වෙනුවට ගන්නා ස්වාභාවික ආකලනයට මේ තත්ත්වයන් යටතේ නොවෙනස්ව ස්ථායී ලෙස පැවතීමේ හැකියාව තිබිය යුතු වේ.

දොඩම්, ලෙමන් වැනි පැණිරි කුලයේ පලතුරු වල ලෙලි සහ යුෂ නිස්සාරණයෙන් පසුව ඉතිරි වන පල්පවලින් සිට්‍රස් තන්තු (Citrus Fiber) නිෂ්පාදනය කරයි. මෙම තන්තු දොඩම් යුෂ නිෂ්පාදනයේ අතුරු ඵලයක් වන අතර සියුම්ව කුඩු කළ පවුඩර් ආකාරයෙන් වෙළෙඳපොළෙහි පවතී. සිට්‍රස් තන්තු වල සෙලියුලෝස්, හෙමි සෙලියුලෝස් සහ පෙක්ටින් බහුල වේ. එබැවින් සිට්‍රස් තන්තු වලට ජලය රඳවා තබා ගැනීමට, වයනය වැඩිදියුණු කිරීමට සහ ආහාර ඔක්සිකරණයෙන් ආරක්ෂා කිරීමට හැකියාව පවතී. මෙම ගුණාංග නිසා සියුම් ලෙස කුඩු කළ සිට්‍රස් තන්තු සොසේජස් සඳහා පොස්පේට් වලට ආදේශකයක් ලෙස භාවිත කළ හැකි බවට ඉඟියක් ලබා දෙයි. එබැවින් සිට්‍රස් තන්තු, පොස්පේට් ලවණ සඳහා ස්වාභාවික ආදේශකයක් ලෙස සොසේජස් නිෂ්පාදනයට යොදා ගැනීම කෙරෙහි මෙම පර්යේෂණය අවධානය යොමු කර තිබේ.

සම්පූර්ණයෙන් හෝ 80% ක් පොස්පේට් ලවණ ප්‍රතිස්ථාපනය කිරීමට සිට්‍රස් තන්තු වලට නොහැකි බව මූලික පර්යේෂණවලදී අනාවරණය විය. එබැවින් මෙම අධ්‍යයනයේදී, කුකුළු මස් සොසේජස් සඳහා 20%, 40%, සහ 60% යන මට්ටම්වලින් පොස්පේට්, සිට්‍රස් තන්තු සමඟ ප්‍රතිස්ථාපනය කරන ලදී. පසුව ඒවායේ භෞත-රසායනික, ක්ෂුද්‍රජීව විද්‍යාත්මක හා සංවේදක ගුණාංග පරීක්ෂා කරන ලදී. එහි ප්‍රතිඵල වඩාත් සාර්ථක විය. සිට්‍රස් තන්තු අඩංගු සොසේජස් ගබඩා කිරීම පුරාවට තෙතමනය සහිත නැවුම් බවක් සහ තද බවක් පවත්වා ගෙන ගිය අතර, ජලය රඳවා ගැනීමේ ධාරිතාවද ස්ථායීව පැවතුණි. මෙහි ඇති ස්වාභාවික ප්‍රතිඔක්සිකාරක ගුණ නිසා තන්තු එකතු කළ සාම්පලවල ලිපිඩ ඔක්සිකරණයද අඩු වී තිබුණි. සියලුම සාම්පල ක්ෂුද්‍රජීව විද්‍යාත්මකව ආරක්ෂිත වූ අතර, ගබඩා කාලය පුරාවටම හානිකර බැක්ටීරියා අනාවරණය නොවීය. පාරිභෝගික දෘෂ්ටිකෝණයකින් සිදු කළ සංවේදක ඇගයීමෙන් සාමාන්‍ය සහ සිට්‍රස් තන්තු එකතු කළ සොසේජස් අතර රසය, වර්ණය, වයනය හෝ සුවඳෙහි ප්‍රධාන වෙනස්කම් නොතිබිණි. 60% පොස්පේට් ප්‍රතිස්ථාපනයේදී පවා, පාලක පර්යේෂණය සමඟ සැලකිය යුතු වෙනස්කමක් නොමැති විය.

මෙම අධ්‍යයනයේදී, සැබෑ වාණිජ ගබඩා කිරීම සහ ප්‍රවාහන තත්ත්වයන් අනුකරණය කිරීම සඳහා ශීත කරන (-18 ^{0}C) සහ සිසිල් කරන (10-15 ^{0}C) චක්‍ර (Freeze - Thaw cycles) භාවිතා කරමින් සීතල දාම (Cold chain) අනුකරණය සිදු කරන ලදී. මෙම චක්‍ර අතරතුර, උෂ්ණත්ව වෙනස්වීම් සිට්‍රස් තන්තු සමඟ ප්‍රතිස්ථාපනය කළ සොසේජස්වල ගුණාත්මකභාවයට බලපාන ආකාරය අධ්‍යයනය කරන ලදී. මෙම ක්‍රියාවලිය සොසේජස් නිෂ්පාදනයේ සිට අවසන් පාරිභෝගිකයා දක්වා ළඟා වීමේදී සිදුවන සැබෑ තත්ත්වයන් යටතේ සිට්‍රස් තන්තු එකතු කළ සොසේජස්වල ස්ථායිතාව සහ අනෙකුත් ගුණාංග ඇගයීමට උපකාරී විය. ප්‍රතිඵලවලින් පෙනී ගියේ සිට්‍රස් තන්තු චක්‍ර 20කින් පසුව පවා ජලය රඳවා තබා ගැනීමට, ඔක්සිකරණය අඩු කිරීමට සහ වයනය නොවෙනස්ව පවත්වා ගැනීමට දායක වන බවයි.

මේ අනුව නිෂ්පාදනයේ ගුණාංගවලට හානි නොවන පරිදි කුකුළු මස් සොසේජස්වලට එකතු කරන පොස්පේට්වලින් 60% ක් දක්වා ඵලදායී ලෙස සිට්‍රස් තන්තු මඟින් ප්‍රතිස්ථාපනය කළ හැකි බව තහවුරු විය.



පොස්පේට් ලවණ



සිට්‍රස් තන්තු (Citrus Fiber)





This is a non-technical summary of the project report titled “Citrus fiber as a natural alternative to phosphate salt in frozen chicken sausages” supervised by Dr. P. Weththasinghe*, Department of Animal Science, Faculty of Agriculture, University of Peradeniya. * pabodhaw@agri.pdn.ac.lk

ගුණාත්මක බව රැක හානිය අවම කිරීමට: බෝංචි සඳහා ජල සිසිලන ක්‍රම



සදමිණී අඛේවික්‍රම

ශ්‍රී ලංකාව තුළ දෛනිකව පරිභෝජනය වන එළවළු වගර් අතර බෝංචි (*Phaseolus vulgaris* L.) යනු බහිජ ලවණ, විටමින් වැනි අත්‍යවශ්‍ය පෝෂ්‍ය ගුණයෙන් අනූන කෘෂි නිෂ්පාදනයක් වන අතර දෛනික පරිභෝජනය සඳහා ජනප්‍රිය ආහාරයකි. නමුත් අස්වනු නෙළීමේදී එහි පවතින අධික පරිවෘත්තීය ක්‍රියාකාරිත්වය හේතුවෙනුත්, ඉහළ ජල සංයුතිය හේතුවෙනුත් ඉතාමත් ඉක්මනින් ගුණ හානි වීමට ලක්වීම මගින් සැලකිය යුතු අස්වනු හානියක් පවතින එළවළු වගර්යකි. මෙම තත්ත්වය වතර්මානයේ ගොවීන්ට මුහුණ දීමට සිදුවන සුලභ අත්දැකීමක් බවට පත්වී ඇත.

ශ්‍රී ලංකාව තුළ එළවළු හා පළතුරු සඳහා දැනට ක්‍රියාත්මක වන අවිධිමත් පසු අස්වනු තාක්ෂණ ක්‍රමවේද සහ අවිධිමත් උෂ්ණත්ව පාලන ක්‍රියාවලි හේතුවෙන් බෝංචි වැනි ගුණ හානි වීමේ අවදානම අධික නිෂ්පාදනයන් ඉතා ඉක්මනින් මැලවීම, වණර් හානි වීම, මෙන්ම දුඹුරු ලප ඇති වීම හා දිලීර වැනි රෝගයන්ට ලක්වීම සුලභ සිද්ධියක් වේ. එමඟින් ගොවීන්ට හා වෙළෙන්දන්ට මෙන්ම පාරිභෝගිකයන්ටද විශාල අලාභයන්ට මුහුණ දීමට සිදුවේ. එමගින් සාර්ථක අස්වැන්නක් මගින් නිසි ප්‍රතිලාභ ලබා ගැනීමට පවතින හැකියාව අඩු වෙමින් පවතී. මෙම තත්ත්වයන් මඟහරවා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට නව පසු අස්වනු තාක්ෂණ ක්‍රමවේදයන් හඳුනාගත යුතුව ඇත.

මේ සඳහා පිළියමක් වශයෙන් සිසිලන ක්‍රමවේදයන්හි පවතින බලපෑම උපයෝගී කර ගැනීම මගින් ක්ෂේත්‍ර තාපය අවම කිරීමෙන් පරිවෘත්තීය ක්‍රියාකාරිත්වය, එන්සයිම ක්‍රියාකාරිත්වය වැනි ක්‍රියාවලි සීමා කිරීම මගින් ගුණ හානි වීම පාලනය කිරීමේ හැකියාවක් පවතී. මෙම අධ්‍යයනය මගින් බෝංචි සඳහා වන පසු අස්වනු හානිය අවම කිරීමට සිසිලන ක්‍රමයන්ගේ ඇති හැකියාව පයෙර්ෂණය කිරීම සිදු වූ අතර එමගින් ජල සිසිලන ක්‍රමය මගින් වඩාත් සාර්ථක බලපෑමක් පවතින බව වාතර්ා විය.

මෙහිදී නැවුම් බෝංචි 4°C පවතින සිසිල් ජලයේ කෙටි කාලයක් බහා තැබීම සිදු කරන අතර එමගින් බෝංචි අස්වැන්නේ ඇති තාපය වේගවත් සහ සාර්ථකව අවම කිරීමෙන් එහි අඩංගු ජෛව රසායනික සංයෝග මෙන්ම පෝෂණ ගුණාංගයන්ද ආරක්ෂා කිරීමත්, තන්තු වධර්නය පාලනය කිරීමටත් සමත් ප්‍රායෝගික තාක්ෂණික ක්‍රමවේදයක් ලෙස හඳුන්වා දිය හැකිය.

මෙම අධ්‍යයනයේදී වඩාත් සාර්ථක ප්‍රතිඵලයක් සඳහා ජල සිසිලන ක්‍රමය සමඟ ඇසුරුම් ක්‍රමයක් ලෙස අඩු ඝනත්ව පොලිතීන් ඇසුරුමක් යොදා ගැනීම මගින් වඩාත් සාර්ථක සහ දීඝර්කාලීන පරිරක්ෂණ හැකියාවක් ඇත. එමගින් ජල හානි වීම අවම කරමින් බෝංචි මැලවීම පාලනය කිරීමත්, පළිබෝධ හානිය අවම කිරීමත්, කහ පැහැ වීම අවම කිරීමත් සිදු වේ. එමගින් ආසන්න වශයෙන් දින 15-20 ක් අතර කාලයක් නැවුම් බෝංචි අස්වැන්නක් පවත්වා ගත හැකි බව සනාථ විය. වඩාත් සාර්ථක ප්‍රතිඵල සඳහා අස්වනු නෙළාගත් අවස්ථාවේදීම මෙම ක්‍රමය උපයෝගී කර ගැනීමෙන් සෛල ක්‍රියාකාරිත්වය අවම කිරීමෙන් වඩාත් ඉහළ නැවුම් බවක් පවත්වා ගත හැකිය.



ශ්‍රී ලංකාව තුළ ලබාගන්නා බෝංචි අස්වැන්නෙන් පසු අස්වනු හානි හේතුවෙන් ඉවතලන ප්‍රමාණය 30%-40% පමණ වේ. එම හානිය අවම කර ගැනීමට ගොවීන්ට මෙන්ම වෙළෙඳපොළ සඳහාද මෙම ක්‍රමය සාර්ථක ප්‍රායෝගික ක්‍රමයක් ලෙස හඳුන්වා දිය හැකිය. තවද මෙයට වියදම් අධික ශීතාගාර පද්ධති අවශ්‍ය නොවන, සරලව ක්‍රියාත්මක කළ හැකි මට්ටමේ ක්‍රියාවලියක් බැවින් වැඩි ආදායමක් ලබා ගැනීමටත්, පාරිභෝගිකයාට උසස් ගුණාත්මක නිෂ්පාදනයන් ලබාදීමටද හැකියාවක් ඇත. තවද මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාව තුළ පවතින සුපිරි වෙළෙඳපොළ තත්ත්ව පාදක කොට සිදු කළ බැවින් එම තත්ත්ව සඳහා වඩාත් උචිත වේ.





සාමාන්‍යකරණය කළ වෙනස් වන වෘක්ෂලතා දර්ශකය (Normalized Difference Vegetation Index; NDVI) මඟින් ශ්‍රී ලංකාවේ ජනප්‍රිය වී ප්‍රභේද විස්සක අස්වැන්න බෝග වර්ධන අවධියේදීම ඇස්තමේන්තු කිරීම



එම්. කේ. උදාරි භාග්‍යා විමලසේන

වී අස්වැන්න නෙළීමට පෙර අස්වැන්න කොපමණ දැයි නිගමනය කළ හැකි බව ඔබ දැන සිටියාද?


මෙම පරීක්ෂණයේ මූලික අඩිතාලම වූයේ සාමාන්‍යකරණය කළ වෙනස් වන වෘක්ෂලතා දර්ශකයයි (NDVI). මෙයින් පෙන්වන්නේ ශාක පත්‍රයකින් උරා ගන්නා සූර්යාලෝකයේ රතු ආලෝකය සහ පත්‍ර මතුපිටින් පරාවර්තනය කරන ආසන්න අධෝරක්ත කිරණ අතර සමබරතාවයයි. ශාක පත්‍ර එසේ කරන්නේ ඇයි? රතු ආලෝකය තමයි ආහාර නිපදවීමේ ක්‍රියාවලියට අතිශයින් වැදගත් වන්නේ. ඒ වගේම, ආසන්න අධෝරක්ත තරංග මඟින් පත්‍රය උණුසුම් කරන අතර, එයින් ප්‍රයෝජනවත් දෙයක් ශාකයට සිදු නොවේ. එම නිසා, වඩාත් නිරෝගී ශාක මෙම අනවශ්‍ය කිරණ පත්‍රවලින් ඉවත් කරනවා. (අනවශ්‍ය දේවල් ඉවත් කරන එක හොඳ දෙයක් නොවේද?)

මෙම පියවි ඇසට නොපෙනෙන, අපූරු ශාක විද්‍යාත්මක සංසිද්ධිය උපයෝගී කරගෙනයි මේ පර්යේෂණය සිදු වූයේ. ශ්‍රී ලංකාවේ වියළි, තෙත් සහ අතරමැදි කලාප ආවරණය වන විදිහට, වී පර්යේෂණ ආයතන තුනකදී පර්යේෂණය කළා.

පර්යේෂණය සඳහා වී ප්‍රභේද 20ක් යොදා ගැනුණා. එයින් 15ක් නව දියුණු කළ ප්‍රභේද වන අතර, බහුලවම වගා කරන සාම්ප්‍රදායික වී ප්‍රභේද 4ක් මෙන්ම, ලංකාවේ පළමු වැඩි දියුණු කළ ප්‍රභේදය ද (H4) එයට ඇතුළත්. ඉහත කී නවතම දියුණු කළ ප්‍රභේද අතරින් ලංකාවේ වී ප්‍රභේදවලින් සුපිරි 10 දෙනාද සිටිනවා. කලින් සඳහන් කළ NDVI අගයන් ලබා ගැනීමට විශේෂ උපකරණයක් තිබෙනවා. එයට කියන්නේ GreenSeeker Handheld Crop Sensor කියාය. කිසිදු ගණනය කිරීමකින් තොරව ඉතාමත් සරලව NDVI අගයන් මෙම උපකරණය මඟින් ලබා ගත හැකියි. උපකරණය මඟින් ඉහත කී අගයන් වී ශාකයේ කැපී පෙනෙන අවධි 4කදී ලබා ගත්තා. ඒ පුංචි වී පැළවලට දින 28 - 45ක් වෙද්දී, උපරිම පඳුරු දැමීමට පසු, මල් පිපෙන කාලයේ සහ වී වගාව කහ පැහැයට හැරෙන අවස්ථාවේදීය. අස්වනු නෙළා, අව්වේ වේලා, බොල්ද ඉවත් කර බර මැන අවසාන අස්වැන්නද ලබා ගත්තා. තෙත් කලාපයේ අස්වැන්න තවම ගත්තේ නැහැ.

දත්ත විශ්ලේෂණයේ පළමු පියවර වූයේ අවසාන අස්වැන්න සමඟ ඉහත කී අවස්ථාවල ලබාගත් NDVI අගයන් අතර සම්බන්ධයක් තිබෙදැයි බැලීමයි. ඒ කියන්නේ NDVI අගය වැඩි වෙද්දී අස්වැන්නත් වැඩි වෙයිද, එසේ නැත්නම් NDVI අඩුවෙද්දී අස්වැන්න අඩු වෙයිද වගේ සම්බන්ධයක්. දත්ත විශ්ලේෂණයෙන් ඇත්තටම එහෙම සම්බන්ධයක් තිබුණ බව දැන ගත්තා. ඒ උපරිම පඳුරු දමන අවධිය සමඟයි. එය NDVI වැඩි වෙද්දී අස්වැන්නත් වැඩි වන ධනාත්මක සම්බන්ධයක්. මේක අතරමැදි කලාපයටත් වියළි කලාපයටත් පොදු වුණා. ඒ වගේම, මෙම සම්බන්ධයේ ශක්තිමත් බව වියළි කලාපයේදී වැඩි වුණා. ඊට හේතුව වන්නේ වියළි කලාපයේදී වී ප්‍රභේදවල සාර්ථක භාවය හා අවසානයේ වැඩිම අස්වැන්නක් ලබා දීමයි. එමඟින් පෙන්වන්නේ කලාපීය මට්ටමින් පර්යේෂණය සිදු කිරීමේ වැදගත්කම වන අතර අතරමැදි කලාපයේ දත්ත වියළි කලාපයට නොගැලපෙන බවයි.

ඉහත ප්‍රතිඵල අනුව, උපරිම පඳුරු දමන අවස්ථාවේ NDVI අගයන් භාවිත කරමින් වියළි කලාපයේ අස්වැන්න පුරෝකථනය කළා. සරල සමීකරණයක් පාවිච්චි කරගෙන. ප්‍රස්ථාරය ඇසුරෙන් එහි බෑවුම සහ අන්තඃඛණ්ඩයද යොදා ගත්තා. එසේ සමීකරණයෙන් ලබාගත් අස්වැන්න සහ මම මැන බැලූ අවසාන අස්වැන්න අතර වෙනසක් නොමැති බව ගණිතමය උපක්‍රම මඟින් හඳුනා ගත්තා. එම නිසා, වී ශාකයේ උපරිම පඳුරු දමන අවධියේදී අවසාන අස්වැන්න NDVI මඟින් පුරෝකථනය කළ හැකි බව හඳුනා ගත්තා. මෙම රතු ආලෝකය සහ ආසන්න අධෝරක්ත කිරණ අතර අනුපාතය වී ප්‍රභේද අතර වෙනස් වන බවත්, එය කලාපයෙන් කලාපයට වෙනස් වන බවත් අවසානයේ පෙනී ගියා.



මෙසේ අස්වැන්න මුල් අවධියේදීම ගණනය කරන්න පුළුවන් වීම රජයට අපේ වීවල සුලභතාවය කලින්ම දැනගත හැකි නිසා පොහොර සහ පළිබෝධනාශක ප්‍රශස්ත ලෙස යෙදිය හැකිය. ගංවතුරට හෝ නියඟයට ගොදුරු විය හැකි කලාපවල, ආහාර සැපයුම මත ඇති විය හැකි ස්වාභාවික විපත්වල බලපෑම පුරෝකථනය කිරීමට ද, ජාතික ආහාර සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීමට වගේම වීවල මිල පාලනය කිරීමටත් වැදගත් වෙනවා.

සෞඛ්‍ය සම්පන්න දිවියට කැලරි අඩු රසවත් කේක් නිපැයුමක්



ශ්‍යාමලී සන්දීපනී හෙට්ටිආරච්චි

අප සියලු දෙනාම කේක් කැබැල්ලක් රස විඳීමට කැමති බව නොරහසක්. උපන් දිනයකට, උත්සවයකට හෝ තේ කෝප්පයකටත් මෙය අනිවාර්ය අංගයක් ලෙස සැලකේ. නමුත් ඔබ දන්නවාද? බොහොමයක් බෝ නොවන රෝගවලට හේතුව අවිධිමත් ආහාර රටාව බව. අප එදිනෙදා ආහාරයට ගන්නා කේක්වල අඩංගු අධික සීනි සහ තෙල් නිසා රුධිර සීනි වැඩිවීමත්, බර වැඩිවීමත් බොහෝ දෙනා මුහුණ දෙන ගැටලුවක් බවට පත් වී තිබේ.

නමුත් අපට සෞඛ්‍යමත් ආකාරයට කේක් කැබැල්ලක් රස විඳිය හැකි නම්, එය කොපමණ අගනේද?

ඒ අනුව මෙම ගැටලුව සඳහා විසඳුමක් ලෙස, දියවැඩියා රෝගීන් සඳහා යෝග්‍ය, රසවත් මෙන්ම සෞඛ්‍යමත් නව කේක් නිෂ්පාදනයක් සිදු කිරීමේ අභියෝගයට සාර්ථකව මුහුණ දෙන ලදී.

මෙහිදී අඩු කැලරි, අඩු ග්ලයිසමික් දර්ශකයක් (Glycemic Index) සහිත බටර් කේක් සහ කෙසෙල් කේක් යන කේක් වර්ග දෙකම නිෂ්පාදනය කරන ලදී.

මෙම කේක් නිෂ්පාදනය සඳහා සාමාන්‍ය සීනි වෙනුවට සුක්‍රලෝස් (Sucralose) යන ඉහළ පැණි රසකින් යුතු සීනි ස්වල්ප ප්‍රමාණයක් භාවිතා කළ අතර, මෙය සීනි හා සමානම රසවත් නමුත් කැලරි අඩංගු නොවේ. එහෙයින් රුධිර සීනි මට්ටමට මෙමඟින් කිසිදු බලපෑමක් ඇති නොවේ.


සීනි පමණක් නොවේ, මෙම කේක් නිෂ්පාදනයේ අඩංගු මේද ප්‍රමාණය ද ඉතාම අවම මට්ටමක පවතින බව ඔබ දන්නවාද? ඊට හේතුව වන්නේ මෙහිදී මාජරින් වෙනුවට ඉනියුලින් (Inulin) නම් ශාකසාරවලින් නිපදවූ 100% ක් ස්වාභාවික අමුද්‍රව්‍යයක් යොදා ගැනීමයි. මෙය මඟින් මෙම නව කේක් නිෂ්පාදනය සඳහා අප එදිනෙදා ආහාරයට ගන්නා කේක් හා සමානම රසයක් හා පරිපූර්ණ හැඟීමක් ලබා දෙන ලදී.

මෙම අමුද්‍රව්‍ය අපගේ සෞඛ්‍යයට හිතකර වන අතරම ආහාර මාර්ගයේ යහපැවැත්ම සඳහාත් ඉතාමත්ම සුදුසුය.

නව නිපැයුම සාර්ථකද?

කැලරි දර්ශකය (kcal/100g):

- සාමාන්‍ය බටර් කේක්: 528
- අඩු කැලරි බටර් කේක්: 292
- සාමාන්‍ය කෙසෙල් කේක්: 537
- අඩු කැලරි කෙසෙල් කේක්: 300




නව නිෂ්පාදනයේ කැලරි අගය සාමාන්‍ය කේක්වලට වඩා 50% ක පමණ අඩු අගයක් ගන්නා ලදී.

✓ **සංවේදීතා පර්යේෂණය (Sensory Evaluation)** : විශ්වවිද්‍යාලයීය සිසුන් යොදාගනිමින් සිදු කළ සංවේදීතා පර්යේෂණයේදී බොහෝ දෙනාගේ අදහස වූයේ මෙම නව නිපැයුම රසයෙන් හා පෙනුමෙන් සාමාන්‍ය කේක් එකක් හා සමානම බවයි.

✓ **රසායනික පර්යේෂණය (Laboratory Analysis)**: මෙහිදී තවත් එක් පුදුමයට කරුණක් නම් නව කේක් නිපැයුම අනෙකුත් සාමාන්‍ය කේක්වලට වඩා මෘදු බවක් දැක්වීමයි. මෙම නව නිපැයුමේ බාහිර ස්වරූපය මෙන්ම සෞඛ්‍යමත් බව ද අප එදිනෙදා ආහාරයට ගන්නා කේක්වලට වඩා ඉදිරියෙන් ඇති බවට රසායනික පර්යේෂණ මඟින් තහවුරු කර ගන්නා ලදී.

ග්ලයිසමික් දර්ශකය (GI):

- සාමාන්‍ය බටර් කේක්: 84.35
- අඩු කැලරි බටර් කේක්: 51.24
- සාමාන්‍ය කෙසෙල් කේක්: 75.80
- අඩු කැලරි කෙසෙල් කේක්: 48.49



එමෙන්ම මෙම නව සොයාගැනීම ඉතාමත් අඩු ග්ලයිසමික් දර්ශකයක් පෙන්වන ලදී. එනම් මෙය ආහාරයට ගැනීමෙන් ඔබගේ රුධිර සීනි මට්ටම ඉහළ යාමේ වේගය අඩු කරයි. මෙය හුදෙක් විද්‍යාත්මක පර්යේෂණයක් පමණක් නොවේ. සෞඛ්‍යමත් කේක් නිෂ්පාදන කලාවක නව ආරම්භය මෙමඟින් සනිටුහන් කරයි.

මුහුදේ සැඟවුණු විශ්වකර්ම නිර්මාණය : *Kappaphycus alvarezii*



පී. ඒ. රවිෂ්කා යසවර්ධන

ශ්‍රී ලංකාව යනු මුහුදෙන් වට වූ දූපතකි. එම නිසාම අද්විතීය සාගර සම්පත්වලින් ගහන අප රට වටා ඇති මුහුදු තීරය අග්‍රගණ්‍ය ස්වාභාවික සම්පතක් වන මුහුදු පැළෑටිවලින් සන්නද්ධ ය. ශ්‍රී ලාංකික ජන සමාජයට එතරම් සමීප පරිභෝජනයක් නොමැති වුව ද මෙම විශිෂ්ට හරිත සම්පත මේ වන විට ලෝකය පුරා විවිධ ක්ෂේත්‍රයන්හි තම ස්ථානය සනාථ කර අවසන් ය.

මෙම පර්යේෂණය සඳහා තෝරාගත් මුහුදු පැළෑටි විශේෂය වන්නේ ශ්‍රී ලංකාවේ බහුලවම (උතුරු හා නැගෙනහිර වෙරළාශ්‍රිතව) වගා කරන *Kappaphycus alvarezii* හෙවත් ඩොටී ඩොටී ය. කපා කැරගීනන් (Kappa-carrageenan) නම් වූ ජෙලි සෑදීමේ කාරකයේ ප්‍රධාන ප්‍රභවය වන මෙහි, වගා කළ හා වනජීවී (වල්) ගහනයන්හි රසායනික සංයුතීන් හා ගුණයන් වෙනස් වන ආකාරයත්, වර්ණක තැන්පත් වීමේ විවිධත්වය මත පවතින්නා වූ දුබුරු හා කොළ වර්ග සැසඳීමත්, මෙන්ම එදිනෙදා ජීවිතයේදී පරිභෝජනය සඳහා වැදගත් වන පිසීමේ ක්‍රියාවලියෙන් සිදු වන බලපෑම් සැසඳීමත්, එමඟින් පැවැති දැනුම් පරතරය පිරවීමත් මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු විය.



ප්‍රධාන වශයෙන් අධ්‍යයනය කළ දේවල් මොනවාද?

- **ආරක්ෂණය:** මුහුදු පැළෑටිවල ශරීරයේ පලිහක් මෙන් ක්‍රියා කරන ස්වාභාවික සංයෝග අඩංගු වේ. එම සංයෝග "ප්‍රතිඔක්සිකාරක" ලෙස හඳුන්වමු. අපගේ දේහ සෛලවලට හානි කරන සහ අපව වේගයෙන් වයසට යාමට සලස්වන හානිකර අණු සමඟ සටන් කරන මෙම ආරක්ෂිත ප්‍රවාහය ඉහත සඳහන් කළ මුහුදු පැළෑටි සාම්පලවල කෙතරම් ශක්තිමත්ව, කුමන සාන්ද්‍රණයකින් පවතින්නේදැයි එකිනෙකට වෙනස් පර්යේෂණ 5ක් මඟින් අනාවරණය කරන ලදි.
- **සුව කිරීමේ සංසටක:** නවීන ලෝකයාගේ වැරදි ආහාර පුරුදු හා ජීවන රටාවන් හේතුවෙන් වර්තමානයේදී දියවැඩියා රෝගීන් ලොකු කුඩා කා අතරින් වුව ද හමු විය හැක. මෙම සුලභත්වය නිසාම මිනිස් දේහය තුළ පිෂ්ඨය සීනි බවට හැරෙන ක්‍රියාවලිය මන්දගාමී කිරීමට සමත් සංසටක, අධ්‍යයනය සඳහා භාවිත කළ මුහුදු පැළෑටිවල සමන්විත වන්නේ කෙසේද යන්න ඇල්ෆා ඇමයිලේස් නිෂේධන පරීක්ෂාව මඟින් අනාවරණය කරන ලදි. මෙය රුධිරයේ සීනි මට්ටම ස්ථාවරව තබා ගැනීමට උපකාරී වේ.
- **භාවිතය ආරක්ෂිතද?:** මුහුදු පැළෑටි මුහුදේ වැඩෙන බැවින් බැරලෝහ අවශෝෂණය සඳහා වැඩි අවදානමක් ඇති බැවින්, අධ්‍යයනය සඳහා භාවිත කළ මුහුදු පැළෑටිවල බැරලෝහ සංයුතිය රසායනික පරීක්ෂාවකින් අනාවරණය කරගන්නා ලදි.

අධ්‍යයනයෙන් ලද ප්‍රතිඵල මොනවාද?

වන ගහනයේ ඉහත සඳහන් කළ ගුණ වැඩිපුර හඳුනාගත් අතර, සියලුම බැරලෝහ භාවිතයට සුදුසු සීමාවේ ඇති බවත්, පිසීමේ ක්‍රියාවලිය මෙම සංයෝගවල අඩුවීමකට හේතු වී ඇති බවත් සොයාගන්නා ලදි. එමඟින් අවම භාවිතයේ ඇති වන ගහණය තිරසාර ලෙස භාවිතයටත්, ආරක්ෂිතව පරිභෝජනයට ගත හැකි බවත්, අවම පෙර සැකසුම් සහිතව ආහාරයට ගැනීම වඩා හොඳ පෝෂක ප්‍රමාණයක් රඳවා ගැනීමට උපකාර වන බවත් සොයාගන්නා ලදි.

අධ්‍යයනයේ වැදගත්කම කුමක්ද?

ශ්‍රී ලාංකික පරිසර තත්ත්වයන් යටතේ හොඳින් වගා කර රටට විදේශ විනිමය ගෙන ආ හැකි අපනයන සාගර සම්පතක් වන *Kappaphycus alvarezii* වැනි මුහුදු කහවනු වන් හරිත සම්පත්වල සැබෑ විභවයන් විවර කර, ඒවායේ ආරක්ෂක සහ සෞඛ්‍ය ප්‍රතිලාභ හඳුනා ගැනීමම කෙතරම් නම් වටිනේද? එමඟින් ලාංකික සමාජය තුළ අවම භාවිතයේ ඇති මෙම සම්පත්වල වටිනාකම පිළිබඳව දැස් විවර කර බැලීමට මිනිසා පෙළඹවීමට මංපෙත් විවර වනු නොඅනුමානය. සාගර ජලජ සම්පත් සංරක්ෂණය හා අගය කිරීමේ වටිනාකම මනාව අවබෝධ කර ගනිමින් තිරසාර හා ශක්තිමත් නීල ආර්ථිකයක් සහිත අනාගතයක් නිර්මාණයට මෙය අත්පොත් තබාවි යැයි විශ්වාස කරමු.

අවධානයෙන් සිටින්න, ලාංකික ආර්ථික පුනරුදයේ ඊළඟ හැරවුම් ලක්ෂ්‍යය මුහුදු කහවණුවකින් ජනනය විය හැක!

This is a non-technical summary of the project report titled "Comparative assessment of antioxidant potential, antidiabetic potential and toxicity of wild and cultivated *Kappaphycus alvarezii* in Green and brown morphotypes: Raw Vs. Cooked" supervised by Dr. P. Weththasinghe, Department of Animal Science, Faculty of Agriculture, University of Peradeniya.
pabodhaw@agri.pdn.ac.lk

වියළි ගතකට සිසිල දෙන කටු අනෝදා පානය




N.M.V.L. නායකරත්න

කටු අනෝදා යනු *Annona muricata* යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබන, ශ්‍රී ලංකාව වැනි ඉතාර්න (තෙතමනය සහිත) / සමර්කලාපීය රටවල හමුවන හා පහසුවෙන් වගා කළ හැකි ශාකයකින් හටගන්නා ඉතාමත් ඉහළ පෝෂණ ගුණයකින් යුක්ත පළතුරකි. පැරැන්නන් අතර පවතින ජනප්‍රිය මතවාදයක් නම් මෙම කටු අනෝදා මගින් ශරීරය සිසිල් කරන බවයි. නමුත් මීට පෙර කටු අනෝදා ආශ්‍රිත පානයන්හි එම හැකියාව සායනිකව පරීක්ෂා කර නොතිබිණි. ශ්‍රී ලංකාව වැනි රටවල අධික උෂ්ණ දේශගුණය සමඟ ශරීරයෙන් අයන වගර් පිටවීම නිසා ඉතා ඉක්මනින් විජලනයට පත්වීමේ හැකියාවක් ඇත. කටු අනෝදා පළතුර සතුව ඉතා ඉහළ සෝඩියම් හා පොටැසියම් වැනි අයන සාන්ද්‍රණයන් පැවතීම නිසා ඒවා භාවිතයෙන් ඉලෙක්ට්‍රොලයිට් පාන වගර් නිෂ්පාදනය කිරීමේ හැකියාවක් පවතී. වතර්මාන වෙළෙඳපොළ තුළ බහුලව පවතින්නේ කෘතිම රසකාරක හා වණර්කාරක බහුලව අඩංගු කරන ලද පාන වගර් වේ. මේවායින් බොහොමයක් පෝෂක සංඝටකවලින් අනූන නොවේ.

ස්වාභාවික රස පහස මෙහිදී හොඳින් වියළාගත් කටු අනෝදා පිටි ආශ්‍රයෙන් හා ඉතා නැවුම් කටු අනෝදා පල්ප ආශ්‍රයෙන් පාන වගර් සංවධර්නය කිරීම ආරම්භ විය. නමුදු කටු අනෝදා කුඩු මගින් සිදුකරන සංවධර්නයන්හි ඵලදායීතාව අඩු වීම නිසා නැවුම් කටු අනෝදා පල්ප මගින් ඉදිරියට පයෙර්ෂණ කරගෙන යන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන වශයෙන් අනෝදා ආශ්‍රිත පාන වගර් තුනක් ගොඩනැඟීමට හැකි විය. අනෝදා පල්ප සංයුතිය 5%, 10% හා 13% (ස්කන්ධය අනුව) අඩංගු වන කටු අනෝදා ආශ්‍රිත ඉලෙක්ට්‍රොලයිට් පානයන් ගොඩනංවන ලදී. එම පානයන් අතරින් වඩාත්ම පාරිභෝගික ආකෂර්ණයට ලක්වන පානය ගුණාත්මක විශ්ලේෂණයන් මගින් තහවුරු කරගන්නා ලදී. එම පානයන්හි රසය, සුවඳ ආදිය පරීක්ෂණාත්මකව ගණනය කරන ලදී. පසුව තවදුරටත් රසායනාගාර පයෙර්ෂණ මගින් ඒවායේ රසායනික සංයුතිය පිළිබඳ පයෙර්ෂණ සිදුකරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස අන්තජර්ාතික සංයුතීන්ට අනුව ඉලෙක්ට්‍රොලයිට් පානයක් සතුව පැවතිය යුතු රසායනික සංයුතීන්ට අනුකූලව මෙම ඉලෙක්ට්‍රොලයිට් පානය පවතින බව තහවුරු විය. පසුව සිදුකරනු ලැබූ ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණවලට අනුව ද මෙම පානය පරිභෝජනයට සුදුසු මට්ටමේ පවතින බව තහවුරු විය. ඉන්පසුව පානයන් සායනික මට්ටමේ පරීක්ෂාව සඳහා ලක්කරන ලදී.

සායනිකව තහවුරු කිරීම ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිදෙර්ශ කිරීම්වලට අනුව නීරෝගී (BMI දශර්කයට අනුව) වයස අවුරුදු 25–30 අතර පසුවන තරුණයින් මෙම පරීක්ෂාව සඳහා ස්වේච්ඡාවෙන් සහභාගී වන ලදී. එහිදී පාලිත තත්ත්ව යටතේ පානීය ජලයට සාපේක්ෂව වැඩිම පාරිභෝගික කැමැත්ත මත තෝරාගත් සංවධර්ීත පානයේ (අනෝදා පල්ප සංයුතිය 13% ක් වන පානය) ශරීරය සජලනය කිරීමේ හැකියාව පරීක්ෂාවට ලක්කරන ලදී. මෙහිදී පරීක්ෂණයට සහභාගී වූ සියලු දෙනාම සාමාන්‍ය ජලයට සාපේක්ෂව මෙම පානය භාවිත කිරීමෙන් පසුව ඉතා හොඳින් සජලනය වූ බව තහවුරු විය.



පරීක්ෂාව අතරතුර සිදුකරන ලද දත්ත රැස්කිරීම් මගින් මෙම පානය ජලයට සමාන නමුත් ඉතා රසවත් හා පිපාසය සංසිදුවන බව නිරීක්ෂණය විය. සායනික දත්ත හා සංසන්දනය කිරීමේදී මෙම පානය ශරීරය සජලනය කිරීම සඳහා ඉතාමත් සාර්ථක පානයක් බව තහවුරු විය. නිෂ්පාදිතය තවදුරටත් ගබඩා කර තැබිය හැකි ප්‍රශස්ත තත්ත්වයන් පරීක්ෂාවේදී, එය සාමාන්‍ය කාමර උෂ්ණත්වයේදී ශීතකරණවලට වඩා හොඳින් පවත්වාගත හැකි බව නිරීක්ෂණය විය.



වී වගාවේ දුඹුරු පුල්ලි රෝගය පාලනයට නව මාවතක්



D.V.S. ලක්ෂිත

වී වගාව හා දුඹුරු පුල්ලි රෝගය...

ශ්‍රී ලංකාවේ වී ගොවීන් වර්තමානයේ මුහුණ දෙන ප්‍රධානතම දිලීර රෝගයක් බවට දුඹුරු පුල්ලි රෝගය පත් වී ඇත. *Bipolaris oryzae* නම් ව්‍යාධිජනක දිලීරය මෙම රෝගය ඇති කරන අතර මෙහිදී ප්‍රමාණයෙන් හා හැඩයෙන් තල ඇටයකට සමාන දුඹුරු පැහැති ලප පත්‍ර තලය මත ඇති වේ. මෙම රෝගය නිසා අස්වැන්න අඩු වීම සහ අස්වැන්නේ ගුණාත්මකභාවය අඩු වීම සිදු වේ.

වී වගාවේ ගොවීන් අතර ජනප්‍රිය ඉහළ අස්වනු ලබා දෙන වී **ප්‍රභේද** සියල්ලම පාහේ මෙම රෝගයට ගොදුරු වේ. **ප්‍රතිරෝධී ප්‍රභේද** නොමැති වීම හා නිර්දේශිත දිලීර නාශකයක් නොමැති වීම මෙම හානිය තව දුරටත් තීව්‍ර කරන නමුත් ඇතැම් සාම්ප්‍රදායික දේශීය **ප්‍රභේද** සඳහා මෙම රෝගයේ බලපෑම තරමක් අඩු බව තහවුරු වීම රෝගය පාලනය සඳහා නව පැතිකඩක් විවෘත කරන්නකි.

නව මාවතක්...

මෙම රෝගය ජෛව පාලනය සඳහා දේශීය වී **ප්‍රභේදවල** ස්වාභාවිකව ජීවත් වන ක්ෂුද්‍ර ජීවීන් යොදා ගැනීම පිළිබඳව බතලගොඩ වී පර්යේෂණායතනයේදී සිදු කරන ලද මෙම පර්යේෂණය මගින් සාර්ථක ප්‍රතිඵල **ළඟා** කර ගැනීමට හැකි විය.

අපගේ පර්යේෂණය සඳහා සුවඳැල්, කළු හීනටි, සුදු හීනටි, මඩතවාලු, කහවණු යන වී **ප්‍රභේදවල** පත්‍රවල සහ බීජවල ස්වාභාවිකව වාසය කරන ක්ෂුද්‍ර ජීවී **ප්‍රභේද** වෙන් කරගන්නා ලදි. දිලීර විශේෂ 41ක් වෙන් කරගත් අතර එම දිලීරවලට දුඹුරු පුල්ලි රෝග කාරක *Bipolaris oryzae* දිලීරය මැඩ පැවැත්වීමට ඇති හැකියාව විද්‍යාගාර **තත්ත්ව** තුළදී මෙන්ම **ක්ෂේත්‍ර තත්ත්ව** යටතේදීද **අධ්‍යයනය** කරන ලදි. විද්‍යාගාර **තත්ත්ව** යටතේ සිදු කරන ලද **අධ්‍යයනවලදී** ඉහළම ප්‍රතිශතයකින් ව්‍යාධිජනකයාගේ දිලීර ජාලය වර්ධනය මැඩ පැවැත්වීම (Inhibition Percentage) සිදු කළ, ව්‍යාධිජනක දිලීරයට ප්‍රතිරෝධීව ක්‍රියා කරන දිලීර (Antagonistic fungi) **ක්ෂේත්‍ර තත්ත්ව** යටතේ **අධ්‍යයනයට** බඳුන් කරන ලදි.

රෝගය ඇති වීමට පෙර (ප්‍රතිරෝධී දිලීරය + ව්‍යාධිජනකයා) මෙම ජෛව පාලක ක්ෂුද්‍ර ජීවීන් යෙදීම හෝ රෝගය ඇතිවීමෙන් පසු (ව්‍යාධිජනකයා + ප්‍රතිරෝධී දිලීරය) යෙදවීම යන අවස්ථා දෙකේදීම **සැලකිය** යුතු වෙනසකින් තොරව රෝගය පාලනය සිදු විය.




Bipolaris oryzae දිලීර බීජාණු

විද්‍යාගාර තත්ත්ව යටතේ Penicillium spp.මගින් B. Oryzae වර්ධනය අඩාල වීම

රෝගයේ ප්‍රබලතාව:

මෙහිදී ඉහළ රෝග පාලනයක් සිදු කළ ක්ෂුද්‍ර ජීවීන් දිලීර බීජාණු හා දිලීර බීජාණුධානි ආධාරයෙන් හඳුනාගන්නා ලදි. මඩතවාලු වී ශාකයෙන් ලබාගත් *Aspergillus* spp. දිලීරය සහ කළු හීනටි වී ශාකයෙන් ලබාගත් *Penicillium* spp. දිලීරය දුඹුරු පුල්ලි රෝගකාරක *Bipolaris oryzae* දිලීරය **මැඩපැවැත්වීම** සඳහා විද්‍යාගාර **තත්ත්ව** හා **ක්ෂේත්‍ර තත්ත්ව** දෙකම යටතේදී ඉහළ ප්‍රතිඵල ලබා දීම සිදු විය.

එමෙන්ම Amylase, Protease, Lipase, Cellulase යන ජෛව පාලනය සඳහා වැදගත්වන එන්සයිම මෙන්ම ව්‍යාධිජනකයා පාලනයට බලපාන වාෂ්පශීලී සහ **වාෂ්පශීලී නොවන** පරිවෘත්තීය ද්‍රව්‍ය නිපදවීමද සිදු කරන බව පර්යේෂණවලින් පැහැදිලි විය.



Penicillium spp. *Aspergillus* spp.

අවසන් වශයෙන්, *Bipolaris oryzae* ව්‍යාධිජනකයා පාලනයට හැකියාව ඇති ක්ෂුද්‍ර ජීවීන් පිරිසක් සොයා ගැනීම මගින් ශ්‍රී ලාංකික වී ගොවීන්ට හිසරදයක් වන දුඹුරු පුල්ලි රෝගය පාලනයට ස්වාභාවික විසඳුමකට දොරටුවක් විවෘත වී ඇත. පරිසරයට හිතැති තිරසාර වී ගොවිතැනක් සඳහා මෙම ප්‍රතිඵලය හේතු වනු නොඅනුමානය.

This is a non-technical summary of the project report titled "Isolation and identification of fungal bio control agents from traditional Sri Lankan rice varieties against rice brown spot pathogen (*Bipolaris oryzae*)" supervised by Prof. D.M. De Costa *, Department of Agricultural Biology, Faculty of Agriculture, University of Peradeniya. *dmdcosta@agri.pdn.ac.lk.

බිත්තර සැපයුම් දාමයේ විශ්වාසනීයත්වය හා ආහාර සුරක්ෂිතතාව උදෙසා බ්ලොක්චේන් සහ IoT තාක්ෂණික විසඳුමක්



සයුර ගිම්හාන් වීරසිංහ

ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදනය ස්වයංපෝෂිත මට්ටමක පැවතුණද, බිත්තර සැපයුම් දාමයේ (Supply chain) ගමන් මග සොයා ගැනීමේ (Traceability) බරපතල අභියෝග පවතී. නිෂ්පාදනයේ සිට සිල්ලර වෙළඳාම දක්වා බිත්තරවල ගමන් මගෙහි තොරතුරු එලදායී ලෙස සැපයීමට වත්මන් පද්ධතිවලට නොහැකි වීම මගින් සැල්මොනෙල්ලා වැනි රෝග ව්‍යාප්තිවලදී ආහාර සුරක්ෂිතතාවට තර්ජන ඇති වේ.

මෙම ගැටලුවට විසඳුමක් ලෙස, බිත්තර සැපයුම් දාමයේ විනිවිදභාවය (Transparency) හා ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා බ්ලොක්චේන් (Blockchain) හා සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාලය (Internet of Things) ඒකාබද්ධ කළ සැලසුමක් (Blockchain-IoT framework) මෙම අධ්‍යයනය මගින් යෝජනා කරයි. එවැනි සැලසුමක අවශ්‍යතාවය කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් යෝජිත ජාතික කුකුළු ප්‍රතිපත්ති කෙටුම්පතෙහි ද පැහැදිලිව සඳහන් කර ඇත.

බ්ලොක්චේන් තාක්ෂණයේ විමධ්‍යගත (Decentralized) හා වෙනස් කළ නොහැකි (Immutable) ලක්ෂණ මගින් බිත්තරවල ගමන්මගෙහි සෑම අදියරක්ම නිරීක්ෂණය කිරීම (Monitor) හා සත්‍යාපනය (Verify) කිරීම සිදු කළ හැකිය. සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාල (IoT) උපාංග මගින් ස්ථානය, උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාවය වැනි තථ්‍ය-කාලීන (Real-time) දත්ත ස්වයංක්‍රීයව ග්‍රහණය කර ඒවා බ්ලොක්චේන් දත්ත ජාලය වෙත ස්වයංක්‍රීයව යොමු කරවයි. QR කේත (QR Codes) භාවිතයෙන් පාරිභෝගිකයින්ට බිත්තර මිලදී ගැනීමට පෙර ඒවායේ සවිස්තරාත්මක ගමන් මග පිරික්සීමට හැකි වන අතර, එමගින් නිෂ්පාදනයේ අව්‍යාජභාවය (Authenticity) හා විශ්වාසනීයත්වය (Trust) ඉහළ නැංවේ.

අධ්‍යයන ක්‍රමවේදය

- **පාරිභෝගික සමීක්ෂණය:** 200 කට අධික පිරිසක් සහභාගී වූ මෙම සමීක්ෂණයෙන් හෙළි වූයේ, 28% ක පමණ පිරිසක් ඇසුරුම් කරන ලද බිත්තර (Egg packs) මිලදී ගන්නා බවයි. ඔවුන්ගෙන් බහුතරයක් QR කේත හරහා ලබා ගත හැකි අමතර තොරතුරු අගය කළහ. එමෙන්ම, ඇසුරුම් කරන ලද බිත්තර මිලදී ගන්නා පිරිසෙන් 58% ක් සත්‍යාපිත (Verified) බිත්තර සඳහා 5% ක අමතර මුදලක් ගෙවීමට කැමැත්ත පළ කළහ.
- **වෙළඳපොළ සමීක්ෂණය:** මෙම සමීක්ෂණයෙන් හඳුනාගත් ගැටලු අතර වැරදි ලේබල් කිරීම (Mislabelling) හා වැරදි තොරතුරු ලබාදීම (Misinformation) වැනි අභියෝග ඉස්මතු විය.
- **සම්මුඛ සාකච්ඡා:** සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (Department of Animal Production and Health), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (Sri Lanka Standards Institution), පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (Consumer Affairs Authority) හා ආහාර පාලන පරිපාලන ඒකකය (Food Control Administration Unit) ඇතුළු ආයතන සමඟ පවත්වන ලද සාකච්ඡා මගින් යෝජිත සැලසුමෙහි දත්තවල වලංගුභාවය තහවුරු කරන සුහුරු කොන්ත්‍රාත් (Smart contract) ස්ථරය නිර්මාණය කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදී.

පද්ධති රූප සටහන් (System diagrams), පරිශීලක අතුරු මුහුණත් (User Interfaces) හා පරිශීලක අත්දැකීම් (User Experience) තාක්ෂණික විශේෂඥයින් විසින් තහවුරු කරන ලදී.



යෝජිත සැලසුමෙහි රූපසටහන

තහවුරු කරන ලද මෙම සැලසුම පරීක්ෂා කිරීම සඳහා නියමු පරීක්ෂණයක් (Pilot Testing) සිදු කරන ලදී. බිත්තර 180 ක දත්ත උපයෝගී කරගනිමින් උඩපේරාදෙණිය පශුසම්පත් ක්ෂේත්‍ර ස්ථානයේ (Livestock Field Station) සිට සත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ අලෙවි මධ්‍යස්ථානය (Sales Centre) දක්වා මෙම නියමු පරීක්ෂණය සාර්ථකව සිදු කරන ලදී.

නියමු පරීක්ෂණයේ ප්‍රතිඵල හා පාරිභෝගික ප්‍රතිචාර

අවසන් පාරිභෝගික ප්‍රතිචාර ඉතා ධනාත්මක වූ අතර එහිදී උපරිම ලකුණු 5.00 ක් වූ පරිමාණයක 4.64 ක සාමාන්‍ය ලකුණක් ලැබිණි. මෙම සැලසුම බිත්තර සැපයුම් දාමයේ විනිවිදභාවය ඉහළ නංවන අතර, පාරිභෝගික විශ්වාසය වැඩි කරමින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කරන ලද සැපයුම් දාමයක් නිර්මාණය කරයි.



නියමු පරීක්ෂණයේදී යොදාගත් සත්‍යාපනය කළ හැකි ඇසුරුම් කරන ලද බිත්තර නිෂ්පාදනයක්



QR කේතය පරීක්ෂාවෙන් පසු යොමු වන පරිශීලක අතුරුමුහුණත.

ගෝලීය උණුසුම හමුවේ කඳුරට තේ වගාවේ අනාගතය?



ඉසුරි පතිරත්න

කඳුරට තේ වගාව සහ ගෝලීය උණුසුම

ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ පවත්නා සිසිල් උෂ්ණත්වය සහ නිරන්තර වර්ෂාපතනය ඉතා උසස් ගුණාත්මකභාවයෙන් යුක්ත තේ නිෂ්පාදනයට ඉමහත් තෝතැන්නක් සපයයි. නමුත්, අනාගත කාලගුණ වෙනස්වීම් හමුවේ ගෝලීය උණුසුමට නිරාවරණය වීමෙන් සාමාන්‍ය වායුගෝලීය උෂ්ණත්වය දැනට පවත්නා උෂ්ණත්වයට වඩා තරමක් ඉහළ යා හැකි බව පර්යේෂකයන් විසින් දැනටමත් අවධාරණය කර ඇති කරුණකි. මේ හේතුව නිසා විශාල වශයෙන් බෝග වගාවේ වෙනස්කම් සිදුවිය හැකි අතර, ඒ සඳහා නිසි පර්යේෂණ කටයුතුවල බොහෝ දෙනා ඒකරාශී වී සිටිති. අනෙකුත් බෝග මෙන්ම තේ වගාවට ද මේ හේතුවෙන් බලපෑමක් ඇතිවිය හැකි අතර, ඒ සඳහා අනාගත ගෝලීය උණුසුමේදී බලාපොරොත්තු වන සාමාන්‍ය වායුගෝලීය උෂ්ණත්වයට සමාන උෂ්ණත්වයක් කෘත්‍රිමව ලබාදීමෙන්, තවාන් තේ පැළෑටිවල වර්ධනය, කායික විද්‍යාත්මක වෙනස්වීම් සහ විවිධ ජෛවරසායනික සංඝටකයන්ගේ වෙනස්වීම් මෙම පර්යේෂණය මගින් හඳුනාගන්නා ලදී.

තෝරාගත් තේ ප්‍රභේද

ශ්‍රී ලංකාවේ තේ වගාකරුවන් අතර ප්‍රචලිත තේ TRI2023, TRI2025, TRI4046 සහ TRI4071 යන ප්‍රභේද හතර මෙහිදී ඇගයීමට භාජනය කරන ලදී. මෙම සියලුම පැළ බිම් වගාකිරීම සඳහා සුදුසු වයසේ පවත්නා අතර, ඉතා හොඳ ජල සැපයුමක් සමග සාමාන්‍ය උෂ්ණත්වයට වඩා සෙල්සියස් අංශක 3.5ක් පමණ ඉහළ උෂ්ණත්වයකට යොමුකරන ලදී. අනාගත උෂ්ණත්වයට බඳුන් කර සති හතකට පසු, සියලුම ප්‍රභේදයන්හි තේ දළුවල වියළි බර ඉහළ උෂ්ණත්වය හමුවේදී සාමාන්‍ය බරට වඩා වැඩි වී තිබූ අතර, එහිදී වැඩිම දළු බරක් දැකගත හැකිවූයේ TRI4046 ප්‍රභේදයේ ය. එම ප්‍රභේදය සාමාන්‍යයෙන් උෂ්ණ තේ වගාව සඳහා ද නිර්දේශ කර ඇති නිසා තරමක ඉහළ උෂ්ණත්වයක් හමුවේ ඉතා හොඳ වර්ධනයක් අත්පත් කරගනී.

තේ දළුවල බර තේ අස්වැන්නට සෘජුවම බලපාන අතර, මෙහිදී TRI4046 ප්‍රභේදය සහ TRI4071 ප්‍රභේදය වැඩි අස්වැන්නක් අනාගතයේදී ලබාදීමට නියමිත බව හඳුනාගත හැකි කරුණකි.

එසේම මූල මණ්ඩලයේ පැතිරීම සහ වියළි බර අතින් ද මෙම ප්‍රභේදයන් දෙක ඉදිරියෙන් පසුවේ. එහිදී TRI2023 සහ TRI2025 ප්‍රභේදයන් මූල මණ්ඩලයේ වියළි බර සහ පැතිරීම වැඩි උෂ්ණත්වයක් හමුවේ තරමක් අඩු කරගෙන ඇති අතර, එය අනාගත වියළි කාලගුණ තත්ත්වය සහ අඩු ජල සැපයුමක් හමුවේ තේ පැළවල වර්ධනය අඩාල වීමට හේතුවක් විය හැක.

වැඩි තේ අස්වැන්නක් සඳහා ඉහළ ප්‍රභාසංස්ලේෂණ වේගයක් තිබීම අත්‍යවශ්‍ය වේ. මෙහිදී සියලුම ප්‍රභේදයන්හි ප්‍රභාසංස්ලේෂණ වේගය ඉහළ උෂ්ණත්වය හමුවේ ඉහළ අගයක පවතින අතර TRI4000 ප්‍රභේදයන් දෙක කැපී පෙනෙන ලෙස ප්‍රභාසංස්ලේෂණ වේගය වැඩි කරගෙන ඇත. එසේම ශාක පත්‍ර සිසිල් කරන යාන්ත්‍රණයක් වන උත්ස්වේදන වේගය ද TRI4000 ප්‍රභේද දෙකෙහි වැඩි අගයක් ගනී. මෙම ලක්ෂණ දෙකම අනාගත ගෝලීය උණුසුම හමුවේ ඉතා හොඳ වර්ධනයක් සහ අස්වැන්නක් ලබාදිය හැකි ප්‍රභේදයන්ගේ ගතිගුණ ලෙස සැලකිය හැක.

එලෙසම අනාගත ගෝලීය උණුසුම සමග පාංශු ජල මට්ටම් අඩුවිය හැක. එම නිසා ජලය සංරක්ෂණය කිරීමේ යාන්ත්‍රණයන් ශාකය තුළ ක්‍රියාත්මක වීම වටිනා කරුණකි. එහිදී පෙර සේම TRI4046 සහ TRI4071 ප්‍රභේද දෙක ඵලදායී ලෙස ජලය ශාක ක්‍රියාවලීන් සඳහා භාවිතා කරගන්නා අතර TRI2000 ප්‍රභේද දෙකෙහි එය අඩු අගයක් ගනී. නමුත් වර්ධනය අතින් ගත් කල මෙම 2000 ප්‍රභේදයන් වර්ධනය අඩාල කර නොගෙන සාමාන්‍ය වර්ධනයක් පවත්වාගෙන යාමට සමත් වේ.

මෙම තත්ත්වයන් හමුවේ පෙනී යන්නේ අනාගතයේ ගෝලීය උණුසුම හමුවේ කඳුරට තේ වගාවේ වර්ධනයක් පෙන්නුම් කරන බවයි. එහිදී ප්‍රභේද තෝරාගැනීමේදී නව වැඩිදියුණු කරන ලද ප්‍රභේදයන් වෙත යොමුවීම සිදුකළ යුතු අතර එහිදී TRI4046, TRI4071 ප්‍රභේද දෙක නිර්දේශ කළ හැක. දැනට වගාකර ඇති ප්‍රභේද සඳහා ද අභිතකර තත්ත්වයක් මෙහිදී ඇති නොවන අතර TRI2000 ප්‍රභේදයන් සාමාන්‍ය අයුරින් වර්ධනය පවත්වාගෙන යාමට සමත් වේ. මෙහිදී තවදුරටත් වැඩි අස්වැන්නක් ලබාගැනීම සඳහා වගාකරුවන්ට TRI4046 සහ TRI4071 ප්‍රභේද දෙක වගාව සඳහා නිර්දේශ කිරීම මේ මගින් සිදුකළ හැක.






අනාගත ආහාර සුරක්ෂිතතාව සඳහා කෘමි ප්‍රෝටීන්: කහ මිල්වෝම් පිටි භාවිතයෙන් ප්‍රෝටීන් බාර් නිපදවීම



ඊ. එස්. එල්. එච්. රඹතුංග

ලෝක ජනගහනය වර්ධනය වීමත් සමඟ, ප්‍රෝටීන් බහුල ආහාර නිපදවීමේ අවශ්‍යතාව වැඩි වී ඇත. සාම්ප්‍රදායික මස් නිෂ්පාදනය සඳහා විශාල ඉඩම්, ජලය සහ සම්පත් අවශ්‍ය වන අතර, එය සැලකිය යුතු පරිසර දූෂණයකට ද හේතු වේ. මේ නිසා, තිරසාර සහ ඉහළ පෝෂණ ගුණයෙන් යුත් විකල්ප ප්‍රෝටීන් ප්‍රභවයන් වෙත යොමුවීම අත්‍යවශ්‍ය වී ඇත.

කෘමීන් යනු ලොව පුරා අවධානය යොමුවී ඇති එවන් විකල්ප ප්‍රෝටීන් ප්‍රභවයකි. කාබනික උපස්තර මත කෙටි කලකින් කෘමි කීටයන් ඉහළ තත්ත්වයෙන් යුතුව වැඩි ප්‍රමාණයක් කුඩා ඉඩකදී සාදා ගත හැක. එමෙන්ම නිවසේ ඉවතලන දිරාපත්වන අපද්‍රව්‍ය ද මොවුන් වැඩීමට සුදුසු උපස්තරයකි.

ගොවිපළ සතුන් මඟින් මස් නිෂ්පාදනය කර ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරා ගැනීමට වැඩි සම්පත් ප්‍රමාණයක් වැය කළ යුතු අතර, ඔවුන්ගෙන් පරිසරයට වන බලපෑම ද ඉතා ඉමහත්ය. කෘමි කීටයන්ගෙන් අපද්‍රව්‍ය චක්‍රීකරණය ද හොඳින් කළ හැකි වන අතර, මොවුන් සම්පත් ඵලදායී ලෙස පරිහරණය කර හොඳ අස්වැන්නක්/ඵලදාවක් ලබා දෙන්නේ පරිසරයට ද අහිතකර තත්ත්ව ඇතිවීම අවම වන පරිදිය.

කහ මිල්වෝම් (Yellow Mealworm) කෘමියාගේ කීටයා යනු ඉහළ ප්‍රෝටීන් (50%කට වඩා), සෞඛ්‍ය සම්පන්න මේද, විටමින් සහ ඛනිජ ලවණ අඩංගු තිරසාර ආහාර ප්‍රභවයකි.



මෙම පර්යේෂණය අවධානය යොමු කළේ මෙම පෝෂණ ගුණයෙන් ඉහළ මිල්වෝම් පිටි, පහසුවෙන් ආහාරයට ගත හැකි සහ වෙළෙඳපොළට සුදුසු "ප්‍රෝටීන් බාර්" (Protein Bars) තුළට සාර්ථකව ඇතුළත් කරන්නේ කෙසේද යන්න සොයා බැලීමටයි.

අපි කහ මිල්වෝම් පිටි විවිධ මට්ටම් දෙකකින් (සාම්පල දෙකක් ලෙස) යොදා ගනිමින් ප්‍රෝටීන් බාර් නිපදවීමු:

1. 15% මිල්වෝම් පිටි අඩංගු ප්‍රෝටීන් බාර්
2. 12% මිල්වෝම් පිටි අඩංගු ප්‍රෝටීන් බාර්

පර්යේෂණයේදී, මෙම ප්‍රෝටීන් බාර්වල විශේෂයෙන් ප්‍රෝටීන් ප්‍රමාණය, රසය, වයනය සහ පෙනුම (පාරිභෝගික පිළිගැනීම) යන කරුණු සංසන්දනය කරන ලදී.

පර්යේෂණයේ මූලික ප්‍රතිඵල ඉතා සාර්ථකයි:

1. **පෝෂණ ගුණය වැඩි වීම:** මිල්වෝම් පිටි එකතු කිරීම නිසා, නිපදවූ බාර්වල සැලකිය යුතු තරම් ප්‍රෝටීන් ප්‍රමාණයක් අඩංගු විය. 15% පිටි අඩංගු බාර්වල ප්‍රෝටීන් ප්‍රතිශතය වඩා ඉහළ මට්ටමක පැවතිණි.
2. **ඉහළ පාරිභෝගික පිළිගැනීම:** රස පරීක්ෂණවලදී, මිල්වෝම් පිටි අඩංගු වුවද බාර්වල රසය, සුවඳ සහ වයනය සාම්ප්‍රදායික ප්‍රෝටීන් බාර්වලට සමාන හෝ ඊට වඩා හොඳ මට්ටමක පවතින බව පාරිභෝගිකයෝ ප්‍රකාශ කළහ. විශේෂයෙන් 15% මට්ටම රසයෙන් හා පිළිගැනීමෙන් හොඳම තත්ත්වයක් පෙන්නුම් කළ අතර, 12% මට්ටම ද ඉතා හොඳ තත්ත්වයක පැවතිණි.

චොකලට්වලින් ආවරණයක් යෙදීමෙන් මෙහි රසය තවත් උද්දීපනය කළ හැක.

ආහාර තුළට ඇතුළත් කිරීමේදී කෘමි කීටයන් පිටි බවට පත් කරන නිසා, සමහර පාරිභෝගිකයන්ගේ කෘමීන් කෙරෙහි ඇති අකමැත්ත ද බොහෝ සෙයින් අඩු වේ. දැනටමත් ලෝකයේ ප්‍රධාන පෙළේ රටවල් මෙවැනි ආහාර සඳහා හොඳ ඉල්ලුමක් පළ කරමින් සිටී.



මෙම නව නිෂ්පාදනය ශ්‍රී ලංකාව වැනි රටවල ආහාර සුරක්ෂිතතාව සහ ආර්ථිකය සඳහා විශාල අවස්ථාවක් සපයයි:

- දේශීයව කහ මිල්වෝම් වගා කිරීම හා සැකසීම තුළින් නව ව්‍යාපාරික අවස්ථා සහ ආදායම් මාර්ග නිර්මාණය කළ හැකිය.
- ක්‍රීඩකයන්ට හෝ පෝෂණ ඌනතා ඇති අයට වේගවත්, පහසු සහ ඉහළ ගුණාත්මක ප්‍රෝටීනයක් ලබා දිය හැකිය.
- සාම්ප්‍රදායික සත්ව නිෂ්පාදන හා සසඳන විට, මිල්වෝම් පිටි භාවිතය පරිසරයට වන හානිය අවම කරන අතර, තිරසාර ආහාර නිෂ්පාදනයට දායක වේ.

මෙම පර්යේෂණය මඟින් කෘමි ආහාර යනු හුදෙක් විකල්පයක් නොව, අපගේ අනාගත ආහාර පද්ධතියේ ප්‍රධාන අංගයක් බවට පත් කිරීමේ හැකියාව පෙන්නුම් කරයි.

අපට නොපෙනෙන කුඩා ලෝකයක ජීවය බිත්තරයක ආරක්ෂාව තීරණය කරයි



සඳුනි තිලකරත්න

ශ්‍රී ලංකාවේ ජනගහනය ඉතා වේගයෙන් වැඩි වන අතර, ඒ **සමඟම** ප්‍රෝටීන් **අවශ්‍යතාව ද** ඉහළ යයි. **මේ අවශ්‍යතාව** පෝෂණීය හා අඩු වියදම් මාර්ගයකින් සපුරාලීම සඳහා බිත්තර දමන කිකිළි කර්මාන්තය මහත් **භූමිකාවක්** ඉටු කරයි. බිත්තර ශ්‍රී ලංකා ජනතාවගේ දෛනික **ආහාරයේ** අත්‍යවශ්‍ය කොටසක් වන අතර, එය පෝෂණීය ප්‍රෝටීන්, විටමින්, හා ඛනිජ ලවණ **සම්පන්න** මූලාශ්‍රයක් ලෙස සැලකේ.

කෙසේ වෙතත්, මෙම කිකිළියන්ගේ **බඩවැල්** ආශ්‍රිතව **ජීවත්වන** ඊ. කෝලයි සහ සැල්මොනෙල්ලා වැනි බැක්ටීරියා නිසා මහජන සෞඛ්‍යයට සහ ගොවිපළේ ආර්ථිකයට **බරපතළ** තර්ජනයක් එල්ල වේ.

මෙම බැක්ටීරියා කිකිළියන්ගේ අසූචි හරහා පරිසරයට නිකුත් වී, බිත්තර කටුවලට ඇතුළු වී මිනිසුන්ට රෝග ඇති කළ හැක. විශේෂයෙන්ම සැල්මොනෙල්ලා ආසාදනය **බරපතළ** පාචනය සහ උණ ඇති කරන අතර, කිකිළි ගොවිපළවල්වලදී ඊ. කෝලයි නිසා රෝග **වැළඳීමෙන්** කිකිළියන්ගේ **ඵලදායිතාව** අඩු වී, මරණ සංඛ්‍යාව වැඩි විය හැක.



මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ බිත්තර දමන **කිකිළියන්ගේ අවස්කරයෙන් (Cloacal Swabs)** ලබාගත් සාම්පල හා අසූචි සාම්පල තුළ ඊ. කෝලයි සහ සැල්මොනෙල්ලා බැක්ටීරියා තිබේදැයි **වෙන්කර** හඳුනා ගැනීමයි. සාම්පල එකතු කිරීමෙන් පසු, ඒවා විශේෂ රසායනාගාර පරීක්ෂණ සහ තාක්ෂණික ක්‍රම මගින් වගා කර බැක්ටීරියා වෙන් කර හඳුනා ගන්නා ලදී.

පර්යේෂණ ප්‍රතිඵල මගින් ගොවිපළ සතුන්ට හා බිත්තර පාරිභෝගිකයන්ට වැදගත් වන කරුණු රැසක් හෙළි විය. අප පරීක්ෂා කළ කිකිළි ගොවිපළවල්වල ඊ. කෝලයි බැක්ටීරියා බහුලව පවතින බව තහවුරු විය. මෙය පෙන්නුම් කරන්නේ බිත්තර අපවිත්‍ර වීමේ අවදානම ඉහළ මට්ටමක පවතින බවයි.

පිරිසිදුකම අඩු ගොවිපළවල්වල මෙම බැක්ටීරියා වැඩි වශයෙන් හමු වූ අතර **එයින්** නිසි **ගොවිපළ** කළමනාකරණය සහ සනීපාරක්ෂක ක්‍රමවේද අනුගමනය කිරීමේ ඇති දැඩි වැදගත්කම සනාථ විය.

මෙම හඳුනා ගැනීම ගොවිපළ හිමියන්ට සහ මහජන සෞඛ්‍යයට **සෘජුවම** බලපායි. මෙම බැක්ටීරියා හඳුනා ගැනීමෙන්, රෝගී කිකිළියන්ගෙන් මිනිසුන්ට බිත්තර හරහා ආසාදන පැතිරීම වැළැක්වීමට අවශ්‍ය නිවාරණ ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට බලධාරීන්ට **මඟ** පෙන්වයි. ඊ. කෝලයි සහ සැල්මොනෙල්ලා ආසාදන පාලනය කිරීමෙන්, කිකිළියන්ගේ සෞඛ්‍යය වැඩි දියුණු කර නිෂ්පාදන අලාභයන් අවම කර ගත හැක.

මෙම බැක්ටීරියා හඳුනා ගැනීමෙන් පසු, ඒවාට ප්‍රතිජීවක ප්‍රතිරෝධයක් තිබේදැයි පරීක්ෂා කිරීමෙන්, රෝග ඇති වූ විට වඩාත් **ඵලදායී** ඖෂධ තෝරා ගැනීමට උපකාරී වේ.



මෙම පර්යේෂණය මගින් කිකිළි ගොවිපළේ පිරිසිදුකම වැඩි දියුණු කිරීම සහ බිත්තර භාවිතයේදී නිසි සනීපාරක්ෂක පුරුදු අනුගමනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ.

This is a non-technical summary of the project report titled "Isolation and characterization of *E. coli* and *Salmonella* spp. from cloacal swabs of small scale and medium scale commercial layer farms in Kurunegala District" supervised by Dr. W. M. M. P. Hulugalla*, Department of Animal Science, Faculty of Agriculture, University of Peradeniya. *malindaprashad@agri.pdn.ac.lk.

ඉවත දමන බලයා සහ කෙලවල්ලා අභ්‍යන්තර අවයව වලින් මාළු තෙල් හදන්න පුළුවන්ද?



රශ්මි දිනූෂිකා

ටූනා යනු ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් වැදගත්ම සමුද්‍ර මත්ස්‍ය සම්පතක් වන අතර එය ධීවර හා අපනයන අංශ සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයයි. විවිධ ටූනා විශේෂ අතර, බලයා (*Katsuwonus pelamis*) සහ කෙලවල්ලා (*Thunnus albacares*) රටේ බහුල මත්ස්‍ය විශේෂ දෙකක් වේ.

ටූනා සැකසීමේදී, හිස්, හම්, අස්ථි සහ විශේෂයෙන් අභ්‍යන්තර අවයව වැනි අතුරු නිෂ්පාදන විශාල ප්‍රමාණයක් ඉවත දමනු ලැබේ. මෙම අභ්‍යන්තර අවයව මුළු මත්ස්‍ය බරෙන් සැලකිය යුතු කොටසක් වන අතර නිසි ප්‍රයෝජනයකින් තොරව බොහෝ විට අපද්‍රව්‍ය ලෙස ඉවත දමනු ලැබේ. ටූනා අභ්‍යන්තර අවයව අනිසි ලෙස බැහැර කිරීම පරිසර දූෂණයට හේතු වනවා පමණක් නොව, විවිධ පෝෂ්‍ය පදාර්ථ වලින් පොහොසත් වටිනා ජෛව සම්පත් අහිමි වීම ද සිදු වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ටූනා මත්ස්‍යයන්ගේ අභ්‍යන්තර අවයව කාර්යක්ෂමව භාවිත කිරීම ගවේෂණය කිරීම, නාස්තිය අවම කිරීම සහ පාරිසරික බලපෑම අවම කිරීමයි.

බලයා සහ කෙලවල්ලා මාළු අභ්‍යන්තර අවයව සාම්පල දේශීය මත්ස්‍ය වෙළඳපොළවල් සහ මාළු සැකසුම් ඒකක වලින් එකතු කර රසායනාගාරයේදී පිරිසිදු ජලයෙන් හොඳින් සෝදා කුඩා කැබලිවලට කපා පසුව නිස්සාරණය සඳහා භාවිත කරන ලදී. සකස් කරන ලද අභ්‍යන්තර අවයව සාම්පල පැය 1ක් 90°C දී රත් කර, පසුව කාමර උෂ්ණත්වයට සිසිල් වීමට ඉඩ දෙන ලදී. ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා මිශ්‍රණය මස්ලින් රෙදි හරහා පෙරීම සිදු කරන ලදී.

ඉන්පසු පෙරහන මිනිත්තුවට හාරදහස් වතාවක කේන්ද්‍රාපසාරී බලයක් ඔස්සේ විනාඩි 20ක් ක්‍රියා කර පැහැදිලි ස්ථර වෙන් කිරීම සඳහා නැවත විනාඩි 15ක් මිනිත්තුවට හයදහසක කේන්ද්‍රාපසාරී බලයක ක්‍රියා කරන ලද අතර, එහිදී තෙල් තට්ටුව ඉහළින් පැහැදිලිව දැකගත හැකි වූ අතර ප්‍රවේශමෙන් එකතු කරන ලදී. ඉන්පසු ආලෝකයෙන් සහ ඔක්සිකරණයෙන් ආරක්ෂා කිරීම සඳහා ශීත තත්ත්ව (4°C) යටතේ තද දුඹුරු පාට වීදුරු බෝතල්වල ගබඩා කරන ලදී.

බලයා සහ කෙලවල්ලා අවයව වලින් ලබාගත් මාළු තෙල් එහි භෞතික, රසායනික සහ ක්ෂුද්‍රජීවී ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා විශ්ලේෂණය කරන ලදී. කෙසේ වෙතත්, මෙම විශ්ලේෂණයන් පමණක් තෙල්වල ගුණාත්මකභාවය සහ ආරක්ෂාව සම්පූර්ණයෙන්ම තහවුරු කිරීමට ප්‍රමාණවත් නොවේ. එබැවින්, ප්‍රතිඵල ජාත්‍යන්තර මාළු තෙල් තත්ත්ව ප්‍රමිතීන් සමඟ සංසන්දනය කරන ලදී.

බලයා සහ කෙලවල්ලා අභ්‍යන්තර අවයව භාවිත කර නිස්සාරණය කළ තෙල් වර්ග දෙකම හොඳ තත්ත්වයේ බව සොයා ගන්නා ලදී. කෙසේ වෙතත්, කෙලවල්ලා තෙල් උසස් ලක්ෂණ පෙන්නුම් කළේය.

ලිපිඩ, ප්‍රෝටීන, විටමින් සහ අත්‍යවශ්‍ය මේද අම්ලවල ඉහළ අන්තර්ගතයක් ඇති නිසා මෙම තෙල් ආහාර, ඖෂධ සහ අනෙකුත් කර්මාන්ත ඇතුළු විවිධ අංශවල තවදුරටත් යෙදීමට සුදුසු බවට තහවුරු වේ. විශේෂයෙන්, තෙල්වල ඔමේගා-3 මේද අම්ල බහුල වන අතර ඒවා හෘද වාහිනී සෞඛ්‍යයට සහ සංජානන ක්‍රියාකාරිත්වයට ප්‍රයෝජනවත් වේ.


වර්තමානයේ, ටූනා අභ්‍යන්තර අවයව බොහෝ දුරට අපද්‍රව්‍ය ලෙස ඉවත දමන අතර එමඟින් පාරිසරික හා ආර්ථික පාඩු සිදු වේ. උසස් තත්ත්වයේ මාළු තෙල් වැනි අගය එකතු කළ නිෂ්පාදන නිස්සාරණය කිරීමෙන්, මෙම අතුරු නිෂ්පාදන ඵලදායී ලෙස භාවිත කළ හැකි බවත්, තිරසාර මත්ස්‍ය කර්මාන්තයකට දායක විය හැකි බවත්, සමුද්‍ර සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම ප්‍රවර්ධනය කළ හැකි බවත් මෙම අධ්‍යයනයෙන් පෙන්නුම් කෙරේ.



බලයා



කෙලවල්ලා



නිස්සාරණය කල මාළු තෙල්

කඳුකරයේ සල්ලි ගසේ සැඟවුණු රහස්



පවිත්‍රා ජයසූරිය

"කඳුකරයේ කප් රුක" නොහොත් සල්ලි ගස ලෙසින් ප්‍රකට, ශ්‍රී ලාංකීය කුළුබඩු අතර අද්විතීය ස්ථානයක් හිමි කර ගන්නා තවත් එක් අපනයන භෝගයක් ලෙස "සාදික්කා" හැඳින්වීමට හැකිය. මහනුවර, මාතලේ සහ කෑගල්ල යන පරිපාලන දිස්ත්‍රික්කවල ගෙවතු ආශ්‍රිතව වැවෙන සාදික්කා ශාකය ඉතා අඩු කෘෂි යෙදවුම් සමඟින් වගා කිරීමට හැකි වීමම අපූර්වත්වයකි. හොඳින් පැසුණු පසු නෙළාගත්, හොඳින් වියළන ලද සාදික්කා සඳහා ඉතා හොඳ ඉල්ලුමක් දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළේද පවතී.

ඉතා උසස් තත්ත්වයේ ඵලදාවක් ලබා ගැනීම සඳහා, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශය වන්නේ සාදික්කා ඵල උපරිම අවස්ථාවට මේරූ පසු නෙළා ගැනීමයි. නමුත් බොහෝ වගාකරුවන් පෙළඹී සිටින්නේ හොඳින් මේරූ සාදික්කා සමඟ, නොමේරූ සාදික්කා (බුබුළු) ද නෙළා ගැනීමටයි. රිලවුන් වැනි සතුන්ගේ හානි, ශ්‍රමය සොයා ගැනීමේ ගැටලු හා කාලගුණ වෙනස්වීම් මීට හේතු වී තිබේ.



ගොවීන් විසින් සපයන ලද විවිධ පරිණත අවධිවලට අයත් සාදික්කා

නොමේරූ සාදික්කාවල අධික ජල ප්‍රමාණයක් (75-85%) අඩංගු වන අතර වියළීමට ඉතා වැඩි කාලයක් ගත වෙයි. තවද, අධික ජල ප්‍රමාණය නිසා විෂ සහිත දිලීර වර්ග වර්ධනය වීමේ හැකියාවද වැඩිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, නොමේරූ සාදික්කා නෙළීමෙන් ගොවියාට ලැබෙන ලාභය ඉතා අඩු මට්ටමක පවතී.

මෙම නොමේරූ සාදික්කා ඉතාම අඩු මුදලකට අලෙවි වුවද, මේ වන විට සිදු කර ඇති කිසිදු පර්යේෂණයක සාදික්කා ඵලයේ විවිධ කොටස් (බීජය, වසාවාසිය සහ ලෙල්ල) සහ එහි පරිණත අවධීන් (මේරූ සහ නොමේරූ) යන ද්විත්වයම සලකා බලමින්, එහි පෝෂක සංයෝජනය සහ ගුණාංග කෙසේ වෙනස් වන්නේද යන වග විශ්ලේෂණය කර නොමැත.

ඒ අනුව, පේරාදෙණිය සරසවියේ කෘෂිකර්ම පීඨයේ සිසුවියක වන මා විසින්, සාදික්කා ඵලයේ බීජය, වසාවාසිය සහ ලෙල්ල යන කොටස්, එහි මේරූ සහ නොමේරූ අවධි සමඟ සන්සන්දනය කරමින් සාදික්කා ඵලයේ එක් එක් කොටස්වල පෝෂණ සංයුතිය, ප්‍රතිඔක්සිකාරක සංයුතිය සහ ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරිත්වය සඳහා පරීක්ෂාවට ලක් කළෙමි.

එම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස නොමේරූ සාදික්කාවල පවතින ඉතා විශිෂ්ට ගුණාංගයක් අනාවරණය කර ගැනීමට හැකි විය. ඒ අනුව, නොමේරූ සාදික්කා යනු ප්‍රතිඔක්සිකාරක සංයෝග සහ ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරිත්වයෙන් අනූන වූ ස්වභාවික ද්‍රව්‍යයකි. විවිධ බෝ නොවන රෝගවලට මූල පුරන හා නොයෙකුත් හේතු රාශියක ප්‍රතිඵලයක් ලෙස ශරීරයේ ඇතිවන ඔක්සිකරණ තත්ත්වය සෞඛ්‍යය පිළිබඳව සැලකිලිමත් වන සෑම පාර්ශ්වයකගේම වැඩි අවධානයට යොමු වී ඇත. රෝග නිවාරණයට සිදු කරන දායකත්වය මෙන්ම ආහාර පරිරක්ෂණයේදී ද මෙම ප්‍රතිඔක්සිකාරක මැදිහත් වේ. කෘත්‍රිමව සංශ්ලේෂණය කරන BHT හා BHA වැනි ප්‍රතිඔක්සිකාරක පිළිබඳ මතභේදාත්මක වටපිටාවක් නිර්මාණය වී ඇති වකවානුවක ස්වභාවික ප්‍රතිඔක්සිකාරක නිස්සාරණය කර ගැනීමෙහිලා මං විවර කරන මෙම හෙළිදරව්ව වත්මන් සාදික්කා වගාව නවමු මානයකට ගෙන යන්නකි.

තවද, සාදික්කා ඵලය සැලකූ විට, එහි මුළු බරෙන් 80-85% ක ප්‍රමාණයකට හිමිකම් කියන සාදික්කා ලෙල්ල, කිසිදු ප්‍රයෝජනයකින් තොරව ගස් යට දිරාපත් වේ. නමුත් මෙම පර්යේෂණයේ තවත් ප්‍රතිඵලයක් ලෙස මෙම ගැටලුව සඳහා ප්‍රායෝගික විසඳුමක් යෝජනා කිරීමට හැකි විය. පරීක්ෂණ ප්‍රතිඵලවලට අනුව, සාදික්කා ලෙල්ල ඉහළ ජල සංයුතියක්, ඉහළ තන්තු ප්‍රමාණයක් හා ඉතා අඩු මේද ප්‍රතිශතයකට හිමිකම් දරන අතර, සැලකිය යුතු තරම් ප්‍රතිඔක්සිකාරක සංයුතියක් හා ක්‍රියාකාරිත්වයක් ද පෙන්වීය. සාදික්කා ලෙල්ලේ පවතින මෙම ගුණාංග වාසිදායක ලෙස යොදා ගනිමින්, ජෑම්, ජෙලි සහ මාමලේඩ් වැනි ආහාර නිෂ්පාදනය කිරීමට ඉතා හොඳ හැකියාවක් පවතී.

මේරූ සාදික්කා සමඟින්ම වෙළඳපොළට යන නොමේරූ සාදික්කා, එමඟින් ගෙන දිය හැකි උපරිම ගුණාත්මකභාවය සහ ලාභය හීන කරන බව නොරහසකි. නොමේරූ සාදික්කා, සාම්ප්‍රදායික වියළි කුළුබඩුවකට හෝ තෙල් නිස්සාරණයට පමණක් සීමා නොකර නවමු මානයකට යොමු කරවන්නට මෙම නවමු හෙළිදරව්ව සමත් වේ.



දිරාපත් වන සාදික්කා ලෙලි



නොමේරූ අවස්ථාවේදී නෙළාගත්, හිරු එළියේ වියළන ලද ගුණාත්මකභාවයෙන් අඩු සාදික්කා

නොදැන විසි කරන දේශීය පෝෂක



D.M.R.W. දිසානායක

කොස් එසේත් නැතිනම් *Artocarpus heterophyllus* යනු ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඉන්දුනීසියාව සහ පිලිපීනය වැනි නිවර්තන කලාපීය රටවල වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇති ශාකයකි. ශ්‍රී ලංකාවේ පුරාණයේ සිට "බත් ගස" (හෙරලිය) ලෙස අන්වර්ථ නාමයෙන් හඳුන්වන කොස් ආහාරයක් ලෙස විශාල කාර්යයක් ඉටු කරයි. ළපටි අවධියේදී පොලොස් එළවළුවක් ලෙස ගන්නා අතර තරමක් පැසුණු විට එය කොස් වේ. හොඳින් පැසුණු (ඉදුණු) කොස් "වරුකා" ලෙසින් පලතුරක් ලෙස ගනී.

සාමාන්‍යයෙන්, එක් කොස් ගසක ගෙඩි 10–200 ත් අතර ප්‍රමාණයක් පල දරන අතර එක් කොස් ගෙඩියක ප්‍රමාණය 3–18 kg පමණ වේ. "වැල්" සහ "වරුකා" ලෙස ප්‍රභේද දෙකක් පවතින කොස් බහුවිධ පලතුරකි. කොස් ගෙඩියේ ඇතුළත කෑමට ගන්නා මෘදු සහ මාංශලමය මදුළු ඇති අතර මදුළු තුළ පිෂ්ඨමය බීජ (කොස් ඇට) ඇත. මදුළු හා කොස් ඇට හැරුණු විට ඉතිරි සියලු කොටස් ආහාරයට නොගනී. කටු සහිත පිටත පොත්ත සහ ඊට ඇතුළතින් ඇති සුදු පැහැති මාංශලමය කොටස (රින්ද / rind), මැද කොටස (core / කෝර්), සහ ඉරි (rags / රැග්ස්) වශයෙන් කොස් ගෙඩියේ මුළු බරෙන් 30%–40% පමණ ආහාරයට නොගෙන පරිසරයට මුදා හරී. එමෙන්ම කොස් හටගන්නා වාරයේදී පරිභෝජනයට නොගෙන ගෙඩි විශාල ප්‍රමාණයක් විනාශ වී යන නිසා පසු-අස්වැන්න හානිය අධික ශාකයකි. මේ නිසා කොස් යම් තරමකට පරිසර දූෂණයට හේතු වේ.

නමුත් මෙම කොස් ගෙඩියේ ඉවතලන ද්‍රව්‍ය ආහාරයට ගැනීම පිළිබඳව කරන ලද පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව, මෙම ඉවතලන කොස් ද්‍රව්‍ය වියළා පිටි බවට පත් කිරීමෙන් තිරිඟු පිටිවලට ආදේශකයක් ලෙස භාවිත කිරීමට, එනම් බිස්කට්, කේක් හෝ පාන් වැනි විවිධ ආහාර වර්ග සකස් කිරීමට යොදා ගත හැකි බව පැහැදිලි විය.

කොස් ඉවතලන ද්‍රව්‍යවලින් පිටි සාදා ගන්නා ආකාරය

මෙම පරීක්ෂණයේදී මදුළු, ඇට සහ කටු සහිත පිටත සන පොත්ත ඉවත් කිරීමෙන් පසු ඉතිරි වන සියලුම කොටස් යොදා ගත් අතර මිනිත්තු 8–10 ත් අතර කාලයක් වාෂ්පයෙන් තම්බා 60 °C උෂ්ණත්වයේ පැය 16 ක් පමණ වියළා පිටි කර ගැනීමෙන් කොස් ඉවතලන ද්‍රව්‍යවල පිටි හෙවත් **Jackfruit waste flour** සාදා ගන්නා ලදී. පසුව මෙම කොස් ඉවතලන ද්‍රව්‍යවල පිටි සමඟ කොස් මදුළු පිටි සහ තිරිඟු පිටි 1:1:1 අනුපාතයට මිශ්‍ර කිරීමෙන් ඉවතලන කොස්-තිරිඟු සංයුක්ත පිටි මිශ්‍රණය සාදා ගන්නා ලදී. සංයුක්ත පිටි මිශ්‍රණයේ ගුණාත්මක බව බැලීම සඳහා පෝෂණ සංයුතිය සහ ක්‍රියාකාරී ගුණාංග නිර්ණය කරන ලදී.



ප්‍රක්‍රියා ප්‍රවාහය (Process Flow):

1. නවුම් කොස් ඉවතලන කොටස් සෝදා පිරිසිදු කර ගැනීම
2. සිට්‍රික් ඇසිඩ් ද්‍රාවණයක ගිල්වීම
3. කුඩා කොටස්වලට කපා ගැනීම
4. වාෂ්පයෙන් තම්බා ගැනීම
5. වියළා ගැනීම
6. පිටි කර කුඩා සිදුරු සහිත පෙනේරයකින් හලා ගැනීම

වාසි හා වැදගත්කම

මෙම සංයුක්ත පිටි මිශ්‍රණය තිරිඟු පිටිවලට වඩා ගුණදායක වන්නේ එහි අඩංගු වන අතිරික්ත තන්තුව (fiber) සහ ප්‍රතිඔක්සිකාරක ගුණය, වඩා අඩු පිරිවැයකින් නිෂ්පාදනය කළ හැකි වීම සහ දේශීය වෙළඳපොළ අවස්ථා වැඩි කර ගත හැකි වීම නිසාය. එමෙන්ම පරිසරයට මුදා හරින අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු වීම, පසු-අස්වැන්න හානිය අඩු වීම සහ තිරිඟු පිටි පරිභෝජනය අඩු කිරීමටද උපකාරී වේ. තවද, තිරිඟු පිටි ආහාරයට ගැනීමෙන් ඇති වන මලබද්ධය වැනි රෝගවලට මෙන්ම ග්ලූටන් ප්‍රතිරෝධීතාවයටද (gluten intolerance) විසඳුමක් වේ.





සොසේජස් වල තන්තු පෙරළිය



සුමුදු ජයතිලක

ප්‍රශ්නය හඳුනා ගැනීම

ලොකු කුඩා කවුරුත් ආසාවෙන් පරිභෝජනය කරන සොසේජස් කරල් වල පෙනුමට, රසයට විශාල වශයෙන් වගකියන ආහාරමය තන්තු පිළිබඳවයි අද ලිපියේ සඳහන් වන්නේ. ලෝකයේ සුලභ වශයෙන් ආහාරපානාදිය පිළියෙල කිරීමට සිට්‍රස් තන්තු භාවිතා කෙරේ. සිට්‍රස් තන්තු වෙන්කර ගන්නේ සිට්‍රස් පළතුරු වල පොත්තෙනි. නමුත් අවාසියට කරුණ නම් එහි මිල අධික බවයි. මෙම හේතුව නිසා ශ්‍රී ලංකාවේ බොහෝ වාණිජ සොසේජස් නිෂ්පාදකයින් අහිතකර සෞඛ්‍ය ප්‍රතිලාභ නොසලකමින් පොස්ෆේට්, නවීකරණය කරන ලද පිෂ්ඨය, වෙන් කරන ලද සෝයා ප්‍රෝටීන යනාදිය භාවිතා කිරීමට පෙළඹී තිබේ. මෙම තත්ත්වය වෙනස් කිරීම සඳහා සොසේජස් වල පෙනුමට, රසට හානියක් නොවන පරිදි භාවිතා කළ හැකි වෙනත් තන්තු ප්‍රභවයක් සොයා බැලීමේ අවශ්‍යතාව මතුව තිබේ.

ප්‍රශ්නයට විසඳුමක් සෙවීම

මේ සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යාවක් Edicol® වෙළඳ සන්නාමය යටතේ එන මිලෙන් ඉතා අඩු ගුවා තන්තු, සිට්‍රස් තන්තු වෙනුවට භාවිතා කළ හැකිදැයි සොයා බලා ඇත. (ගුවා තන්තු ලබාගන්නේ ගුවා ඇටවල අභ්‍යන්තර පිෂ්ඨයෙනි.) පරීක්ෂණ සැලසුම සැකෙවින් මෙසේය. සොසේජස්, සිට්‍රස් තන්තු හා ගුවා තන්තු යොදා ගනිමින් විවිධ සංකලන යටතේ වර්ග හතරක් සාදා ඇත. පළමු වර්ගය 100% ක්ම සිට්‍රස් තන්තු වලින් ද, දෙවන වර්ගය 50% බැගින් සිට්‍රස් තන්තු සහ ගුවා තන්තු යොදා ගනිමින් ද, තෙවන වර්ගය 25% සිට්‍රස් තන්තු සහ 75% ගුවා තන්තු යොදා ගනිමින් ද, හතරවන වර්ගය 100% ක්ම ගුවා තන්තු යොදා ගනිමින් ද සාදා තිබේ. අනතුරුව එම සොසේජස් වර්ග හතරට විවිධ භෞතික රසායනික පරීක්ෂා, ක්ෂුද්‍රජීවී පරීක්ෂා නිෂ්පාදනයෙන් අනතුරුව දින 1, 7 සහ 14 යන දින වලදී සිදු කරන ලදී. එසේම විශ්වවිද්‍යාලයේ සිසුන් යොදා ගනිමින් රස ඇගයීමක් ද (sensory evaluation) පෙනුම, රස, සුමුදු ගතිය යන ලක්ෂණ යටතේ සිදු කරන ලදී.

පුදුම සහගත ප්‍රතිඵලය

විවිධ ප්‍රමාණ වලින් සිට්‍රස් හා ගුවා තන්තු යොදා ගනිමින් සෑදූ සොසේජස් වර්ග 4 හිම භෞතික රසායනික හා ක්ෂුද්‍රජීවී ගුණ සමාන විය. තවත් පුදුමයට කරුණ නම් රස ඇගයීමේ දීද සිසුන් වැඩි හරියක් කැමති වී ඇත්තේ 100% ගුවා තන්තු යොදා ගනිමින් සෑදූ සොසේජස් වලටය.

අවසන් නිගමනය

සොසේජස් වල පෙනුමට, රසට සහ වෙනත් ගතිලක්ෂණ වලට හානියක් නොවන පරිදි මිල අධික සිට්‍රස් තන්තු වෙනුවට මිලෙන් ඉතා අඩු ගුවා තන්තු භාවිතා කළ හැකි බව මෙම පරීක්ෂණයෙන් අනාවරණය විය.



ඔබේ සුරතල් බළලාට ඔබ ලබා දෙන ආහාරය පෝෂණයෙන් පිරිපුන්ද?



ඩබ්ලිව්. කෘෂාරා හර්ෂණී ප්‍රනාන්දු

බළලුන් යනු බොහෝ ශ්‍රී ලාංකික නිවෙස්වල සුරතල් සත්වයෙකුට එහා, පවුලේම සාමාජිකයෙකු ලෙස ආදරයට ලක් වෙන සිත් ඇදගන්නා සුළු අපූරු ජීවීන් කොට්ඨාසයක් බව අප කවුරුත් දන්නා කාරණයක්. බොහෝ හිමිකරුවන් විශ්වාස කරන්නේ ලොම් පිරුණු මේ තම මිතුරන් සඳහා නිවසේදීම නැවුම් ආහාර පිළියෙල කිරීම සෞඛ්‍ය සම්පන්නම විකල්පය බවයි. නමුත්, ඔවුන් නිරෝගීව සිටීමට බළලෙකුට අවශ්‍ය සියලු දේ මෙම ආහාරවලින් ලැබෙනවාද කියා ඔබ කවදා හෝ කල්පනා කර තිබෙනවාද? ආදරයෙන් පිරුණු නමුත්, ඔබ නිවසේ පිළියෙල කරන මේ ආහාර ඇත්ත වශයෙන්ම විද්‍යානුකූලව ගෘහස්ථ බළලුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලන්නේද යන්න සොයා බැලීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය.

මේ ගැන සිතා බැලීම වැදගත් වන්නේ ඇයි?

බළලුන් යනු අද්විතීය මනාපයන් සහ ආහාර අවශ්‍යතා සහිත ස්වාභාවික දඩයම්කරුවන් බව ඔවුන් පැවතගෙන ඒමේ මූලාරම්භය දෙස හැරී බැලීමේදී මනාව පැහැදිලිය. අපගේ ගෘහාශ්‍රිත බළලුන් අදටත් ඔවුන්ගේ මුල් මුතුන්මිත්තන්ගේ දඩයම්කාරී සහජ බුද්ධීන් සියල්ලම පාහේ රඳවා තබා ගනී. ඔවුන්ගේ පූර්වගාමීන් හා සමාන අනිවාර්ය මාංශ භක්ෂකයන් ලෙස, බළලුන්ට මස්වලින් පොහොසත් ආහාර වේලක් අත්‍යවශ්‍ය වේ. මන්දයත් ඔවුන්ගේ ශරීරය ප්‍රධාන වශයෙන් මස්, මාළු වැනි ආහාරවල ඇති අත්‍යවශ්‍ය පෝෂකාංග මත රඳා පවතී. මොවුන්ගේ ආහාරයේ මූලික අංගය ලෙස සත්ව පාදක ප්‍රෝටීන සඳහන් කළ හැක. මෙයට අමතරව මේද අම්ල, විටමින් සහ ඛනිජ ලවණ වැනි පෝෂක මෙන්ම "ටෝරීන්" වැනි බළලුන්ට තනිවම සංස්ලේෂණය කළ නොහැකි අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල මොවුන්ගේ ආහාර වේලෙහි අනිවාර්ය අංගයන් වේ. මෙම ටෝරීන් නම් පෝෂකය බළලුන්ගේ ප්‍රතිශක්තිය, වර්ධනය, ප්‍රජනන ක්‍රියාවලිය සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම පෝෂක නොමැතිව මොවුන්ට දුර්වල අස්ථි, හෘද රෝග, සහ පෙනීමේ දුර්වලතා වැනි බරපතල සෞඛ්‍ය ගැටලු ඇති විය හැක.

බෝහෝ හිමිකරුවන් තම බළල් සුරතලා වෙනුවෙන් නිවසේ පිළියෙල කරගන්නා මෙම ආහාර වේලයන්හි සාලයන්, ලින්නා වැනි මාළු වගර්, බත්, පරිප්පු සහ එළවළු වැනි අමුද්‍රව්‍ය භාවිතා කරන බවත්, මෙම ආහාර බළලුන් සඳහා වන ජාත්‍යන්තර පෝෂණ මාගෙර්ෑපදේශ සමග සසඳා බැලීමේදී, වැදගත් ගැටලු කිහිපයක් මෙම අධ්‍යයනය මගින් සොයා ගන්නා ලදි. ඒ අනුව බොහෝ හිමිකරුවන් තම සුරතලාට පෝෂ්‍යදායී ආහාර ලබා දීමට උපරිමයෙන් උත්සාහ කළද, නිවසේ පිළියෙල කරන ලද මෙම ආහාර ඇතැම් පෝෂක අවශ්‍යතා සපුරාලීමට අසමත් වන බව අනාවරණය විය. ඒ අතරින් ප්‍රෝටීන සහ ශක්ති ප්‍රමාණයන් බොහෝ විට ප්‍රමාණවත් වුවද ඇතැම් කැල්සියම්, පොස්ෆරස් වැනි ඛනිජ ලවණ, සහ විටමින් B1, B3 යනාදී අත්‍යවශ්‍ය පෝෂක කොටස් බොහෝ ආහාර වේලයන්හි ඌනතා ලක්ෂණ පෙන්වයි. ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපගේ ප්‍රධාන ආහාර වේලට අප බත් එකතු කරගන්නා සේ ඔබේ සුරතල් බළලාගේ ආහාර වේලෙහි බත් හෝ එළවළු මත අධික ලෙස රඳා පැවතීමෙන් මොවුන්ගේ යහපැවැත්මට අත්‍යවශ්‍ය පෝෂක කොටස් අඩු වන බව මෙම අධ්‍යයනයෙන් තහවුරු විය.

මේ බළලුන්ගේ ජීවිත කාලය පුරාවටම ඔවුන්ගේ සෞඛ්‍ය ගැටලුවලින් අතිමහත් බහුතරයක් ඔවුන්ගේ පෝෂණයෙන් පැන නගින හෙයින් ඔවුන්ගේ පෝෂණය පිළිබඳව ඔබ ගන්නා තීරණ මේ සඳහා දැඩි බලපෑමක් ඇති කරයි. මේ අනුව වඩාත් සෞඛ්‍ය සම්පන්න සහ ස්වාභාවික යැයි විශ්වාස කරමින්, ඔබේ සුරතල් බළලාට ඔබ නිවසේදී පිළියෙල කරගන්නා ලද ආහාර, ඔවුන්ගේ නිරෝගී පැවැත්මට අවශ්‍ය සියලුම පෝෂක කොටස් මෙම ආහාර තුළින් ලබා දෙන්නේද යන්න දෙවරක් සිතා බැලිය යුතු කාරණාවක් බවට පසක් වේ. එබැවින්, සුරතලාගේත් ඔබේත් සුබසිද්ධිය වෙනුවෙන් නැවත වරක් සිතා බලා කටයුතු කිරීමට කාලයයි මේ.



This is a non-technical summary of the project report titled "Nutritional adequacy of home-prepared diets for Sri Lankan indoor cats visiting Peradeniya veterinary teaching hospital," supervised by W.N.U. Perera, Department of Animal Science, Faculty of Agriculture, University of Peradeniya. nipunap@agri.pdn.ac.lk

සිලියම් හස්ක්, කොහිල සහ කොල්ලු එකතුවෙන් ඉහළ පෝෂණයෙන් යුතු ආහාරමය තන්තු බහුල කුකීස්



එස්. ජේ. අවිශ්කා පුන්සරණි

ආහාරමය තන්තු ඔබ දැනුවත්ද? සාමාන්‍ය පුද්ගලයකු විසින් දිනකට තම ශරීරයට සපුරාගත යුතු ආහාරමය තන්තු ප්‍රමාණය පිළිබඳ ඔබ අසා තිබේද?

ආහාරමය තන්තු යනු මිනිස් ශරීරයට අත්‍යවශ්‍ය නමුත් අප විසින් අඩු අවධානයක් යොමු කරන පෝෂක වගර්යකි. විද්‍යාත්මක ඇසින් බැලීමේදී, ආහාරමය තන්තු යනු මිනිස් ආහාර ජීර්ණ පද්ධතියේ එන්සයිම මගින් සම්පූර්ණයෙන්ම බිඳහෙලිය නොහැකි ශාකමය ආහාර කොටස් වේ. මෙය ජීර්ණය නොවන කාබෝහයිඩ්‍රේට් සහ ශාකමය ආහාර කොටස් වන සේලියුලෝස් (cellulose), හෙමිසේලියුලෝස් (hemicellulose), ලිග්නින් (lignin), පෙක්ටින් (pectins), ගම් (gums) වැනි වගර්යන්ගෙන් සමන්විත වේ. පළතුරු, එළවළු, ධාන්‍ය වගර්, රණිල බෝග වැනි ආහාර වල ප්‍රධාන වශයෙන් මෙම ආහාරමය තන්තු අඩංගු වේ. ආහාරමය තන්තු, නිසි පරිදි, ප්‍රමාණවත් ලෙස ආහාරයට ගැනීම ජීර්ණ පද්ධතිය ක්‍රමානුකූලව පවත්වා ගැනීමට ප්‍රයෝජනවත් වන අතර, මළබද්ධය වැළැක්වීමට, අධි බර පාලනයට, සහ දියවැඩියාව, හෘද රෝග සහ පිළිකා තත්ත්ව වැනි රෝග අවදානම් අඩු කිරීමට උපකාරී වේ. එමෙන්ම හිතකර ආන්ත්‍රික බැක්ටීරියා වධර්නය සඳහාද දායකත්වය ලබාදෙයි.

පෝෂණවේදීන් දිනකට තන්තු ග්‍රෑම් 20 සිට 35 දක්වා ප්‍රමාණයක් නිදෙර්ශ කරනු ලබන අතර, නමුත් ලෝකයේ බොහෝ දෙනා එම ප්‍රමාණය දිනකට නිසි පරිදි පරිභෝජනය කිරීමට අපොහොසත් වෙති. මෙම ගැටලුව සඳහා පිළිතුරක් වශයෙන්, එක් ප්‍රායෝගික ක්‍රමයක් නම් මිනිසුන් දැනටමත් භුක්ති විඳින ආහාර පොහොසත් කිරීමයි.

කුකීස් යනු ලොව බොහොමයක් වඩාත්ම ප්‍රිය කරන කෙටි ආහාර වලින් එකකි. නමුත් ඒවායේ හුරුපුරුදු රසය පිටුපස නිහඬ ගැටලුවක් සැඟවී ඇත. බොහෝ කුකීස් ශරීරයේ වැදගත්ම පෝෂ්‍ය පදාර්ථ වලින් එකක් වන මෙම ආහාරමය තන්තු අවම ලෙස අන්තගර්ත වන පිරිපහදු කළ තිරිඟු පිටි වලින් සාදා ඇත. මෙම අධ්‍යයනය, අපට මගහැරෙන එම ආහාරමය තන්තු ප්‍රමාණය ශරීරයට එක්කර ගැනීමට එක් ආකාරයක් වන ආහාරමය තන්තු ප්‍රමාණය ඉහළ නංවා ඇති කුකීස් වගර්යක් හඳුන්වාදීම සිදු කරනු ලබයි.

සිලියම් හස්ක් (Psyllium husk) යනු *Plantago ovata* යන ශාකයෙන් ලබා ගන්නා, විශාල ලෙස ද්‍රාව්‍ය ආහාරමය තන්තු අන්තගර්ත, ප්‍රධාන වශයෙන් ඉන්දියාව, පාකිස්තානය සහ ඉරානය යන රටවල්හි වගා කරනු ලබන අමුද්‍රව්‍යයකි. එය ජලය සමඟ මිශ්‍ර වන විට ජෙල් ආකාරයේ ද්‍රව්‍යයක් බවට පත්වන අතර ජීර්ණ පද්ධතියේ සෞඛ්‍යය වධර්නය කිරීමට, මළබද්ධය වැළැක්වීම, රුධිරයේ කොලස්ටරෝල් සහ සීනි මට්ටම් පාලනය සහ බර පාලනය ඇතුළු බොහෝ කායර්යන් රැසක් සඳහා දායකත්වය දක්වයි. එමෙන්ම, ආහාර කම්ර්ාන්තය සඳහාද සුවිශේෂී දායකත්වයක් දක්වයි.

එමෙන්ම, ශ්‍රී ලංකාවේ අඩු අවධානයක් යොමු කරන කොහිල සහ කොල්ලු බෝගයන්හිද ආහාරමය තන්තු ඉහළ අගයන්ගෙන් අන්තගර්ත වේ.

මෙම අධ්‍යයනයේ අරමුණ වශයෙන්, තිරිඟු පිටි, සිලියම් හස්ක් (Psyllium husk), කොහිල පිටි (*Lasia spinosa*), සහ කොල්ලු පිටි (Horse gram; *Macrotyloma uniflorum*) මගින් සුදුසු පරිදි ප්‍රතිස්ථාපනය කරමින් ආහාරමය තන්තු අධික කුකීස් (Fiber-enriched cookies) සැකසීම සහ ඒවායේ භෞතික - රසායනික හා රස ඇගයීම අධ්‍යයනය කිරීමයි.

සිලියම් හස්ක්, කොහිල සහ කොල්ලු පිටි, නිසි පරිදි තෝරාගත් ප්‍රමාණයන්හි එකතුවක්, තිරිඟු පිටි අන්තගර්තයෙන් 30% සහ 40% ක් ප්‍රතිස්ථාපනය කර සංයුක්ත පිටි මිශ්‍රණ සකස් කර ඇති අතර, තිරිඟු පිටි 100% භාවිතා කළ කුකීස් පාලක (Control) ලෙස භාවිතා කර ඇත. කුකීස්වල භෞතික පරාමිතීන් වන බර, ඝනකම, විෂ්කම්භය සහ පැතිරීමේ අනුපාතය අතර අසමානතාවයක් දැකිය නොහැකි අතර, වණර්යේ සුළු වෙනසක් පමණක් දක්නට ලැබුණි. සංවේදී විශ්ලේෂණය අනුව, සිලියම් හස්ක් 20%, කොහිල පිටි 5%, කොල්ලු පිටි 5% යන සංයෝගය (තිරිඟු පිටි 30% ප්‍රතිස්ථාපනය) අඩංගු සංයුතිය තේරී පත් වූ අතර එහි ජල ප්‍රමාණය, මේද ප්‍රමාණය, තන්තු ප්‍රමාණය, සහ ඇෂ් (Ash) ප්‍රමාණය ඉහළ අගයන් සහ ප්‍රෝටීන් සහ කාබෝහයිඩ්‍රේට් ප්‍රමාණ පාලක කුකීස් වලට සාපේක්ෂව අඩු අගයක් දක්නට ලැබුණි. එමෙන්ම, තෝරාගත් කුකීස් වගර්යෙහි ජල ක්‍රියාකාරීත්වය සහ සම්පූර්ණ ආහාරමය තන්තු අන්තගර්තය (12.6%) පාලක කුකීස් (2.0%) වලට වඩා ඉහළ අගයන් පෙන්වනු ලබයි.

නිගමනය වශයෙන්, මෙම තිරිඟු පිටි, ප්‍රමාණවත් ලෙස සිලියම් හස්ක්, කොහිල සහ කොල්ලු පිටි මගින් ප්‍රතිස්ථාපනය කිරීම, කුකීස්වල ආහාරමය තන්තු අන්තගර්තය හා පෝෂණ ගුණාංගය සුවිශේෂී ලෙස වැඩි කරයි. එමගින් ඒවායේ භෞතික - රසායනික හෝ සංවේදී ගුණාංග වලට අහිතකර බලපෑමක් නොමැතිව, බේකරි නිෂ්පාදන සංවධර්නයට ඉතා සුදුසු හැකියාවක් පෙන්වයි.

This is a non-technical summary of the project report titled "Development of fiber enriched cookies incorporating psyllium husk and selected underutilized flours and evaluation of physicochemical and sensory properties" supervised by Dr. E.R.J. Samarakoon*, Department of Food Science and Technology, Faculty of Agriculture, University of Peradeniya.
*rasanjalis@agri.pdn.ac.lk

අඩු පිරිවැයකින් බුරුළු ප්‍රදාහයට සාර්ථක දේශීය අත්බෙහෙතක්



දිලුනි විතානගේ

කිරි කර්මාන්තය ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට වැදගත් කෘෂි අංශයක් ලෙස සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනියි. මෙරට ජාතික කිරි සැපයුමෙන් 95%ක ප්‍රමාණයක් සුළු සහ මධ්‍ය පරිමාණ කිරි ගොවිපළවල් වලින් සැපයෙන බව 2023 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශය නිකුත් කරන ලද දත්ත වාර්තා හෙළි කරයි. එලෙස රටේ ආර්ථිකයට සවියක් වන මෙරට කිරි නිෂ්පාදනයට සහ ගොවිජන ආර්ථිකයට දැඩිව බලපෑම් කරන කිරි ගවයින් අතර සුලබ රෝගය බුරුළු ප්‍රදාහය (මැස්ටයිටිස්) වේ. බොහෝවිට මෙම රෝගය වැළැක්වීම සඳහා භාවිත කරන විදේශීය එන්නත් සහ ඖෂධ වල වෙළඳපොළ අගය ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ කිරි ගව හිමියන්ට දැරිය නොහැකි ඉහළ මිල ගණන් යටතේ පවතියි.

මැස්ටයිටිස් යනු ගවයින්ගේ ක්ෂීර ග්‍රන්ථියෙහි (බුරුල්ලෙහි) කුටීර වශයෙන් බලපෑම් ඇතිවන ප්‍රදාහක ආසාදනයකි. මෙය බොහෝ විට බැක්ටීරියා ආසාදනයක් ඇතිවී, කිරි වල ගුණාත්මකභාවය සහ නිෂ්පාදන ප්‍රමාණය දැඩි ලෙස අඩුකරයි. එමෙන්ම මැස්ටයිටිස් වැළැක්වීම සහ ප්‍රතිකාර කිරීම සඳහා ප්‍රතිජීවක ඖෂධ විශාල වශයෙන් භාවිත කිරීම නිසා කිරි තුළ ඖෂධ අවශේෂ පැවතීම ඉතා ඉහළය. මෙවැනි කිරි පරිභෝජනය කිරීම මගින් පාරිභෝගිකයන් අතර ප්‍රතිජීවක ප්‍රතිරෝධය වර්ධනය අතර, එය මානව සෞඛ්‍යයට දැඩි හානි පැමිණවීමේ හැකියාව ඇත.





ශ්‍රී ලංකාවේ කිරි ගව පාලකයින් බොහෝදෙනා කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපළ පවත්වාගෙන යයි. මැස්ටයිටිස් වැළැක්වීමේ එන්නත් සහ ඖෂධ වල මිල, ගොවීන්ගේ අඩු ආදායම සහ සීමිත සම්පත් නිසා බොහොමයක් කිරි ගොවිපළ තුළ ප්‍රායෝගිකව අසාර්ථකත්වයට පත්ව ඇත. එබැවින් අඩු පිරිවැය, පරිසර හිතකාමී සහ මෙරට කුඩා සහ මධ්‍ය පරිමාණ ගොවිපළ වල දැකිය හැකි මැස්ටයිටිස් වැළැක්වීමේ උපාය මාර්ග සංවර්ධනය කිරීම ජාතික මට්ටමින් වැදගත් අවශ්‍යතාවක් ලෙස සැලකෙයි.

කිරි ගවයින්ගේ මැස්ටයිටිස් රෝගයට බලපාන අවදානම් සාධක පිළිබඳ මා විසින් සිදුකරන ලද අධ්‍යයනය අවසානයේ දී අඩු පිරිවැය, ලාභදායී මෙන්ම ප්‍රතිජීවක වලින් තොර මැස්ටයිටිස් සඳහා සාර්ථකව පිළිතුරු දක්වන බුරුළු බාහිර ආලේපනයක් යොදා ගැනිණි. එය ප්‍රදේශ දෙකක කිරි ගවයින් දෙදෙනෙකුගේ බුරුළු ප්‍රදාහයේ සායනික තත්ත්වයේ පවතින බුරුළු පුඩු තුනක් ඇසුරින් කරන ලද පරීක්ෂාවේදී දින තුනක ආලේපනයකින් අනතුරුව ලබාගත් කිරි සාම්පල සියල්ලෙහිම ප්‍රතිඵල මැස්ටයිටිස් වලින් තොර ඒවා බවට යොදා ගත් සියලු පරීක්ෂා දර්ශක තුළින් සනාථ විය. එලෙසම ප්‍රතිකාරයෙන් දින 21කින් අනතුරුව නැවත එම බුරුළු පුඩු කිරි සාම්පල පරීක්ෂණයේදී එම සාම්පල මැස්ටයිටිස් රෝගයෙන් තොර බවට මා විසින් සිදුකල සියලු පරීක්ෂණ දර්ශකයන් තුළ දී සනාථ විය.



මෙම බාහිර ආලේපනය බැල තණ පැළැටිය, කෝමාරිකා මදය, අමුකහ, ඇඹුල් දොඩම් යුෂ, මූලික අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් සෑදුණු බාහිර ආලේපනයක් ලෙස සාදන ලද අතර එය මැස්ටයිටිස් වැළඳුණු සත්වයෙකුගේ රෝගී තත්ත්වයට දින තුනකදී සාර්ථක ප්‍රතිඵල ලබාදුනි. මෙම ප්‍රතිකාරය ලාභදායී, තිරසාර මෙන්ම කුඩා සහ මධ්‍ය පරිමාණ කිරි ගොවිපළ හිමියන්ට ඉතා සැනසුම් දායක පුවතක් වනු ඇත.



ගුණාත්මයෙන් ඉහළ හා වේගවත් කාබනික පොහොර නිෂ්පාදනයට ඵලදායී ක්ෂුද්‍රජීවී මිශ්‍රණයක්...!!!



රශ්මින්ද කැලුම් වාසල බණ්ඩාර

අතීතයේ පැවැති පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය වතර්මානය වන විට වෙනස් වී ඇත. ජනගහන වර්ධනයත් සමඟ ආහාර අවශ්‍යතා ඉහළ යෑම මීට මූලික හේතුවයි. මීට පිළියමක් වශයෙන් වතර්මානයේ ප්‍රචලිත වී ඇති නව කෘෂි තාක්ෂණික ශිල්පීය ක්‍රම මඟින් ඉක්මන් ඵලදාවක් ලබා ගත හැකි වුවත්, වගාබිම්වල අපද්‍රව්‍ය එක්රැස් වීම ද ඒ හා සමගම සිදු වේ. එම ශාක අවශේෂ ඉක්මනින් දිරාපත් නොවීම නිසා ගොවීන් ඒවා පිළිස්සීම, වළ දැමීම හෝ වගාබිම්වල ගොඩගැසීම සිදු කරයි. එය පරිසර දූෂණය හා පළිබෝධ ව්‍යාප්තිය වේගවත් කිරීමට මඟ පාදයි. එයට පිළියමක් ලෙස තිරසාර හා අඩු වියදම් ක්‍රමයක් වන ඵලදායී ක්ෂුද්‍රජීවී මිශ්‍රණයක් (*microbial inoculant*) භාවිතයෙන් කොම්පෝස්ට් පොහොර නිපදවීම හඳුන්වා දිය හැක. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයේදී සංකීර්ණ ජෛවීය කාබනික ද්‍රව්‍ය ක්ෂුද්‍රජීවීන් මඟින් සරල කාබනික ද්‍රව්‍ය බවට පත් කරයි.

ශ්‍රී ලංකාවේ දැනට වේගයෙන් වර්ධනය වන මහා පරිමාණ වාණිජමය වගාවක් ලෙස ස්ට්‍රෝබෙරි වගාව හඳුන්වා දිය හැක. ඉතා මිහිරි පළතුරක් වුවත්, අස්වනු නෙළීමෙන් පසු ඉතිරි වන ශාක පත්‍ර, දඬු ආදිය සෙලියුලෝස්, ලිග්නින් (32.82%) වැනි සංකීර්ණ කාබනික සංයෝග හා ඉහළ කාබන්:නයිට්‍රජන් අනුපාතයකින් (36.37) අනූන නිසා සාමාන්‍ය ක්‍රමයට කොම්පෝස්ට් නිපදවීමට විශාල කාලයක් ගත වේ.



දිරාපත් නොවූ ස්ට්‍රෝබෙරි දඬු කැබලි

දිරාපත්වෙමින් පවතින ස්ට්‍රෝබෙරි ශාක අපද්‍රව්‍ය

එබැවින් මෙම ශාක අවශේෂ පරිසරයට මෙන්ම ගොවියාට ද ගැටලුවක් වීම වළකා, සම්පතක් බවට පත් කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

එහිදී ශාක අවශේෂ බිඳවැටීම වේගවත් කර, ඉහළ ගුණාත්මකභාවයකින් යුතු පරිසර හිතකාමී කොම්පෝස්ට් පොහොරක් බවට පරිවර්තනය කර ගැනීම සඳහා ඵලදායී ක්ෂුද්‍රජීවී මිශ්‍රණයක් නිර්මාණය කරන ලදී.

ඒ සඳහා මූලික ක්ෂුද්‍රජීවී ප්‍රභවයන් ලෙස ගොම, දිරාපත් වන ස්ට්‍රෝබෙරි ශාක අපද්‍රව්‍ය හා එළවළු ශාක අපද්‍රව්‍ය භාවිතයෙන් ක්ෂුද්‍රජීවී මිශ්‍රණ වෙන් වෙන්ව නිපදවන ලදී. එම ක්ෂුද්‍රජීවී මිශ්‍රණවල ක්‍රියාකාරීත්වය විද්‍යාගාර තත්ත්ව යටතේ පරීක්ෂා කරන ලදී. විද්‍යාගාර ප්‍රතිඵල අනුව, ස්ට්‍රෝබෙරි ශාක අපද්‍රව්‍ය බිඳ හෙළීම කෙරෙහි ඉහළම ක්‍රියාකාරීත්වයක් පෙන්වූ ඵලදායී ක්ෂුද්‍රජීවී මිශ්‍රණය, බණ්ඩාරවෙල වාණිජ ස්ට්‍රෝබෙරි ගොවිපොළක ක්ෂේත්‍ර පරීක්ෂණයකට ලක් කරන ලදී. එය සිදු කරන ලද්දේ සාමාන්‍ය පරිසර තත්ත්ව යටතේ වූ කොම්පෝස්ට් බඳුන් තුළය. එහිදී නව ඵලදායී ක්ෂුද්‍රජීවී මිශ්‍රණයේ ක්‍රියාකාරීත්වය, ගොවිපොළෙහි සාමාන්‍ය කොම්පෝස්ට් නිපදවන ක්‍රියාවලිය සමඟ සසඳන ලදී.



ක්ෂේත්‍ර පරීක්ෂණ ඇටවුම



ස්ට්‍රෝබෙරි ශාක අපද්‍රව්‍ය

නිරීක්ෂිත ප්‍රතිඵල අනුව විද්‍යාගාර තත්ත්ව යටතේ නිපදවූ ඵලදායී ක්ෂුද්‍රජීවී මිශ්‍රණය, ස්ට්‍රෝබෙරි ශාක අපද්‍රව්‍ය බිඳ හෙළීමේදී සැලකිය යුතු ඉහළ ක්‍රියාකාරීත්වයක් පෙන්වමින් තද දුඹුරු/ කළු වර්ණයෙන් යුත් කොම්පෝස්ට් පොහොරක් නිපදවන ලදී. එම නිෂ්පාදන ක්‍රියාවලියේදී ශාක වර්ධනයට අත්‍යවශ්‍ය නයිට්‍රජන් වැනි පෝෂක හානි වීම සාපේක්ෂව ඉතා අඩු බව නිරීක්ෂණය විය.

එබැවින් මෙම අධ්‍යයනයෙන් පෙන්නුම් කරනු ලබන්නේ නව ක්ෂුද්‍රජීවී මිශ්‍රණය භාවිතයෙන් ස්ට්‍රෝබෙරි ශාක අවශේෂ ඉතා කෙටි කලෙකින්, පෝෂණයෙන් ඉහළ කොම්පෝස්ට් පොහොරක් බවට පරිවර්තනය කළ හැකි බවයි. එම කොම්පෝස්ට් පොහොර ස්ට්‍රෝබෙරි මෙන්ම තවත් බෝග වගර් වගා කිරීමේදී පොහොරක් ලෙස භාවිතා කළ හැකි බැවින්, එය අපද්‍රව්‍ය තිරසාර ලෙස කළමනාකරණයට මෙන්ම ගොවීන්ට අඩු වියදම් පරිසර හිතකාමී පිළිතුරකි.

එබැවින්, මෙම ක්ෂුද්‍රජීවී අතලොස්සට, ස්ට්‍රෝබෙරි ශාක අපද්‍රව්‍ය සැබැවින්ම සම්පතක් බවට පත් කළ හැකි නොවේද...?

This is a non-technical summary of the project report titled "Development of a microbial inoculant for composting of strawberry crop residues" supervised by Prof. R.S. Dharmakeerthi, Department of Soil Science, Faculty of Agriculture, University of Peradeniya. dharmakeerthirs@agri.pdn.ac.lk

වැව් මාළු පරිභෝජනයට පෙර සිතා බලන්නට යමක්.....!



සහන් මාලක සෙනරත්

පර්යේෂණ ක්ෂේත්‍රය තුළ වඩාත් අවධානයට ලක්වූ ක්ෂුද්‍ර ප්ලාස්ටික් දූෂකය යළිත් කරලියට පැමිණ ඇත්තේ මෑත කාලීන අධ්‍යයනයන් මගින් තහවුරු කරන ලද භයානක අනාවරණයන් කීපයක් හේතුවෙනි. ඒ ක්ෂුද්‍ර ප්ලාස්ටික් මානව සෞඛ්‍යයට තර්ජන එල්ල කරමින් මොළය, වැදෑමහ (කලල බන්ධය), අන්ත්‍ර, මවුකිරි, ශුක්‍ර තරලය හා රුධිරය තුළ පවතින බවයි. මෙලෙස ක්ෂුද්‍ර ප්ලාස්ටික් ශරීරගත වීම විවිධ අයුරින් සිදු විය හැකි නමුත් පර්යේෂකයන් පෙන්වා දෙන්නේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් ශරීරගත වූ මත්ස්‍යයන් පරිභෝජනය මීට ප්‍රබල හේතුවක් විය හැකි බවයි. ඒ ජලජ පරිසර පද්ධතීන් තුළදී මත්ස්‍යයන් නිරන්තරයෙන්ම ක්ෂුද්‍ර ප්ලාස්ටික්වලට නිරාවරණය වන නිසාවෙනි. අවිධිමත් අයුරින් ප්ලාස්ටික් කසළ කළමනාකරණය මෙම ක්‍රියාවලිය උත්සන්න කිරීමට හේතු වී තිබේ. මේ වන විට ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍ර ප්ලාස්ටික් සම්බන්ධයෙන් සැලකිය යුතු තරම් අවධානයක් යොමු වී තිබුණත් මිරිදිය ධීවර කර්මාන්තය ආශ්‍රිතව ප්‍රමාණවත් තරම් අධ්‍යයනයන් මේ දක්වා සිදු වී නොමැත. වැව් මාළුවලට ඉමහත් ජනප්‍රියත්වයක් උසුලන අනුරාධපුර දිස්ත්‍රික්කය මේ ගැටලුව සම්බන්ධයෙන් අධ්‍යයනය සඳහා වඩාත් සුදුසු වන්නේ සංචාරක කර්මාන්තය සහ නාගරීකරණය මේ වන විටත් ප්‍රදේශයේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය යහමින් සිදුවන ජලාශ කීපයක්ම අපවිත්‍ර බවට පත් කොට ඇති නිසාවෙනි.

අධ්‍යයන ක්‍රමවේදය

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රධාන වශයෙන් සිදු වන බසවක්කුලම, නුවර වැව, සහ මහකනදරාව ජලාශ අධ්‍යයනය සඳහා තෝරා ගත් අතර නාගරීකරණය, සංචාරක කර්මාන්තය සහ ජලාශ ආශ්‍රිත විවිධ මානව ක්‍රියාකාරකම් පදනම් කර ගනිමින් වර්ගීකරණය කිරීම සිදු විය. ඒ අනුව බසවක්කුලම නාගරික ජලාශයක් ලෙස ද නුවර වැව සහ මහකනදරාව පිළිවෙළින් අර්ධ-නාගරික සහ ග්‍රාමීය ජලාශ ලෙස සලකනු ලැබූ අතර එක් එක් ජලාශය නියෝජනය වන පරිදි ඉහළ පාරිභෝගික ඉල්ලුමක් පවතින තෙප්පිලි (Nile tilapia) මත්ස්‍ය සාම්පල ලබාගන්නා ලදී. අනතුරුව භාෂ්මික ජීර්ණය (Alkaline digestion) යොදා ගනිමින් මත්ස්‍යයන්ගෙන් ක්ෂුද්‍ර ප්ලාස්ටික් වෙන්කර ගැනුණු අතර හඳුනාගත් ක්ෂුද්‍ර ප්ලාස්ටික් ඒවායේ ප්‍රමාණය, හැඩය, වර්ණය සහ බහු අවයවික වර්ගය (Polymer type) අනුව වැඩිදුරටත් අධ්‍යයනය කිරීම සිදු විය.

අධ්‍යයනයේ ප්‍රතිඵල

ප්‍රතිඵලවලින් තහවුරු වූයේ අධ්‍යයනයට ලක් වූ ජලාශ ත්‍රිත්වයේම මත්ස්‍යයන් තුළ ක්ෂුද්‍ර ප්ලාස්ටික් අන්තර්ගත වූ බවයි. හඳුනාගත් අංශු අතරින් බහුතරයක් $250\ \mu\text{m}$ ට වඩා ඉතාමත් කුඩා අංශු වූ අතර තන්තුමය ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු බහුල වශයෙන් හඳුනා ගන්නා ලදී. එක් එක් ජලාශය පාදකව සිදුකරන ලද විශ්ලේෂණය මගින් අනාවරණය වූයේ බසවක්කුලම සහ නුවර වැව ජලාශවලින් ලබාගන්නා ලද මත්ස්‍ය සාම්පල මහකනදරාව ජලාශයට සාපේක්ෂව ඉහළ ක්ෂුද්‍ර ප්ලාස්ටික් බහුලත්වයක් (Microplastics abundance) දක්වන බවයි. සිදු කරන ලද ජලාශ වර්ගීකරණය මත පදනම්ව නාගරික සහ අර්ධ-නාගරික ජලාශවල තෙප්පිලි මත්ස්‍යයන් ඉහළ ක්ෂුද්‍ර ප්ලාස්ටික් බහුලත්වයක් දැක්වූයේ නාගරීකරණය, සංචාරක කර්මාන්තය සහ ජලාශාශ්‍රිත විවිධ මානව ක්‍රියාකාරකම් මේ සඳහා විශාල බලපෑමක් ඇති කර තිබෙන බව පැහැදිලි කරමිනි. මහකනදරාව ජලාශය සාපේක්ෂව අවම ක්ෂුද්‍ර ප්ලාස්ටික් බහුලත්වයක් දැක්වූයේය.

විශාල වශයෙන් හඳුනාගන්නා ලද තන්තුමය ක්ෂුද්‍ර ප්ලාස්ටික් සම්භවය සඳහා ප්‍රධාන හේතූන් ලෙස ජලාශාශ්‍රිත මත්ස්‍ය කර්මාන්තයේදී භාවිතා වන දැල් ආම්පන්න, රෙදිපිළි සේදීම සහ ස්නාන කටයුතු හඳුනාගත හැකිය. බහු අවයවික වර්ග විශ්ලේෂණයේදී අනාවරණය වූ පරිදි පොලිතීන්වලින් සම්භවය වූ ක්ෂුද්‍ර ප්ලාස්ටික් වැඩි වශයෙන් දක්නට ලැබීම වර්ණ විශ්ලේෂණයෙන් ලද ප්‍රතිඵලවලින් තහවුරු විය. පොලිතීන් (Polyethylene) වලට පසුව බහුලව හඳුනා ගන්නා ලද ස්ටයිරොෆෝම් (Polystyrene) පාදක ක්ෂුද්‍ර ප්ලාස්ටික් සඳහා ප්‍රධානතම හේතුවක් ලෙස ධීවර කර්මාන්තයේදී භාවිතා වන දැල් ආම්පන්න සහ බහාලුම් හඳුනාගත හැකිය.

නිගමනය

අධ්‍යයනය තුළින් අනාවරණය කරගත් කරුණු තුළින් අවධානයට ලක් විය යුතු තවත් විශේෂ කරුණක් වන්නේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් විවිධාකාර විෂ රසායන, බැර ලෝහ සහ ව්‍යාධිජනක ක්ෂුද්‍ර ජීවීන් සඳහා උපස්ථරයක් ලෙස කටයුතු කරන බවයි. ශරීරගත වීමෙන් අනතුරුව උක්ත අනතුරුකාරක මත්ස්‍ය ශරීරය තුළ ජෛව සමුච්චයට (Bioaccumulation) ලක්වන අතර එම මත්ස්‍යයන් පරිභෝජනය හේතුවෙන් තවදුරටත් ඒවා මිනිස් සිරුරේ ජෛව විශාලනය (Biomagnification) වීමේ අවදානමක් පවතී. මේ හේතුවෙන් අනුරාධපුර ප්‍රදේශයේ වැව් මාළු පරිභෝජනයට ඉමහත් ප්‍රියතාවයක් දක්වන පිරිස් ක්ෂුද්‍ර ප්ලාස්ටික් ශරීරගත වීමේ දැඩි අවදානමකට ලක්ව තිබේ.

මේ අනුව වත්මන් අධ්‍යයනයෙන් අනාවරණය වූ කරුණු හමුවේ තෙප්පිලි මත්ස්‍ය අනුභවය නතර කිරීම නොව මත්ස්‍යයන් ජීවත්වන වාසස්ථානවලට අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම් සහ අපරීක්ෂාකාරී ආම්පන්න භාවිතයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම ඉතා වැදගත් වේ. ඒ අනුව මිරිදිය ධීවර කර්මාන්තය මෙන්ම මිරිදිය මත්ස්‍ය පාරිභෝගිකයන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා මේ සම්බන්ධයෙන් සමස්ත ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුව තිබේ.

வெள்ளத்திலிருந்து விவசாய மீட்புநிலைமைக்கு: மட்டக்களப்பில் காலநிலைக்கு சாமர்த்தியமான விவசாயத்தினால் (Climate-Smart Agriculture) அதிகரித்த விளைச்சல் மற்றும் வருமானம்



தேனிஷா பத்மநாதன்

உலகளாவிய சவால்
உலகம் முழுவதும் காலநிலை மாற்றம் விவசாயத்தை அச்சுறுத்தி வருகின்றது. சீரற்ற மழைப்பொழிவுகளால் சில இடங்களில் கடும் வெள்ளம் மற்ற இடங்களில் நீண்ட வறட்சி நிலவுகின்றது. இதனால் விவசாயிகளின் விளைச்சல் மற்றும் வருமானம் குறைவடைந்து வருகின்றது.

உள்ளூர் சவால்
கிழக்கு மாகாணத்தின் மட்டக்களப்பு மாவட்டம் வெள்ளத்தால் பாதிக்கப்படும் பகுதி ஆகும். வருடா வருடம் மீண்டும் மீண்டும் வரும் வெள்ளத்தால், பல விவசாய நிலங்கள் நீரில் மூழ்கி விளைச்சலும், வருமானமும் பெரிதும் குறைவடைந்து வாழ்வாதார சிக்கல்களுக்கு வழிவகுக்கின்றது.

நம்பிக்கையின் வெளிச்சம்- Climate-Smart Agriculture
இந்த நிலையிலே, காலநிலைக்கு சாமர்த்தியமான விவசாயம் (Climate-Smart Agriculture) விவசாயிகளுக்கு நம்பிக்கையின் வெளிச்சமாக மாறியுள்ளது. இது வெறும் விவசாயம் மட்டும் அல்ல; சிறுவிவசாயிகளின் வாழ்வாதாரத்தின் ஆதாரத்தூண். சொட்டு நீர்ப்பாசனம், பயிர்ப்பல்வகைமைப்படுத்தல், கூட்டெரு தயாரிப்பு, இயந்திரமயமாக்கல், climate smart விதை உற்பத்தி போன்ற காலநிலைக்கு சாமர்த்தியமான பயிற்சிகள் வெள்ளம் மற்றும் வறட்சியை எதிர்கொண்டு உற்பத்தியை நிலைத்ததாக்குகின்றன.



ஆய்வின் நோக்கம்
மட்டக்களப்பு மாவட்டத்தின் காலநிலைக்கு சாமர்த்தியமான விவசாயத்தை பயன்படுத்தும் விவசாயிகளின் விளைச்சலும் வருமானமும் எவ்வாறு மாற்றமடைகின்றது என்பதை ஆராய்வது தேவைப்பாடாகின்றது.

ஆய்வு முறை
வெள்ளத்தால் பாதிக்கப்பட்ட பகுதியிலுள்ள விவசாயிகளிடமிருந்து தரவுகள் சேகரிக்கப்பட்டன.

ஆய்வின் முடிவுகள்
காலநிலைக்கு சாமர்த்தியமான விவசாய முறையைப் பின்பற்றிய விவசாயிகளின் விளைச்சல் சுமார் 13 சதவீதம் வரை உயர்ந்துள்ளது மட்டுமன்றி வருமானமும் ஒப்பீட்டளவில் சுமார் 37 சதவீதம் வரை அதிகரித்துள்ளது. விவசாயிகளின் கல்விநிலை, அனுபவம், பாலினம், வயது, மொத்த விவசாயநிலப்பரப்பு, தேவைப்படும் கூலியாட்களின் அளவு மற்றும் குழு உறுப்பினர் நிலை ஆகியவை பயிற்சிகளின் எண்ணிக்கையைத் தீர்மானிப்பதிலும், மேலதிகமாக காலநிலைக்கு சாமர்த்தியமான விவசாயப்பயிற்சிகளை தேர்ந்தெடுப்பதை முடிவெடுப்பதிலும் முக்கிய பங்கு வகித்துள்ளன.

சமூகப்பயன்பாடு
காலநிலைக்கு சாமர்த்தியமான விவசாயப்பயிற்சிகள் வெள்ளத்தால் பாதிக்கப்பட்ட விவசாயிகளின் வாழ்வாதாரத்தை மீட்டெடுப்பதிலும், நீடித்த விவசாய வளர்ச்சியை உறுதிப்படுத்துவதிலும் முக்கிய பங்கு வகிப்பதை வெளிப்படுத்துகின்றன. இது அரசாங்கமும் கொள்கை வகுப்பாளர்களும் தொழினுட்ப பயிற்சி, கடன் வசதிகள், மற்றும் விழிப்புணர்வு நிகழ்ச்சிகள் மூலம் இதை விரிவுபடுத்த வேண்டும்.

இது வெறும் ஆய்வு அல்ல மாறாக வெள்ளத்திற்குப் பிறகு மீண்டும் மலரும் ஒரு நம்பிக்கையின் கதை.

This is a non-technical summary of the project report titled "Yield and Income Impacts of Climate-Smart Agriculture Adoption among Smallholder Farmers in Flood-Prone Areas: A Case Study from Batticaloa District, Sri Lanka" supervised by Dr. S.N. Dissanayake.*, Department of Agricultural Economics and Business Management, Faculty of Agriculture, University of Peradeniya.

கௌடா(Gouda) சீஸ் தயாரிப்பில் விலங்கு புரதமான ரென்னெட் நொதியத்திற்கு மாறீட்டாக நோனி (*Morinda citrifolia*) தாவர நொதியத்தை பயன்படுத்தலாமா?



ஜெகதீஸ்வரன் டல்ஸ் யசோன்


அறிமுகம்:
இன்றயை நவீன யுகத்திலே பாலை நீண்ட காலம் வினைத்திறனாக பயன்படுத்தவும் அதன் மதிப்பை உயர்த்தவும் சிறந்த பால் சார் உட்பத்தி பொருளாக கௌடா சீஸ் (Gouda cheese) காணப்படுகின்றது. கௌடா சீஸ் உற்பத்தியானது பிரதானமாக விலங்குகளில் இருந்து பெறப்படும் ரென்னெட் (Rennet) நொதியத்தின் தொழிற்பாட்டினால் பாலை நன்கு நொதிக்கச் செய்து உற்பத்தி செய்யப்படுகின்றது.


இன்று எல்லோராலும் பேசு பொருளாக (“Vegan”) முழுச்-சைவ உணவுகள் காணப்படுகின்றது. அதனால் மக்கள் மத்தியில் முழுச்-சைவ உணவுகளின் தேவை அதிகரித்துள்ளமையால் தாவரம் சார்ந்த நொதியத்தின் தேவை அதிகரித்துள்ளது. அது மட்டுமல்லாது சமூக மற்றும் மதம் சார்ந்த கட்டுப்பாடுகள், ஹலால் (Halal) கோஷர் (Kosher) உணவு முறைகள் அதிகரித்து வருவதனாலும் விலங்கு சார்பற்ற நொதியத்தின் தேடல் வணிக ரீதியாகவும் வேகமாக வளர்ந்து வருகின்றது. இதனை நிவர்த்தி செய்யும் விதமாக எனது ஆய்வானது நோனி (Noni) பழத்தின் நொதிய தொழிட்பாடடை ஆய்வு செய்து அதனை ரென்னெட் நொதியத்திற்கு மாற்றீடாக பயன்படுத்தி கௌடா சீஸ் உற்பத்தியானது வெற்றியளித்துள்ளது. நோனி நொதியத்தை பயன்படுத்தி கௌடா சீஸ் உற்பத்தியில் எந்த விதமான ஆய்வுகளும் இதுவரை மேட்கொள்ளப்படவில்லை இதுவே முதல் தடவையாகும்.




செய்முறை:
நோனி நொதிய பிரித்தெடுப்பு நோனி பழமானது வெட்டப்பட்டு அரைக்கப்பட்டு சென்ட்ரிபியூஜ் (Centrifuge) ६००० × g செய்யப்பட்டது. வழமையான கௌடா சீஸ் உற்பத்திக்கு பதிலாக நோனி பழ நொதியமானது வெவேறான செறிவுகளில் பயன்படுத்தப்பட்டு பரிசோதிக்கப்பட்ட்து. கட்டுப்பாட்டுபரிசோதனையாகவும் **(T1) ,T2-(0.5%) T3-(1%), T4-(2%)** செறிவுகளில் நோனி நொதியம் பயன்படுத்தப்பட்ட்து.

ஆராய்ச்சி முடிவுகள்:
Morinda citrifolia (நோனி) நொதியச் சாறு சேர்க்கை கௌடா சீஸின் இயற்பெயர்ச்சியியல் மற்றும் இழையமைப்பு பண்புகளில் குறிப்பிடத்தக்க தாக்கத்தை ஏற்படுத்தியது. 1% நோனி சாறு (T3) சேர்க்கையில் புரதச் சத்து, உறை வலிமை, மற்றும் வடிவத் திடத்தன்மை மேம்பட்டன, ஆனால் 2% சேர்க்கையில் அதிகப்படியான புரதச் சிதைவால் மென்மை மற்றும் நீர்ச் சிதறல் அதிகரித்தது. உலர் பொருள், ஆற்றல், மற்றும் நிற மதிப்பில் பெரிய வேறுபாடு இல்லை சீஸின் இயல்பான நிறமும் தரமும் நிலைத்திருந்தன. முடிவாக, 1% நோனி நொதியம் பாலை உறையச் செய்ய சிறந்த நொதியச் செயல்திறன், சீரான வடிவம், அமைப்பு, மற்றும் உணர்வியல் தரம் கொண்ட கௌடா சீஸை உருவாக்குகிறது. எனவே, *M. citrifolia* நொதியங்கள் விலங்கு ரென்னெட்டிற்கு மாற்றாக சூழலுக்கு ஏற்ற, பொருளாதார ரீதியாக பயனுள்ள மாற்று உறையூட்டியாக கருதப்படலாம்







நொதிக்கப்பட்ட ஒடியல் மாவைப் பயன்படுத்தி யோக்கட்டில் புதிய திருப்பு முனையை உருவாக்குதல்



பிரதீபன் பிரசாந்தினி

யோக்கட் பற்றிய அறிமுகம்

இன்றைய அதிகரித்து வரும் உடனடி உணவுகளால் எம்மிடைய ஆரோக்கியத்தின் அவசியம் என்பது மிகவும் அத்தியாவசியமான ஒன்றாகிவிட்டது. இருப்பினும் குறிப்பிட்ட சில உணவுகளின் நிமித்தமே ஊட்டச்சத்துக்களை நாம் உடலினில் எடுத்துக் கொள்கின்றோம். அத்தகைய உணவுகளில் யோக்கட் என்பது தனக்கென ஒரு இடத்தை நிலைகொள்ளச் செய்தமையைப் பாமரர் முதல் படித்தவர் வரை யாராலும் மறுத்தவிட முடியாது. ஏனெனில் யோக்கட் ஆனது அதிக ஊட்டச்சத்துக்கள் நிறைந்த ஒரு நிறையுணவாகும்.

பிரச்சனைகள்

வழமையாக யோக்கட்டில் பயன்படுத்தும் பிரிபயோட்டு கலவைகளைப் பிற நாடுகளிலிருந்து இறக்குமதி செய்வதற்குத் தேவையான கொள்முதல்ச் செலவானது மிகவும் அதிகமாக உள்ளது (உதாரணம்:இனுலின்பிரக்ரோஒலிகோசக்கரைட்டுமற்றும் கலக்ரோஒலிகோசக்கரைட்டு)

இவ்பிரிபயோட்டுக்கள்யோக்கட் செயன்முறையின் போதும் சேமித்து வைக்கும் போதும் உறுதித்தன்மையை இழந்து யோக்கட்டின் பயன்பாட்டுக்குக் காலத்தை குறைவடையச் செய்கின்றன.இதுமட்டுமன்று நன்மை செய்யும் பக்ரீரியாக்களின் வளர்ச்சியிலும் பாதிப்பை ஏற்படுத்துகின்றன. இதுமட்டுமன்றி இவற்றில் சில யோக்கட்டின் சுவை மற்றும் அமைப்பு என்பவற்றை மாற்றுகின்றன.உதாரணமாக இனுலினானது யோக்கட்டைத்தடிப்பாகமாற்றுவதுடன் மென்மைத்தன்மையையும் குறைக்கின்றது. மற்றும் பிரக்ரோஒலிகோசக்கரைட்டானது யோக்கட்டுக்கு விரும்பத்தகாத சுவையை வழங்குகின்றது. இத்தகைய பிரச்சனைகள் யோக்கட்டில் அதிக ஊட்டச்சத்துக்கள் இருந்தாலும்நுகர்வோருக்கானகேள்வியைகுறைவடையச் செய்கின்றன.

தீர்வுகள்

இந்த ஆராய்ச்சியின் நோக்கமானது யாதெனில் கலக்கிய செயற்பாட்டு வினைத்திறன் கூடிய யோக்கட்டை நொதித்த ஒடியல் மாவைப் பயன்படுத்தி உருவாக்குவதாகும்.ஒடியல் மாவானது இலங்கை நாட்டின் மட்டுப்படுத்தப்பட்ட பயன்பாட்டில் உள்ள ஊட்டச்சத்து கலவையாகும். இவ் ஒடியல் மாவானது நார்ச்சத்து காபோவைதரேற்றை எதிர்க்கும்திறன் ஒட்சியேற்றும் தன்மையை எதிர்க்கும் திறன் அதிசிறந்த நன்மை தரும் பக்ரீரியாக்களின் வளர்ப்பு ஊடகம் ரானின் சப்போனின் ஆகிய அதிக ஊட்டச்சத்துக்களைக் கொண்ட உலகுக்கு மறைக்கப்பட்ட ஆரோக்கியமான சத்துமா என்றால் மிகையாகாது.



இதற்கு மேலாக நீண்ட காலம் நிலைத்திருக்கும் திறன், இயற்கையான சுவையூட்டி, உயர்ந்த ஊட்டச்சத்துத் தரம், மென்மைத்தன்மை என்பவற்றை இனுலின் மற்றும் பிரக்ரோஒலிகோசக்கரைட்டை விட பலமடங்கு கொண்ட ஆரோக்கிய உணவே ஒடியல்மா ஆகும். குடல் ஆரோக்கியம், நோய் எதிர்க்கும் திறன், நீரிழிவுத் தடுப்பு போன்ற பல நற் குணங்களை கொண்டது.

செலவுகுறைவு,பயன்அதிகம் இதோ எங்களிடம்உள்ளது ஒடியல்மா.....

இதில் ஆரோக்கியத்திற்கு நன்மை பயக்கும் பல்வேறு வகையான அத்தியாவசியமான விற்றமின்கள் மற்றும் கனியுப்புக்கள் உள்ளன. இது இயற்கையாகவே தயமின் (B1) நியாசின்(B3) மற்றும் பிரிடொக்சின் (B6) போன்ற B விற்றமின்களையும் விற்றமின் C மற்றும் β-கரோட்டின் என்பவற்றை வழங்குகின்றது. கனியுப்புக்களை எடுத்து நோக்கினால் கல்சியம், பொஸ்பரசு இரும்பு மக்னீசியம் நாகம் பொட்டாசியம் சோடியம் மற்றும் செம்பு ஆகியவற்றைக் கொண்ட கலவையாகும். இவை எலும்பு ஆரோக்கியம் நொதித்தல்ச் செயற்பாடு மற்றும் ஒட்டுமொத்த வளர்சிதை மாற்ற செயல்முறைகளில் முக்கிய பங்கு வகிக்கின்றன. மாவானது நொதிக்கப்படும்போது பைட்டேட்டுகள் போன்ற ஊட்டச்சத்து எதிர்ப்புக் காரணிகளை உடைப்பதன் மூலம் ஊட்டச்சத்துக்களின் செயற்பாட்டுத் தன்மையை மேம்படுத்துகின்றது.எனவே நொதித்த மாவானது மேம்பட்ட ஊட்டச்சத்து தரத்துடன் ஒரு மதிப்புமிக்க செயற்பாட்டு மூலப்பொருளாக செயற்படுகின்றது.

ஆராய்ச்சி முடிவு

நொதிக்கப்பட்ட ஒடியல் மாவு கலக்கப்பட்ட யோக்கட்டானது சாதாரண யோக்கட்டை விட மிகவும் சிறந்த சமநிலைத் தன்மை கொண்ட pH, அங்கீகரிக்கப்பட்ட அமிலத் தன்மையின் அளவு, நுகர்வோர் விருப்பம், சிறந்த சுவை, மணம், தன்மை, ஒட்சியேற்றத்தை எதிர்க்கும் திறன், நார்ச்சத்து, நன்மை பயக்கும் பக்ரீரியாக்களின் வளர்ப்பு ஊடகம், நீர்த்தன்மை குறைவு மற்றும் மென்மைத் தன்மை அதிகரிப்பு என்பன புள்ளி விபரவியல் ஆய்வு மூலம் தனித்தன்மை கொண்டதாக உறுதிப்படுத்தப்பட்டது.



இலங்கை நெற்பயிர் வகைகளில் தேர்ந்தெடுக்கப்பட்ட ஆழவேர் 1 (DRO1) பண்புக்கூற்றின் வடிவவியல் மற்றும் மூலக்கூறு பரிசோதனை




அருட்ஷாயினி அருந்தவலிங்கம்

அறிமுகம்

நெற்பயிர் (*Oryza sativa L.*) உலக மக்கள் தொகையின் 60% சதவீதத்துக்கும் மேலானோரின் அடிப்படை உணவாகும். விளைச்சல் மேம்பாடு உணவு காப்பிற்கு மிகவும் அவசியமானது. வறட்சியானது மழையை நம்பி பயிரிடும் நெற்பயிர்ச்செய்கைக்கு (Rainfed rice cultivation) ஒரு முக்கியமான வரையறையாகும், இது தாவரத்தின் வளர்ச்சி மற்றும் இனப்பெருக்க நிலைகளில் பாதிப்பை ஏற்படுத்துகிறது. வறட்சி நிலைகளில், ஆழமான வேர் தொகுதி தாவரத்தின் நிலைத்தன்மையையும், நீர் மற்றும் ஊட்டச்சத்து அகத்துறிஞ்சும் திறனையும் மேம்படுத்தி, உயிர்ப்புச்சேர்மம்(biomass) மற்றும் விளைச்சலை(yield) அதிகரிக்க உதவுகிறது. நெற்பயிரின்9ஆம் குரோமோசோமில் அமைந்துள்ள Deeper Rooting 1 (DRO1) பரம்பரையலகு இந்த பண்பை கட்டுப்படுத்துகிறது என்று அறியப்பட்டுள்ளது.



தேர்ந்தெடுக்கப்பட்ட இலங்கைக்கே உரித்தான நெற்பயிர் வகைகளின்Bg300, Bg314, Bg352) ஆழமான வேர் உருவாக்கும் திறனை நீர்ஊடகவளர்ப்பிலும் (hydroponics) மற்றும் மண்ணிலும் (soil) மதிப்பீடு செய்யவும், DRO1 பரம்பரையலகு(gene) மூலக்கூறு அடிப்படையிலான திரையிடலை(screening) செய்யவும், இந்த ஆய்வுநோக்கமுடையது.




ஆய்வின் முடிவுகள்

மண்ணில், வேர் எண்ணிக்கை மற்றும் வேர் கோணம்
நெற்பயிரவகைகளுக்கிடையில்கிடையில் குறிப்பிடத்தகுந்த வேறுபாடுகளை ($p<0.05$) காட்டின. Bg300 வகையில் (56.01±9.27) ஆழமற்ற (0°–45°) வேர்த்தொகுதி காணப்பட்டது, Bg314 வகை (60.03±4.9) மொத்த வேர்களில் (54.04±4.91) ஆழமான வேர்களைக் கொண்டிருந்தது, ஆனால் Bg352 வகை (75.05±2.9) மொத்த வேர்களில் (73.05±2.8) ஆழமான வேர்களை வெளிப்படுத்தி மிகுந்த ஆழ வேர் தொகுதியை காட்டியது.
நீர்நிலையில், Bg352 குறிப்பிடத்தக்க முறையில் ($p<0.05$) Bg300 மற்றும் Bg314 வகைகளிலிருந்து வேறுபட்டது; இது அதிகபட்ச மொத்த வேர்களை (160.03±10.20) மற்றும் ஆழமான வேர்களை (153.05±10.3) கொண்டிருந்தது. அதேசமயம், Bg352 இன் வேர் நீளம் (41.05±1.52) Bg314 (35.2±0.14 cm) மற்றும் Bg300 (28.66±0.16 cm) வகைகளின் வேர்நீளத்தை விட அதிகமாக காணப்பட்டது. மண்ணில், Bg352 (20.03±0.24 cm) நீளமான வேர்களைக் காட்டியது, இதன் பின் Bg314 (14.93±0.23 cm) மற்றும் Bg300 (10.16±0.20 cm) காணப்பட்டன.



DRO1 சிறப்பான பிரதிநிதிகளைக் கொண்டு DNA பிரித்தெடுப்பு மற்றும் PCR பெருக்கல் மேற்கொள்ளப்பட்டது, இதன் மூலம் இலக்கு பகுதி உறுதி செய்யப்பட்டது. வரிசை நிர்ணயம் (sequencing) மூலம் Bg314 மற்றும் Bg352 இல் காணப்பட்ட ஆழ வேர் பண்புக்கு DRO1 ஜீன் காரணமா அல்லது புதிய ஜீன் (gene) காரணமா என தீர்மானிக்கப்படும்.



பல்வேறுபட்ட புதிய தலைமுறை பசளை உத்திகளின் மூலம் நைதரசன் பயன்பாட்டு வினைத்திறனை (NUE) சோளப்பயிர்ச்செய்கையில் மேம்படுத்துதல்



நிக்கோதேம்ஸ் சந்திரசேகரன்

அறிமுகம்

Zea mays L இலங்கையில் முக்கியத்துவம் வாய்ந்த இரண்டாவது தானிய பயிராகும். அதன் உற்பத்தித்திறன் பெரும்பாலும் வினைத்திறன் அற்ற நைதரசன் பயன்பாட்டால் கட்டுப்படுத்தப்படுகிறது. வழக்கமான யூரியாவை அதிகமாகப் பயன்படுத்துவதால் பசளைசகளின் கசிவு, ஆவியாதல் மற்றும் நைதரசனேற்றம் மூலம் குறிப்பிடத்தக்க நைதரசன் இழப்பு ஏற்படுகிறது. இதன் விளைவாக நைதரசன் பயன்பாட்டு வினைத்திறன் (NUE) குறைவு, சுற்றுச்சூழல் மாசடைதல் மற்றும் விவசாயிகளின் பொருளாதார நிலை பாதிப்படைகிறது.

நீங்கள் ஏன் புதிய தலைமுறை பசளைகளை பிரயோகிக்க வேண்டும்?

வழக்கமானபசளைகள்பெரும்பாலும் தாவரங்கள் அகத்துறிஞ்சுவதற்கு முன்பே கசிவு, ஆவியாதல் மற்றும் ஊடுவடிதல் மூலம் போசனை மூலகங்களின் பெரும்பகுதியை. இழக்கின்றன.நிலைப்படுத்தப்பட்டபசளைகள்(stabilized fertilizers)உதா-(சுப்பர் யூரியா 100%,70%) மெதுவாக போசனைமூலகங்களை வெளியேற்றும் பசளைகள் (slow releasing Fertilizer)உதா (விபல்சோல் 70%), கலவைப்பசளைகள்(blended fertilizers) உதா - (யாரமிலா கொம்பிலைக் + யாரா வீ) போன்ற புதிய தலைமுறை பசளைகள் படிப்படியாக ஊட்டச்சத்துக்களை வெளியிட அல்லது இழப்புகளைக் குறைக்க வடிவமைக்கப்பட்டுள்ளன . இதனால் தாவரங்கள் மிகவும் தேவைப்படும்போது ஊட்டச்சத்துக்களைப் பெறுகின்றன. பாரம்பரிய நைதரசன் பசளைகள்(யூரியா) நிலத்தடி நீரில் நைத்திரேற்று மாசுபாட்டை ஏற்படுத்தி நைத்திரேற்று ஒக்சைட் (N_2O) போன்ற பச்சைவீட்டுவாயுக்களின் வெளியேற்றத்தை அதிகரிக்கும்.

புதிய தலைமுறை பசளைகள் போசனைமூலகங்களின் மிகையான வெளியீட்டைக் கட்டுப்படுத்துவதன் மூலமும், அகத்துறிஞ்சுதலை மேம்படுத்துவதன் மூலமும் இந்த இழப்புகளைக் குறைக்கின்றன, இது மண், காற்று மற்றும் நீரின் தரத்தைப் பாதுகாக்க உதவுகிறது. ஊட்டச்சத்துக்கள் சீரான மற்றும் சரியான நேரத்தில் கிடைப்பதால், தாவரங்கள் மிகவும் சீராக வளர்ந்து அதிக விளைச்சலை அளிக்க முடியும். இது குறைவான போசனைப்பதார்த்தங்கள் காணப்படும் மண் மற்றும் சீரற்ற காலநிலை நிலைகளிலும் கூட சிறந்த உற்பத்தித்திறனுக்கு வழிவகுக்கிறது.



ஆய்வின் முடிவுகள்

புதிய தலைமுறை நைதரசன் பசளைகள் சோளத்தின் வளர்ச்சியில் குறிப்பிடத்தக்க தாக்கத்தை ஏற்படுத்தின. சுப்பர் யூரியா (100%) அதிகபட்ச உயரம் (279.5 ± 2.6 செ.மீ.) மற்றும் தண்டு விட்டம் (8.1 ± 0.7 செ.மீ.) ஆக காணப்பட்டது. இதன் காரணம், இதில் உள்ள DCD மற்றும் NBPT போன்ற நைதரசன் நிரோதிகள் பயன்பாட்டால் நைதரசன் இழப்பினைக்குறைத்து தாவரத்திற்கு எளிதில் அகத்துறிஞ்சும் வகையில் மாற்றியமைத்தே ஆகும். யூரியா பசளை பயன்படுத்திய தாவரங்களில் நைதரசன் இழப்பு அதிகம் இருந்ததால் வளர்ச்சி குறைந்தது. நைதரசன் இல்லாத கட்டுப்பாட்டு பரிசோதனை குறைந்த அளவிலான வளர்ச்சியை மட்டுமே காட்டியது. விளைச்சலில் தெளிவான வேறுபாடு காணப்பட்டது. Vibelsol (70%) அதிகபட்ச தானிய விளைச்சல் (100.1 ± 1.6 g/தாவரம்) மற்றும் விளைச்சல் சுட்டெண் (25.3 ± 0.7%) போன்றவற்றை அளித்தது. இது விபல்சோல் பசளையில் உள்ள DMPP நிரோதிகள் மற்றும் NBPT மூலமாக நைதரசன் படிப்படியாக வெளியிடப்பட்டதன் விளைவாகும். யாரமிலா பசளைகள் சீரான வளர்ச்சியும், சமநிலையான போசனையையும் வழங்கியது.

அறுவடை முடிந்தபின் மண் பகுப்பாய்வில் யாரமிலா பசளைகள் அதிக நைதரசன் அளவு கொண்டிருந்தது —10 செ.மீ. ஆழத்தில் 1.36 ± 0.04 mg/kg, 20 செ.மீ. ஆழத்தில் 0.69 ± 0.03 mg/kg. இதனால் நைதரசன் இழப்பு குறைந்தது மற்றும் மண் ஊட்டச்சத்து நிலைத்தது என நிரூபிக்கப்பட்டது.

ஆறு வாரங்களுக்குப் பிறகு சுப்பர் யூரியா (100%) பயன்படுத்திய தாவரங்களில் அதிகபட்ச நைதரசன் உள்ளடக்கம் (41.3 ± 6.98%) காணப்பட்டது. இது நைதரசன் அகத்துறிஞ்சும் திறனை உயர்த்தியதைக் காட்டுகிறது.

இந்த ஆய்வின் முடிவுகள் புதிய தலைமுறை நைதரசன் பசளைகள் தாவர வளர்ச்சி விளைச்சல் மற்றும் மண் நைதரசன் நிலைத்தன்மையை மேம்படுத்துகின்றன என்பதை உறுதிப்படுத்துகின்றன. DCD, NBPT, DMPP போன்ற நைதரசன் நிரோதிகள் நைதரசனை நிலைத்துப் பேணுவதால் தாவரங்கள் அதை முழுமையாகப் பயன்படுத்த முடிகிறது. இதனால் அதிக விளைச்சல் கிடைப்பதோடு சுற்றுச்சூழல் மாசுபாடு குறைகிறது.



விவசாய நிலப்பரப்புகளில் உள்ள வீடுகளின் உட்புற தூசியில் உள்ள நுண்ணுயிர்கொல்லி எதிர்ப்பு பக்டீரியாக்களின் (Antibiotic Resistant Bacteria) நிலை குறித்த முதற்கட்ட ஆய்வு.



சூ. தபோஷினி

அறிமுகம்:
அதிகரித்துவரும் நகரமயமாக்கல் காரணமாக பெரும்பாலான மக்கள் தங்கள் நேரத்தின் 90% ஐ ஏதாவது ஒரு உள்ளக சூழலில் செலவிடுகிறார்கள். இக்கூற்று உள்ளக சுற்றாடலின் தரத்தை புரிந்து கொள்வதன் முக்கியத்துவத்தை எடுத்துக்காட்-டுகிறது. வீட்டின் உட்புற சூழலானது ஒரு அடிப்படை உட்புற சூழலின் பிரதிபலிப்பாக கருதப்படுகிறது. இவ் உள்ளக சூழலானது, வெளிப்புற சுற்றாடலில் இருந்துவரும் தூசியினால் பாதிக்கப்படலாம். பொதுவாக தூசியானது பக்டீரியா மற்றும் சுவட்டு மூலகங்கள் (ஈயம், செப்பு, நாகம்) போன்ற உயிரியல் மற்றும் இரசாயன மாசுபடுத்திகளுக்கான ஒரு தேக்கமாக செயல்படுகிறது. சமீபத்தில் உள்ளக தூசி மாதிரிகளில் மேற்கொள்ளப்பட்ட ஆய்வுகளில் இவ்வாறான நுண்ணுயிர்கொல்லி எதிர்ப்பு பக்டீரியாக்கள் இருப்பது கண்டறியப்பட்டுள்ளது. இது ஒரு வளர்ந்து வரும் உலகளாவிய பொதுச்சுகாதாரம் சம்பந்தமான ஒரு பிரச்சினையாக கருதப்படுகிறது. நுண்ணுயிர்-கொல்லி எதிர்ப்பு என்பது பக்டீரியாக்கள் நுண்ணுயிர்கொல்லி (Antibiotics) மருந்துகளின் விளைவுகளை தாங்கும் பொறிமுறையை உருவாக்கும் ஒரு நிகழ்வாகும். இது சிகிச்சைகளை பயனற்றதாக ஆக்குவதுடன் நீண்டகால நோய்களுக்கும் வழிவகுக்கும். நுண்ணுயிர்-கொல்லி எதிர்ப்பு பக்டீரியாக்களின் நிலை பற்றி மருத்துவச்சூழல், மண், நீர் மேற்கொள்-ளப்பட்டாலும், வீடுகளின் உட்புறச்சூழலில் இவ்வாறான ஆய்வுகள் மிக மட்டுப்படுத்தப்பட்ட அளவிலேயே கிடைக்கப்பெற்றுள்ளன. விவசாயப்பகுதிகளில் உள்ள வீடுகளின் தூசிகளில்இ விவசாய நிலங்களுக்கு பயன்படுத்தப்படும் கிருமிநாசினிகள், உரங்கள் மற்றும் விலங்கு வேளாண்மையில் கால்நடைகள் மற்றும் கோழிகளுக்கு வழங்கப்படும் நுண்ணுயிர்கொல்லி என்பவற்றின் மூலம் நுண்ணுயிர்கொல்லி எதிர்ப்பு பக்டீரியாக்கள் பரவமுடியும். கால்நடை, பன்றி மற்றும் கோழி வளர்ப்பு பண்ணைகளில் இவ் நுண்ணுயிர் எதிர்ப்பிகளின் அபரிமிதமான பயன்பாடு காணப்படுகிறது. இது இவ் எதிர்ப்பு பக்டீரியாக்களின் விருத்திக்கு ஒரு தூண்டுகோலாக இருக்கிறது. இதனால் விவசாயநில-ப்பரப்புகளின் தூசிகள் இவ் எதிர்ப்பு பக்டீரியாக்களுக்கான ஒரு காவியாக செயல்படுகிறது. உட்புற சூழல்களின் தன்மையையும் இவ்வாறான ஆண்டிபயாடிக் எதிர்ப்பு பக்டீரியாக்களின் நிலை குறித்தும் உலகளாவிய ரீதியில் ஆர்வம் அதிகரித்து வரும் நிலையில், இலங்கையில் இருந்து, முக்கியமாக விவசாயப்ப-குதிகளில் உள்ள வீடுகளின் உள்ளகசூழல் குறித்த மிக மட்டுப்ப-டுத்தப்பட்ட தரவுகளே உள்ளன. மேலும் உள்ளக வளியின் தரம் (Indoor air quality) மற்றும் அதனுடன் தொடர்பான சுகாதார பிரச்சினை-கள் பற்றி இலங்கையில் பாரிய அளவில் ஆராயப்படாமல் உள்ளது.

இவ் ஆராய்ச்சியின் பிரதான நோக்கமானது அதிகளவு எருக்களை உரமாக பயன்படுத்தும் விவசாய நிலப்பரப்புக்களில் அமைந்துள்ள வீடுகளின் உட்புற தூசியில் உள்ள நுண்ணுயி-ர்கொல்லி எதிர்ப்பு பக்டீரியாக்களின் பரவலை ஆராய்வதாகும்.

செய்முறை:
இந்த ஆராய்ச்சிக்காக நுவரெலிய மாவட்டத்தின், Hawa-Eliya பிரதேசத்தில் 15 வீடுகள் விவசாய நிலப்பரப்புக்கு அருகிலும், 8 வீடுகள் விவசாயம் அல்லாத நிலப்பரப்பிலும் இருந்து தெரிவுசெய்ய-ப்பட்டன. இவ் வீடுகளில் இருந்து ஒரு வாரத்தில் சேகரிக்கப்பட்ட தூசிகளில், விவசாயத்திலும், மனித சுகாதாரத்திலும் பயன்படுத்தப்படும் 4 நுண்ணுயிர்-கொல்லிகளுக்கு, எதிர்ப்பு பக்டீரியாக்களின் தொகை பரிசோதனை செய்யப்பட்டது. பின் பக்டீரியா தொகையில் ஒவ்வொரு நுண்ணுயிர்கொல்லி-க்குமான எதிர்ப்பு பக்டீரியாக்களின் வீதம் (%) கண்டறியப்பட்டது.

முடிவுகள்:
விவசாய நிலங்களுக்கு அருகிலுள்ள வீடுகளில் உள்ள இவ் 4 நுண்ணுயிர்கொல்-லிகளுக்கும் எதிர்ப்பு பக்டீரியாக்களின் வீதம் (%) விவசாயம் அல்லாத நிலப்பகுதியில் உள்ள வீடுகளில் உள்ளதை விட அதிகமாக காணப்பட்டது. இது விவசாய நிலங்களுக்கு அருகாமையில் இருப்பது அச்சூழலில் உள்ள வீடுகளில் நுண்ணுயிர்கொல்லி எதிர்ப்பு பக்டீரியாக்களின் பரவலை ஏற்படுத்தக்கூடிய சாத்தியப்பாடுகளை காட்டுகிறது.

பரிந்துரைகள்:
